# පොලිස් බල්ලා

ධීමන් ආනන්ද



# 01

එය බිහිසුණු රාත්‍රියකි. අහස ගිගුරුම් දෙමින් ඇද හැලෙන ධාරානිපාත වැස්ස චණ්ඩ ස්වභාවයක් ඉසිලීය. පැය කීපයක් තිස්සේ පැවති ඝෝර සූරන වර්ෂාව නිසා මහා මාර්ගයේ කිසිවෙක් නොවූහ. මග දෙපස කාණු කුණු කසල දියෙන් තදවීම නිසා වැහිවතුර මහා මාවතේ ගංගාවමෙන් පිරී ඉතිරී වතුරෙන් යටවී තිබෙනු පෙනින.

චණ්ඩ කුණාටු වලින් ගහණවූ මේ බිය එලවන සුලු රාත්‍රියේ මගතොට බැසයන කිසිවෙක් නොවූවද ඉඳහිට ටැක්සි රියක් දෙකක් එහා මෙහා යනු පෙනින. වැසි අඳුරත් - සනඳුරත් තදින් බලපැවැත්වූ මේ රාත්‍රියේ වැසි කබායකින් දේහය වසාගත් අඩක් මුහුණ වැසෙනසේ හිස් වැසුමක් පැළඳ ගත් උස පුරුෂයෙක් වැසි වතුරෙන් යටවූ මරදාන පාර ඔස්සේ පියවර ඉක්මන් කරමින් ගමන් කරන්නට විය.

ඔහු වටපිට නොබලාම වතුරෙන් යටවූ පාර දිගේ ඉහුසුලුව ඉදිරියට ඇදුනේය. මේඝ සර්ජනා සැම අතින්ම ඇසෙන්නට වූ නමුදු එය නැසුනා මෙන් ඉදිරියට ගමන් කල උස මිනිහා මඳක් හිස ඔසවා මරදානේ දුම්රියපොලේ ඔර්ලෝසු කණුව දෙස බැල්මක් හෙලීය.

වේලාව රාත්‍රී එකොළහයි හතලිහයි. මරදානේ දුම්රිය පොලෙන් රඹුක්කන බලා යන අන්තිම කෝච්චිය පිටත්වීමට තව ඇත්තේ විනාඩි පහක් පමණි. ඔහු තම ගමන් වේගය වැඩිකොට වහා ගොස් දුම්රිය පොල තුලට වැදුනේය.

වැහිකබායත් හිස් වැස්මත් තෙමී බත්වී අවසානය. එහෙත් එය ගණනකට නොගත් මිනිහා කෙලින්ම ගියේ කඳුකර දුම්රිය මාර්ගයට ප්‍රවේශපත්‍ර නිකුත් කරන කවුන්ටරය වෙතය.

දාවල් කාලයට ජනයාගෙන් පිරී පවතින මේ දුම්රිය මංසන්ධිය රාත්‍රීකාලයට අමුසොහොනක් මෙන් පාලු ස්වභාවයක් උසුලයි. දුම්රිය පොලේ අගුපිල්වල වක ගැසී හිසේ සිට පා දක්වා පොරවාගෙන නිදාගන්නා මිනිසුන් උස මිනිහාට පෙණුනේ අමුසොහොනක දමා තිබෙන මළකඳක් මෙනි. වැස්සට අසුවීම නිසා තමන්ගේ තිප්පොලට යාගත නොහැකිවූ මරදානේ වීථිවල සංචාරය කරන එක් වෛශ්‍යාවක් පමණක් වැස්ස තුරල් වනතුරු ප්‍රවේශ පත් නිකුත් කරන කවුන්ටරය අසලට හේත්තුවී නිදිකිරමින් සිටිනු පෙනිණ.

උස මිනිසා නිකමට හෝ වට පිට නොබැලුවේය. හිස බිමට නැඹුරුකර ගත්වනම සිටි හෙතෙම වැහි වතුරෙන් තෙමී බත්වී ගිය වැහි කබාය යටින් වූ කලිසම් සාක්කුවට අත දමා රුපියල් දෙකේ නෝට්ටුවක් එලියට ගන්නවාත් සමගම ඔහුට නොදැනුවත්වම ශත පණහේ කාසියක් බිමට වැටිණ. කාසිය තෙත්වූ සිමෙන්ති පොළොවේ ගැටෙත්ම ඉන් බොල් හඬක් නැගිණ.

කාසිය බිම ගැටෙන ශබ්දය ඇසෙනවාත් සමග ඒ අසල නිදිකිරමින් සිටි වෛශ්‍යාව තිගැස්සුනාය. දෙනෙත් විකසිත





කොට උස මිනිසා දෙස බැලූ ඈ අඩියක් දෙකක් ඉදිරියට ගමන් කළාය. මේ තැනැත්තා තමාකරා පැමිණි හොඳ ගොදුරක්යයි සිතූ ගැහැණිය මොහු තමාගේ මායම් දැලේ පටලවා ගන්නට අදහස් කර ගත්තාය.

ගැහැණියක් තමා කරා ලඟා වෙනු දුටු මිනිසා හිස බිමට හරවා ගෙනම රුපියල් දෙකේ නෝට්ටුව කවුන්ටරය තුලින් ඇතුලට දැමීය. එහෙත් ඔහු සිය මුහුණ මදකට හෝ කවුන්ටරය ඇතුලත සිටින ප්‍රවේශපත් නිකුත් කරන නිලධාරියාට පෙනෙන්නට ඉඩ ප්‍රස්ථාවක් නොතැබිය.

''වේයන්ගොඩට ටිකට් එකක් දෙන්න'' ඔහු ගැඹුරු හඬකින් ඉල්ලීය ඒ කටහඬේ අමුතුම රිද්මයක් ගැබ්වී තිබිණ.

කවුන්ටරය තුලින් හඬක් නොනැගිණ. ප්‍රවේශපත් නිකුත් කරන නිලධාරියා පුටුවක ඇලවී පොතක් දිගහැර ගෙන තද නින්දක පසුවිය. එහෙත් උස මිනිසා ඒ දුටුවේ නැත තමාගේ ඉල්ලීමට කිසිවෙක් පිලිතුරු නොදෙනු බව තේරුම් ගත් උස මිනිසා යටැසින් කවුන්ටරය තුලට එබිකම්කර බැලීය. නිලධාරියා සැප නින්දක පසුවනු දුටුවෙන් ඔහු නැවතත් උස් හඬින් කතා කරන්නට විය.

''කෝච්චියට තව මිනිත්තු ගණනාවයි තියෙන්නේ මට වේයන්ගොඩට ටිකට් එකක් දෙනවා.''

ප්‍රවේශපත් නිකුත් කරන නිලධාරියා කට හඬින් තිගැස්සී වහා නැගිට ඉදිරියට එන්නට විය.

මේ අතර වෛශ්‍යා ස්ත්‍රිය උස මිනිසා ලඟට කිට්ටු කලාය. ඈ ඔහු දෙස බැල්මක් හෙලා පහත් හඬින් මෙසේ සඳහන් කළාය.

"මහත්තෙයා මේ වරුසාව වෙලාවේ ගෙදර යන්නේ මොකටද? අර ලඟපාත ජේන හෝටලයකට ගියාම හොඳට උණුහුමට නිදාගන්න පුලුවනි."

උස මිනිසාට ඇ කී දේ පැහැදිලිවම ඇසුණු නමුත් ඇය දෙස නිකමටවත් හිස ඔසවා බැලුවේ නැත. ඔහුගේ සම්පූර්ණ අවධානය යොමුවී තිබුනේ ප්‍රවේශ පත්‍රයක් මිලදී ගැනිමට මිස අන්කිසි බාහිර දෙයකට නොවේ.

කවුන්ටරය තුලින් කටහඬක් ඇසිණ. ඒ කතා කලේ ප්‍රවේශපත් නිකුත් කරන නිලධාරි තැනය.

"මේ කෝච්චිය ඇක්ස්ප්‍රස් රාගම නැවැත්තුවාට පස්සේ ආයෙමත් නවත්වන්නෙ පොල්ගහවෙල. වේයන්ගොඩ නවත්වන්නේ නැහැ."

"එහෙනම් පොල්ගහවෙලටම ටිකට් එක දෙනවා" උස මිනිසා ගොරෝසු හඬින් නැවතත් කීය.

මොවුන්ගේ කතාබහ ඒ ලඟම ඉන්නා ගැහැණියටද ඇසුණෙන් ඇ තවත් වරක් මේ තැනැත්තාගෙන් යමක් ලබාගැනීමේ අදහසින් කතා කරන්නට වූවාය. වැසි පවතින වෙනත් දිනවලට නම් ගජවාසි ලැබෙන්නත් අද හැන්දෑවේ සිට මේ වනතෙක් ඇයට හොඳ අනුග්‍රාහකයෙකු අල්ලා ගැනීමට ලැබුණේ නැත. අවසාන මොහොතේ වුවද උත්සාහකර බැලීම තම වෘත්තියේ සිරිත බැවින් ඇ තවත් ටිකක් උස මිනිසා ලඟට සමීප වූවාය.

"මහත්තයො මය කෝච්චියේ ගිහින් අතර මග





ලගින්නයි වෙන්නෙ ඇක්ස්ප්‍රස් කෝච්චිය නිසා වේයන්ගොඩ නවත්වන්නේ නැහැ. ඒ නිසා රාත්‍රිය හෝටලේක ගතකරලා හෙට පාන්දර පහයි කාලේ කෝච්චියෙන් යන්න පුලුවනි. මා එක්ක එන්න යන්න මහත්තයට හොඳ හෝටලේක ස්ප්‍රිං ඇඳවල් තියෙන කාමරයක් වෙන්කර දෙන්නම්."

උස මිනිසා ගැහැණිය දෙස රවා බැලුවේය. ගැහැණිය ඔහුගේ මුහුණ ප්‍රථමවරට දුටුවේ එවිටය.

එකෙණෙහිම ප්‍රවේශපත් නිකුත් කරන නිලධාරියා ටිකට්පත දිනය සඳහන් කරන උපකරණයට දමමින්ම රුපියල් දෙකේ නෝට්ටුව උස මිනිසාගේ අතින් ඇද ගත්තේ ය. නිදිමරගාතේම ඔහු නෝට්ටුව මුදල් ලාච්චුවට දැමුවද එහි ඉතිරි මුදල දීමට සිල්ලර කාසි සොයන විට තම අතේ යමක් තැවරී තිබෙනු දුටුවෙන් තිගැස්සුනේය. ඔහුගේ අත්ලේ ලේ තැවරී තිබිණ.

ඔහු කීපවරක්ම අත ඒ මේ අත හරවා බැලූ නමුදු තම අතේ ලේ තැවරෙන්නට තරම් තුවාලයක් නොදැක මවිතයට පත් විය. එහෙත් ලාච්චුවේ තිබූ රුපියල් දෙකේ නෝට්ටුවේ ලේ පැල්ලමක් තිබෙනු දුටුවෙන් ඔහුට තම අතේ ලේ ගැවුණු අන්දම වැටහී ගියේය.

ඉන්පසු ඔහු කතා කලේය.

"මිස්ටර් මේ රුපියල් දෙකේ නෝට්ටුව ලේ වලින් තෙත් වෙලා."

"මොනවා ?" උස මිනිසාගේ මුවින් නිතැතින්ම

නික්මෙන්නට ගිය නමුදු ඔහු බලවත් උත්සාහයකින් එය නවතා ගත්තේය. ප්‍රවේශපත් නිකුත් කරන නිලධාරියාගේ වදන් ඇසෙත්ම ඔහු එක් වරම තිගැස්සුනේය. ඇඟ කිලිපොලා ගියේය. එහෙත් හෙතෙම සංසුන් ලීලාවෙන් ඊට පිළිතුරු සැපයීය.

"මේ පාරේ කොහොම එන්නද ? දණක් ගාවට වතුර කාණු හිරවෙලා පාරවල් වල වතුර පිරිලා මගේ පය ලිස්සලා ගිහින් වතුරේ වැටුනා එතකොට වීදුරු කැබැල්ලකට අත කැපුනා.

"හුඟක් ලේ යනවාද ? ලේ යනවා නම් මේ ඇතුලට එනවා ප්‍රථමාධර බෙහෙත් ඇතුලේ තියෙනවා."

"බොහෝම ස්තුතියි. ඉක්මනට මගේ ටිකට් එක දෙන්න. ගෙදර ගිහිල්ලම බෙහෙත් ටිකක් දාගන්නවා."

නිලධාරියා ටිකට්පත කවුන්ටරයේ ලෑල්ල මතට දමනවාත් සමග කපුටෙකු කේජු කැල්ලක් ඩැහැගන්නාක් මෙන් එය අතට ගත් මිනිසා වහාම ප්ලැට්පෝමය දෙසට දුවන්නට පටන් ගත්තේය. රුපියල් දෙකේ ඉතුරු මුදල ගන්නා හැටියට නිලධාරියා කෑ ගැසූ නමුදු මගියා එය නෑසුනාක් මෙන් ඉදිරියට දිවයනු පෙනින.

ඔහු තුන්වෙනි වේදිකාවට බැසීම සඳහා තිබූ තරප්පු පේලිය දිගේ පහලට දුවත්ම නලාහඬ නැගූ දුම්රිය සෙමෙන් සෙමෙන් ඉදිරියට ඇදෙන්නට විය. උස මිනිහා තමා පසු පස මාරයා ලුහුබඳින්නාක් මෙන් එක පිම්මටම තරප්පු පේලියේ පඩි කිහිපයක් උඩින් පැන ඇදෙන දුම්රියට නැගීම සඳහා වේගයෙන් ඉදිරියට දුවන්නට පටන් ගත්තේය.





දුම්රිය වේදිකාවෙන් ඉවත් වන්නට මොහොතක් තිබියදී උස මිනිසා දුම්රිය පාපුවරුවට ගොඩවී යකඩයක් වැරෙන් අල්ලා ගනු පෙනින. ඉන් පසු මහත් අමාරුවෙන් දොරක් විවෘත කරගෙන මැදිරියක් තුලට රිංගා ගත්තේය.

මැදිරිය ඝනාන්ධකාරයේ ගිලී පැවතුන බැවින් ඔහු සැනසුම් සුසුමක් හෙලීය. තමා හැරෙන්නට අන් කිසිවෙක් මේ මැදිරිය තුල නොසිටින බව ඔහුට පැහැදිලිවී ඉවරය. දුම්රියේ ගමන් ගන්නා සොරුන් මෙහි විදුලි බුබුලු සොරකම් කර ගෙන යාම නිසා මේ මැදිරිය අන්ධකාරයේ ගිලී පැවතිණ.

ආසනයේ හිඳගන්නට පෙර ඔහු ලේ තැවරුන දෑත් දුම්රිය කවුලුවෙන් පිටතට දමා වැටෙන වැසි වතුරට ඇල්ලුවේය. වැස්ස තාමත් පවතී. වැසි වතුරෙන් ඔහු අතේ තැවරී තිබුණු රක්තවර්ණ රුධිරය සෝදා හැරියේය.

ආසනයේ වාඩිගත් නමුදු ඔහුගේ සිත මහත් වේගයකින් ක්‍රියාකාරීවන බව පෙනෙයි. තමාගේ නොසැලිකිලිමත් කම ගැන ඔහු සිත යටින් තමාටම දොස් පවරා ගත්තේය. ප්‍රවේශපත්‍රය මිලදී ගැනීමේදී තවත් ටිකක් ප්‍රවේශම් වූවානම් කොතරම් හොඳදැයි ඔහු කල්පනා කරන්නට වූයේය.

එහෙත් දැන් ඉතින් කරන්නට දෙයක් නොමැත. ගියදේ ඇතුන් ලවා හෝ ආපසු ඇද්දවිය නොහැකිය. දැන් කල යුත්තේ ඉදිරියට සිදුවන කොටස නිසියාකාර ඉටු කිරීම පමණි.

අර ගැහැණිය ? ඈ තමාගේ මුහුණ හැඳුණුවාදැයි යන්න සැකයකි. එහෙත් තමා වැස්සට තෙමී බත්වී සිටිය බැවින් ඇයට

හඳුනාගත නොහැකිය. තමාගේ මුහුණ හරි හැටි නොපෙනීමට තොප්පියෙන් ආවරණය කරගෙන සිටි බව ඔහුට මතකය.

දුම්රිය කැලණිය පාලම පසුකොට වේගයෙන් ගමන් කරයි. රාත්‍රී කාලයේ පාලු බව දුම්රියේ සීඝ්‍රගාමී වේගයට කිසිදු බාධාවක් නොවීය. උස මිනිසා සාක්කුවට අත දමා සිගරැට්ටුවක් ගෙන දල්වා ගත්තේය.

සිගරැට්ටුව පත්තුකිරීමට ගිණිකූර දල්වත්ම එයින් නික්මුණු ආලෝකයෙන් උස මිනිසාගේ උකුසු දෙනෙතට යමෙක් දිස්විණ. ඔහු තමාට නුදුරින්වූ ආසනයක ඇලවී ගොරවමින් නිදා සිටියේය. ඔහුගේ පසෙකින් තරමක හම් බෑගයක් තිබෙනු ගිණිකූරේ දුර්වල ඇලෝකයෙන් දිස්විය.

උස මිනිසා හිස්වැස්ම තවත් හොඳින් මුහුණ වැසෙන සේ සකස්කර ගත්තේය. එහෙත් ඔහුගේ මුහුණ දකින්නට නිදා සිටි මිනිසා යම්තම් හෝ ඇසිපිය නැගුවේ නැත.

කැලණිය හා හුණුපිටිය දුම්රිය ස්ථාන පසුකල දුම්රිය රාගම දුම්රිය පොලට ලඟාවී නැවතිණ. දුම්රිය ස්ථානයේ විදුලි පහන් ආලෝකය දුම්රිය මැදිරිය තුලට වැටෙත්ම නිදාසිටි මිනිසා තිගැස්සී නින්දෙන් පිබිදුනේය. වරක් දෙවරක් ඒ මේ අත බැලූ හෙතෙම මැදිරියේ සිටි එකම මගියා දැක යුහුව කතා කලේය.

"මේ රාගම ස්ටේෂම නේද ?" ඔහු කඩිනමින් විමසුවේය.

"ඔව්" උස මිනිසාගේ ක්ෂණික පිළිතුර විය.

"එහෙනම් මං බැහැගන්න ඕනෑ මෙතනින් තමා"යි





පැවසූ හෙතෙම කඩිමුඩියේම කුඩා හම්බෑගයත් අතැතිව උස මිනිසා දෙස බැල්මක් හෙලා දුම්රියෙන් බැස ගත්තේය. එකෙණෙහිම දුම්රිය නැවතත් ගමනාරම්භ කලේය.

දුම්රිය ගනේමුල්ලේ කඳුගැටය සහිත වංගුව පසු කරයත්ම කවුදෝ අනතුරු ඇඟවීමේ දම්වැල ඇදිනු ලැබුයෙන් දුම්රියේ බ්‍රේක් තදවිණ. දුම්රිය නවතිනවාත් සමග අඳුරු මැදිරියේ සිටි උස මිනිසා වහාම දොරක් විවෘත කරගෙන ඉන් බැස අන්ධකාරය ඔස්සේ ඉදිරියට දුවන්නට වූයේය. යාමට නියමිත අරමුණක් නොමැති වුවද ඔහු අඳුර ප්‍රිය කරන්නෙකු මෙන් වනරොද පෙදෙසට පියවර ඉක්මන් කලේය.

රතු ලන්තෑරුමක් අතින් ගත් ගාඩ් තැන මැදිරි වලට එලිය කරමින් ගමන් කරනු පෙනින මැදිරි බොහොමයක් හිස්ය මේ අවේලාවේ ගමන් බිමන් යන්නේ කවුද ? ධාර්මිකව දිවිපෙවෙත ගෙන යන සැම සත්වයෙක්ම මේ වෙලාවට තද නින්දේ පසුවෙයි. ගමන් බිමන් යන උදවිය දෙවියන්ට බිය වූ එතරම් නීති ගරුක මිනිසුන් නොවේ. ඒ පුද්ගලයින් දෙනෙත් හැරගෙන සිටින්නේ පාපී චේතනා වලින් තම සිත් සතන් දූෂ්‍ය කරගෙන විය යුතුය.

දුම්රිය හිටිහැටියේම නතර කිරීමට හේතුවූ වැකුම් යතුර කරකවා තිබූ මැදිරිය දකිත්ම, ගාඩ්තැන සීතලේ වෙව්ලමින් ඒ දෙස බැල්මක් හෙලුවේය.

මැදිරියේ දොර විවෘත කරදමා තිබූ නමුත් එහි තුල කිසිවෙක් නොවීය ඔහු ලන්තෑරුම ආසන දෙසට අල්ලා බැලූ නමුදු කිසිවෙක් දක්නට නොවූයෙන් ආපසු හැරුණේය. ඔහුගේ විශ්මයට මෙන් මැදිරියේ බිම හෙත් වූ පාවහන් අඩි සටහන් කිහිපයක් තිබෙනු දුටුවෙන් ඔහු විමසිලිමත් වන්නට විය.

අනතුරු හැඟවීමේ දම්වැල් අදිනු ලැබූ තැනැත්තා මෙ මැදිරිය තුළ සිටියා විය හැක. කිසියම් හේතුවක් නිසා ඔහු අතරමග දුම්රිය නවතා මැදිරියෙන් පිටවී ගොස් ඇත්තේය.

වැකුම් යතුර යථා තත්ත්වයට කරකැවූ ගාඩ්තැන වහාම අහසු මෙන් කොට ගාඩ්තැනගේ කාමරයට ඇතුල්වී කොළ පැහැති ලාම්පුව ඒ මේ අතට වනා නලාව පිම්බේය. දුම්රිය මහ හඬින් නගමින් නැවතත් ගමනාරම්භ කරනු පෙණින.





# 02

උදාසන හිරු පායා එනතුරුත් තම හාම්පුතුන්ගේ නිදන කාමරයේ දොර වසා තිබෙනු දුටු ඇලිස් නැමති මෙහෙකාරිය පුදුමයට පත්වූවාය. වෙනදා නම් හය වන්නටත් පෙර නින්දෙන් පිබිදෙන තම හාම්පුතා රැකියාව සඳහා යන්නට සූදානම් වෙයි. නින්දෙන් පිබිදුන වහාම ඔහුට කිරිකෝපි වීදුරුවක් පිළියෙල කර තැබීම ඇලිස්ගේ පුරුද්දවූ නමුදු අද කිරි කෝපි වීදුරුව තවමත් මේසය උඩම තිබෙන බැව් ඇයට පෙනෙයි. තම ස්වාමි දුව නින්දෙන් පිබිදෙන්නේ හාම්පුතා රැකියාවට ගොස් පැයක් පමණ ගතවූවාට පසුව වුවද අද නම් දෙදෙනාගේම හැලහොල්මනක් නැතිවීම ඇගේ පුදුමයට කරුණකි.

අද රජයේ නිවාඩු දවසක් නොවේ. එබැවින් හාම්පුතා ගෙදර නැවතීමට හේතුවක් නැතිබව ඈ දන්නීය. ඈ මේ බංගලාවේ අවුරුදු හයක පටන් සේවය කරන බැවින් ගෘහයේ සෑම කටයුත්තක් ගැන මෙන්ම තම හාම්පුතුන්ගේ පෞද්ගලික දේවල් සම්බන්ධයෙන්ද කරුණු මැනවින් දන්නීය.

සමහරවිට ඊයේ රාත්‍රියේ ඇදහැලුණු ධාරානිපාත වැස්ස නිසා ඔවුන් සීතලෙන් මිරිකී තුරුලුවී නිදාගන්නවා ඇතැයි යන්නද ඇයට සැකයකි. කෙසේ වෙතත් ඔවුන් අවදි කිරීම තම යුතුකම බැව් සැලකූ ඇලිස් කාමරයේ දොරට තට්ටු කරන්නට වූවාය.

''ටක් - ටක් - ටක්''

නිහැඬියාව රජ කරන්නට වූවා මිස තට්ටු කිරීමෙන් දොර විවෘත වූයේ නැත.

ඇත්තෙන්ම ශීතල රැයකට මිනිසුන්ට සුවසේ නිදින් නින්දයාම ගැන ඇලිස් මවිතවන්නට වූවාය. එහෙත් තම හාම්පුතා කුසීත කමින් හෝ උදාසීනත්වයෙන් පෙලෙන්නෙක් නොවන බව ඇලිස් හොඳාකාරවම දන්නීය.

ඇ නැවතත් දොරට තට්ටු කරන්නට වූවාය. ''නෝනා මහත්තයා දැන් හොඳටම එලිවෙලා.''

එහෙත් ඊටද පිලිතුරු නොමැති වූයෙන් ඇලිස්ගේ හිතට සැකයත් භීතියත් ඇතුලු වන්න විණ. ඇගේ හිතට කිසියම් අනතුරක ඡායාවක් වැටුණු හෙයින් ඇ වහා නැඹුරුව දොරේ යතුරු කපොල්ල තුලින් කාමරයට එබිකම් කර බැලුවාය.

දෙවියනේ කාමරයේ සයනය මත තිබුණු දර්ශණය දකින්ම ඇගේ මුලු ගතම අප්‍රාණිකව් ගොස් ක්ලාන්තව් යන්නාක් මෙන් දැණින. ඇත්තෙන්ම එය විශ්වාස කිරීමට හෝ ඇසින් බලන්නට තරම් නොහැකි බියකරු දර්ශණයකි.

සයනය එකම ලේ ගංගාවකි. ලේ ගංගාව මැද උඩුබැලි අතට මැරී සිටියේ ඇගේ ස්වාමියාය. ඔව් ඇගේ හාම්පුතා වන ගිල්මන් සමරසේකර මහතාය. ඔහුගේ බිරිඳද ඔහු ලගින්ම උඩුබැලි අතට පෙරලී හොසෙල්ව් වැතිර තිබෙනු පෙනින.

ක්‍ෂණයකින් සිතට ඇතිවූ කම්පනයත් පීඩනයත් නිසා





ඇලිස්ට මුව අයා කතාකර ගැනීමට පවා නොහැකිවිණ. ඇගේ උගුර කට වියැලී ගොස් තිබුණු බැවින් ඇ මහත් ආයාසයෙන් යතුරු කපොල්ලෙන් ඇස ඉවතට ගෙන පිස්සියකමෙන් ගාහයේ ඉදිරිපසට දුවන්නට වූවාය.

''දෙවියනේ මේ මොන අපරාධයක්ද අයියෝ අපේ රත්තරන් මහත්තයාටයි - නෝනාටයි මේ උනේ මොකක්ද ?'' ඇ එලියට දුවගෙනවිත් මරලතෝනි දෙන්නට පටන් ගත්තාය.

මෙහෙකාරියගේ විලාප හඬින් ගිනියටපත් අවට නිවෙස් වල සිටියවුන් වහාම ගිල්මන් සමරසේකරගේ බංගලාව කරා දුවගෙන එන්නට වූහ. හිස් අත් බදාගෙන මහ හඬින් වැලපෙමින් සිටි මෙහෙකාරිය වටා රොක්වූ ඔවුන් ඇගේ විලාපයට හේතුව විමසන්නට වූහ.

ඇ කිසිවක් කතා නොකොට ඔවුන් සමගම ගෙතුලට ගොස් තම හාම්පුතාගේත් - ඔහුගේ බිරිඳගේත් නිදන කාමරය පෙන්වා දැතින්ම මුහුණ වසාගෙන විලාප හඬ නගන්නට පටන් ගත්තාය.

සමරසේකර බංගලාවට යාබද බංගලාවේ නිවැසි තලතුනා වියෙහි සිටි තෝමස් වීරමන්ත්‍රී මහතා මෙහෙකාරිය පෙන්වූ කාමරයේ යතුරු සිදුර තුලින් ඇසක් යොමා කාමරය තුලට එබිකම්කර බැලුවේය.

ඔහු ආපසු හැරුනේ මුහුණ ඇඹුල් කර ගෙනය. මෙතෙක් වේලා ඔහුගේ මුහුනේ තිබූ විමසිලිමත් බැල්ම පහව ගොස් ඒ වෙනුවට භීතියේ ලකුණු පෙනෙන්නට විය. ඔහුගේ ඉරියව්වෙන්ම කාමරය තුල මුවින් පැවසිය නොහැකි තරමේ භයානක දෙයක් සිදුවී ඇති බව හැම කෙනෙක්ම තේරුම් ගත්හ.

තෝමස් වීරමන්ත්‍රී කඩිමුඩියේම ටෙලිෆෝනය කරා දුවගොස් රිසීවරය එසවිය ඔහුගේ දෑත් වෙව්ලන්නට විය. "හලෝ. හලෝ. මට පොලීසියට කතා කරන්න ඕනෑ. ඔව් කුරුඳුවත්ත පොලීසියට" ඔහු ඩයලය කරකවා රිසීවරය කන තබා ගනිමින් පැවසීය.

රිසීවරයෙන් අනෙක් කෙලවරින් කටහඬක් ඇසිණ. "මේ විසළු සාජන්ට් මොනවද දැනගන්නට ඕනෑ කරන්නේ. ?"

"මේ කතා කරන්නේ කුරුඳුවත්තේ රොඩ්නි මාවතේ ඉඳලයි. රොඩ්නි මාවතේ නො. 99 යේ ගෙදර මහ භයානක අපරාධයක් වෙලා තියෙනවා."

"අපරාධයක්?" පොලිස් නිලධාරියාගේ විශ්මය පල කරන කට හඬ ඇසිණ.

"ඔව් සාජන් මහ භයානක මිනීමැරුමක් මිස්ටර් ගිල්මන් සමරසේකරත් ඔහුගේ බිරිඳත් මරාදාලා. කාමරේ දොර වහපුගමන්ම තිබෙනවා අපි ඒ බව දැක්කේ දොර සිදුරෙන්. වහාම ඇවිත් පරීක්‍ෂණයක් පවත්වනවා නම් හොඳයි." වීරමන්ත්‍රී මහතා තැති ගැණුන හඬින් ඉල්ලා සිටියේය.

"හොඳයි අපි පුලුවන් තරම් ඉක්මණින් එන්නම් මේ ආරංචිය දැනුම් දෙන ඔය මහත්මයාගේ නම ?"

"ආ - මම තෝමස් වීරමන්ත්‍රී ඉන්නේ රොඩ්නි මාවතේම නො. 100 යේ බංගලාවේ. "

"ඕ - කේ සර් අපි ඉක්මනටම එන්නම්." කී සාජන්ට් තැන රිසීවරය පහත හෙලන හඬ වීරමන්ත්‍රී මහතාට ඇසිණ.





විනාඩි දහයක් ගතවන්නට මත්තෙන් පොලිස් රථ දෙකක්ම කුරුඳුවත්තේ රොඩ්නි මාවත ඔස්සේ වේගයෙන් ඉදිරියට ඇදෙන්නට වූහ. ගිල්මන් සමරසේකරගේ බංගලාව තුලට රථ පැදවූ නිලධාරින් වහාම ඉන් බැස ගෙතුලට පැමිණියාහ.

තෝමස් වීරමන්ත්‍රී පොලිස් නිලධාරින් කැටුව ගොස් කාමරය පෙන්වා සිටියේය.

"ඉන්ස්පැක්ටර් මෙන්න මේ කාමරේ ඇතුලේ තමයි ඔය භයානක සිද්ධිය වෙලා තියෙන්නේ. අර අර බලන්න. " ඔහු දොර සිදුර තුලින් එබිකම්කර බලමින් සඳහන් කලේය.

ඉන්ස්පෙක්ටර් තැන ඇතුලු පොලිස් නිලධාරින් කිහිපදෙනෙක්ම නැඹුරුව ඒ දර්ශණය මොහොතක් වේලා නැරඹූහ. ඉන්පසුව ඇතුලතින් වසා තිබුණු දොර හරින්නට කිහිපවිටක්ම උත්සාහ කල නමුදු නොහැකිව පා පහරවල් කීපයක් දීමෙන් එය කඩා දමා කාමරය තුලට ඇතුලුවූහ.

එය මිනිස් ඇසකින් බලන්නට තරම් හිරිකිත ඇඟ ලොමු ඩැහැ ගැන්වෙන අමානුෂික දර්ශනයකි.

ගිල්මන් සමරසේකරගේ හෘදය වස්තුවට අනිණ ලද කිණිස්ස පපුවේ ඇණුනු ගමන්ම තිබුණි. එහෙත් බලන්නට බිය ගෙනදුන්නේ ඒ දර්ශණය නොවේ. ඔහුගේ යටි බඩ තියුණු මුවහතක් ඇති තලයකින් කපා බොකු බඩවැල් ඇඳ මත ඒ මේ අත ඇද දමා තිබුණි. එය හිතක් පපුවක් ඇති කිසි කෙනෙකුට බැලිය හැකි දර්ශණයක් නම් නොවේ.

ඉතාම දරුණු අධම මිනීමරුවකුට වුවද මේ තරම් සැහැසි ප්‍රචණ්ඩ මරණයක් සිදුකල නොහැකිය.

ගිල්මන් සමරසේකරගේ බිරිඳ සුවසේ සැතපෙන්නාක් මෙන් මැරී සිටියාය. ඇයටත් තුවාලයක් සිදුකර ඇතැයි සැකකල ඉන්ස්පැක්ටර් තැන පා සටහන් නොතිබෙන්නට යම්තම් ලගාවී ඇය දෙස එබී බලත්ම ඇගේ පපුව පෙදෙස සෙමෙන් උස් පහත් වනවා දුටුවෙන් එක්වරම කෑගසන්නට පටන් ගත්තේය.

''වහාම ඩොක්ටර් කෙනෙකුට ටෙලිපෝන් කරන්න මිසිස් සමරසේකරට තවමත් පණ තියෙනවා.''

මෙයින් මවිතයට පත් සියලු දෙනාම කාමරය තුලට එබිකම් කරමින් බලන්නට පටන් ගත්හ. ඉන්ස්පෙක්ටර් කීවේ මුසාවක් නොවන බව කාටත් පෙනී ගියේය. තම සැමියාගේ මළකඳ ලගම වැතිර සිටි තරුණ කාන්තාව සෙමින් ආශ්වාස ප්‍රශ්වාස කරනවා දුටු බැවිනි.

ඇගේ දෙනෙත් පියවී තිබුණි. එහෙත් ඈ මළමිණියකට වඩා වෙනසක් වූයේ හෘදයේ සිහින් ස්පන්දනය පමණි.

මිනිත්තු කීපයක් ගතවන්නට මත්තෙන් අධිකරණ වෛද්‍ය නිලධාරියා පැමිණ තවත් කීපදෙනෙකුගේද ආධාරය ඇතිව මිසිස් සමරසේකර පසෙකට ඔසවා ගනු ලැබීය. ඇගේ මුහුණ දෙස බලා මදක් සෝදිසි කල හැටියේම ඔහු මහත් බියකින් කතා කරන්නට විය.

''ඈට ක්ලෝරෆෝම් අල්ලලා තියෙනවා. ඒ සිහි නැතිවෙන ඖෂධය ඈට වැඩි වෙලා තිබෙන හැඩයි. තවත්





ටිකක් පමාවුනා නම් ඇගේ ජීවිතේ බේරා ගන්නට ලැබෙන්නේ නැහැ'' යි පැවසූ හෙතෙම වහාම ඖෂධ කීපයක් සංයෝග කොට ඉන්ජෙක්ෂන් මාර්ගයෙන් ඇගේ ශරීර ගත කලේය.

ඒ ඉන්ජෙක්ෂන් ගසා පැය භාගයක් පමණ ගත වනවාත් සමග ඈ තද නින්දකින් පසු පිබිදියාක් මෙන් දෙනෙත් හැර වටපිට බලන්නට වූවාය. ඉන්ස්පෙක්ටර් තැන ඇයට එතන ඉන්නට ඉඩ හැර ගිල්මන් සමරසේකරගේ මළකඳ තිබෙන කාමරයට නැවතත් ඇතුලු වූයේය.

ඇඟිලි සලකුණු විශේෂඥයින් හා සී. අයි. ඩී. කාරයින් දෙදෙනෙක් හා සී. අයි. ඩී. කාන්තාවක් ද කාමරය සිසාරා ඇවිදිමින් මේ මිනීමැරුමට තුඩු දෙන කිසියම් හෝඩුවාවක් ඇද්දැයි විපරම් කර බලන්නට වූහ.

එහෙත් මේ බිහිසුණු අපරාධය කල පුද්ගලයා කවරෙකු හෝ වේවා ඔහු ලෙහෙසියෙන් නීතියට යටත් වන මිනිසෙකු නොවන බව නොබෝ වේලාවකින්ම රහස් පරීක්ෂක නිලධාරීන්ට අවබෝධ විය.

කාමරය තුල හෝ මරා දමා තිබුණ මිනිසාගේ ඇඟපතේ හෝ ඇඟලි සලකුණු නොවීය. මිනීමරුවා අත්මේස් පැලඳගෙන පා සටහන් බිම නොහිටින්නට අවුත් මේ අපරාධය සිදුකර තිබේ.

රහස් පරීක්ෂකයින් දෙදෙනා කාමරයේ තිබූ අල්මාරිය විවෘත කරගෙන පරීක්ෂාකර බලන්නට වූ අතර ප්‍රභා නමැති සී. අයි. ඩී. තරුණිය වහාම කාමරයෙන් පිටවී අමරසේකර මහත්මිය සිටි අනෙත් කාමර ාක් කරා පිය නගන්නට වූවාය.

අමරසේකර මහත්මිය සැප පුටුවක ඇලවී සිටියාය. ඈ තෝන්තු ගතියකින් මෙන් හිස බිමට නැඹුරු කර ගෙනම සිටියාය. තම නිවස තුල සෙනග වැඩිපුර ගැවසෙන බව පෙනුනද ඒ කුමක් සඳහාදැයි ප්‍රශ්ණ කිරීමට තරම් ශක්තියක් හෝ ධෛර්යයක් ඇයට දැන් නොතිබිණ. ක්ලෝරෆෝම් ඖෂධය උවමනා ප්‍රමාණයට වඩා ආග්‍රහණය කර තිබුනෙන් ඒ වායුව තවමත් ඇගේ ශරීරයෙන් ඉවත් වූයේ නැත. අමරසේකර මැතිණියගේ දෙනෙත් සිහි නැතිවන බෙහෙත් වැඩිවීම නිසා රත්පැහැ ගැන්වී තිබුණි.

ප්‍රභා සී. අයි. ඩී. තරුණිය සෙමින්  පියවර තබමින් අමරසේකර මැතිණිය ලගට සමීප වූවාය. මිනීමැරුමක් සිදුවූ තැනකට පැමිණි විට ඊට සම්බන්ධ පුද්ගලයනට මුහුණ දෙන අන්දම ඈ හොඳින්  දන්නීය.

ලංකාවේ පොලිස් අභ්‍යාස විද්‍යාලයේ ලැබූ පුහුණුව හැරෙන්නට ප්‍රභා ලෝක පූජිත ස්කොට්ලන්ඩ්යාඩ් රහස් පරීක්‍ෂණ ආයතනයට ගොස් එහිදී අපරාධකාරයන් නීතිය ඉදිරියට පමුණුවාලීමේ නවීන ක්‍රම හැදෑරීමේ භාග්‍යටද ලක්වූ තරුණියකි. ස්කොට්ලන්ඩ්යාඩ් රහස් පරීක්‍ෂණ ආයතනයේ ප්‍රධාන රහස් පරීක්‍ෂක සර් සිරිල් ෆ්‍රෙට්මන් යටතේ  නවීන ක්‍රමාණුකූලව අපරාධ විනිශ්චය ගැන කරුණු ඉගෙන ගත් ප්‍රභා ලංකාවට පැමිණියාට පසු ඉතා පහසුවෙන්ම තීක්‍ෂණ අන්දමින් මොලය යොදවා කල අපරාධ රාශියක්ම අණාවරණය කොට එහි වගකිව යුත්තන්ට දඬුවම් ලබා දුන්නේය.

ඈ නව යොවුන් රූමතියක්  වුවද උපායෙහි දක්‍ෂය. එඩිතරය. ප්‍රභා ජයකොඩි ලෙහෙසියෙන් අත් නොහල  හැකි නොමග යැවීමට නොහැකි සී. අයි. ඩී. කෙල්ලක් බව ලංකාවේ සැම තරාතිරමකම අපරාධකාරයෙක්ම දනියි.





ප්‍රභා සමරසේකර මැතිණියගේ හිස සිට දෙපතුල් දක්වා බැල්මක් හෙලා ඇගේ තත්ත්වය මැනවින් වටහා ගත්තාය. ප්‍රභා සෙමින්  සමරසේකර මැතිණියගේ උරහිසට අතක් ගැසුවිට ඈ මහත් අමාරුවෙන් හිස ඔසොවා බැලුවාය.

ප්‍රභා නිහැඬියාව බින්දාය.

''මිසිස් සමරසේකර මලුව පහත් කරගෙන ඉන්න කොට තෝන්තු ගතිය වැඩි වෙනවා. මේ බලන්න ඔබේ නහර සියල්ලම අප්‍රාණික වී ගිහින්. ඒ නිසා ඇඟපත රත්වෙන්න මා එක්ක ටිකක් කතා කරන්න.''

සමරසේකර මැතිණිය කදිම පෙනුමකින් හෙබි මේ තරුණිය කවරෙක්දැයි විමසන්නාක් මෙන් ප්‍රභා දෙස විමැසිල්ලෙන් බැල්මක් හෙලුවාය.

''ඔබ කවුද මීට ඉස්සර දැක පුරුද්දක් නැහැ''යි දුර්වල ස්වරයකින් සඳහන් කල ඈ මහත් කලබලකාරී ගතියකින් වටපිට බලා නැවතත් මෙසේ ඇසුවාය.'' මොකද මේ සෙනග පිරිලා ගෙදර කලබලයක් වගෙයි. මට මොකද මේ උනේ. ? මගේ ඇඟට කිසිම පණක් කඳක් නැහැ.''

සමරසේකර මහත්මිය ඉතා දුර්වල අඩියක ඉන්නා බව වටහාගත් ප්‍රභා ඇගෙන් ප්‍රශ්න කිරීම තව පැය කීපයකට කල්දැමීමට අදහස් කර ගත්තාය. තම සැමියා භයානක අන්දමින් මරා දමා ඇති බව ඈ තවමත් දන්නේ නැති බව ඇයට වැටහිගොස් අවසානය.

එයින් ප්‍රභාට එක් කරුණක් පැහැදිලිවෙයි. එනම් ඇයට සිහි නැතිවන බෙහෙත් දෙන වෙලාවේ ඈ තද නින්දේ පසුවූ

බවයි. මිනීමරුවා ජනේලයෙන් පැන නිදන කාමරයට ඇතුලුවන විට ගිල්මන් සමරසේකරත් ඔහුගේ බිරිඳත් තද නින්දේ පසුවෙමින් සිටියා වන්නට පුලුවන. ඉන්පසු සමරසේකර මැතිණියගේ නාසයට ක්ලෝරෆෝම් ඇල්ලූ මිනීමරුවා තියුණු කිණිස්සෙන් ගිල්මන්ගේ පපුවට ඇන තවත් තියුණු පිහියකින් ඔහුගේ උදරය කපා බොකු බඩවැල් එලියට දමා පලායන්නට ඇතුවාට නිසැකය.

ගිල්මන් මේ තරම් දරුණු අන්දමින් මරා දමන්න කෙනෙකුට අවශ්‍ය වූයේ මන්ද ?'' යන්න දැන් ඇයට විසඳීමට තිබෙන බරපතලම ප්‍රශ්නයකි.

මිසිස් සමරසේකර දෙස කාරුණික බැල්මක් හෙලමින් ප්‍රභා කතා කරන්නට වූවාය.

''මිසිස් සමරසේකර ඔබට වූ මේ විපත ගැන ආරංචිවෙලයි මම ආවේ. දැන් ඔබ හිටියාට වඩා හුඟාක් සනීපයි. සමරසේකර මැතිණිය විමැතියෙන් තරුණ කාන්තාව දෙස බැලුවාය.

''අනේ හැබැටම මේ කලබලේ මොකක් ගැනද. මට හැදුන අසනීපෙ මොකක්ද?'' ඈ දුර්වල හඬින් ඇසීය.

ප්‍රභා හිස සලමින් ක්‍රමාණුකූලව භයානක ආරංචිය ඇයට දැන්වීමට ඉටා ගත්තාය. ''මිසිස් සමරසේකර ඔබට ස්වභාවික අසනීපයක් හැදුනේ නැහැ. නමුත් කවුදෝ අබිරහස් පුද්ගලයෙක් ඔබට සිහිනැති කරවන බෙහෙත් අල්ලලා තිබුණා. ඒ උග්‍ර නිදි බෙහෙතක් ඊයේ රෑ පටන් එලිවෙන තුරුත් ඔබ මර නින්දේ නිදාගෙන සිටියා. තව සුලු කාලයක් පමා වූවා නම්'' රහස්





පරීක්ෂකවරිය ඇගේ කතාව මදකට නතර කලාය.

සමරසේකර මැතිණියගේ මුව ඉබේම විවර විය. තරුණියගේ ප්‍රකාශයෙන් ඈ හොඳටම බියට පත්වූ බව පෙණින.

''අනේ මට සිහිනැති කරවන්න උවමනා කලේ කාටද? ගිල්මන් මගේ ස්වාමියා මා ලගම නිදාගත්තා. ඔහුට මාව සිහිනැති කරන්න කවදාවත්ම උවමනාවක් නැහැ''

''ඔහු නොවෙයි.''

''ඉතින් මගේ ස්වාමි පුරුෂයා. ? ඔහු මාව කෝ දකින්නට ආවේ නැත්තේ ඇයි. ?''

ප්‍රභාට කතා නැතිවිය. බිරිඳක් තම දයාබර ස්වාමි පුරුෂයාට දක්වන ආදරය සෙනෙහස ගැන මැනවින් දන්නීය. කුල දෙවියන් හැරෙන්නට බිරිඳකට ගෘහයේ ඉන්නා එකම දෙවියා තමාගේ ආදරවන්ත ස්වාමිපුරුෂයාය. ඉතින් ගිල්මන් මෙවැනි ඛෙද ජනක මරණයකට මුහුණපා තිබෙයයි ඈ සමරසේකර මැතිණියට දන්වන්නේ කෙසේද ?

ගිල්මන් බිහිසුණු අන්දමින් මරාදමා ඇති බව සමරසේකර මැතිණියට වහාම දැන්විය යුතුය. ප්‍රමාද වීමෙන් වාසි ලැබෙන්නේ අපරාධ කල මිණීමරුවාටය.

එහෙත් මේ අභාග්‍යයේ ආරංචිය ඇයට දැනුම්දිය යුත්තේ ක්‍රමානුකූලවය. නැත්නම් එයින් ඇගේ හිතට කම්පනයක් ඇතිවිය හැකියි.

"මිසිස් සමරසේකර කණගාටුදායක ආරංචියක් දැනුම දෙන්න සිදුවෙලා තිබෙනවා."

"ඒ මොකක්ද ?" ඈ බිඳුනු ස්වරයකින් ඇසුවාය.

"ඔබව සිහි නැතිකල තැනැත්තාම මිස්ටර් සමරසේකරටත් අනතුරක් කරලා තිබෙනවා."

"අනතුරක් කරලා. මගේ ගිල්මන්ට. අනේ දෙයියනේ. ගිල්මන් කාටවත් වරදක් කරන කෙනෙක් නෙවෙයි. අයියෝ අයියෝ කියමින් සමරසේකර මැතිණිය බියෙන් සැලෙමින් පුටුවෙන් නැගිට වහා නිදන කාමරය දෙසට පියනගන්නට සූදානම් වූවාය.

ප්‍රභා සමරසේකර මැතිණියගේ අතින් අල්ලාගෙන ඈ සමගම සයනාගාරය දෙසට ඇදෙන්නට වූවාය. කොර්නර් තැන මළමිනියේ තුවාල පරීක්ෂාකර බලමින් සිටින අතර ප්‍රභාත් - සමරසේකර මැතිණියත් කාමරය තුලට ඇතුලු වූහ.

තම දයාබර සැමියාගේ මළකඳ සයනය මත වැතිර තිබෙනු දකින්ම මිසිස් සමරසේකරගේ මුවින් නික්මුනේ භයංකාර විලාප හඬකි. ඈ පපුවේ අත් ගසා ගනිමින් එකවරම විසඥව බිම ඇද වැටුනාය.





# 03

කුරුඳුවත්තේ රෝඩනි මාවතේ සිදුවූ භයානක මිනීමැරුම සිතාමතා කරන ලද අපරාධයක් බව පොලිසිය තේරුම් ගත්තේය. මරා දමනු ලැබූ ගිල්මන් සමරසේකර පිටකොටුවේ තුන්වන හරස් වීථියේ පිහිටි විශාල වෙළඳ ව්‍යාපාරයක කලමනාකාර - කොටස් කරුවෙකි. මරණය හා සම්බන්ධයෙන් සැකකල කිසිවෙක් නොවූවද සාමාන්‍යයෙන් ඔහු දන්නා හඳුනන හැම කෙනෙක්ගෙන්ම රහස් පොලිසිය ප්‍රශ්න කරනු ලැබූ නමුදු මිනීමැරුමට තුඩු දෙන හෝඩුවාවක් සොයා ගැනීමට අපොහොසත් විය.

මිනීමරුවා කෙස් ගහටම ප්ලෑන්කර මේ අපරාධය සිදුකර තිබේ. මිනීමැරුම කල රාත්‍රියේ තදින් වර්ෂාව පැවතුන නමුදු මිනීමරුවාගේ පා සටහන් කිසිවක් මරණය සිදුකල කාමරේ නොවීය. මිනීමැරුම ගැන තීරණයක් ගැනීමට නොහැකිවූ රහස් පොලිසිය ඊලඟට කලේ පොලිස් සුනඛ - රෙක්ස් රෝඩනි මාවතේ නොම්මර අනූනමයේ නිවසට ගෙන ඒමය.

ප්‍රථමයෙන් ගිල්මන් සමරසේකරගේ මිනිය තිබූ කාමරයට රෙක්ස්ව ගෙනයනු ලැබීය. රෙක්ස් නමැති මේ පොලිස් සුනඛයා ඉව ඇල්ලීමේ මාර්ගයෙන් අපරාධ රාශියක්ම විසඳු රහස් පරීක්ෂකයෙකි. බල්ලා හතිලමින් කාමරය වටා රවුමක්

දෙකක් කැරකුණේය. අනතුරුව වහාම යාබද කාමරයේ සිටි සමරසේකර මැතිණිය කරා දුව ගියේය.

ඇගේ දෙපා ලඟ දෙවරක් කැරකුණු රෙක්ස් ඊලඟට කෙලින්ම ජනේලයෙන් පැන ගත්තේය. ඔහු බංගලාවේ ගේට්ටුව දක්වා දුවගොස් හිටිහැටියේම බලාපොරොත්තු කඩවූවක් මෙන් නැවති බලා සිටියේය.

මද වේලාවක් ගේට්ටුව ලඟට වී ඉව අල්ලමින් පසු රෙක්ස් නැවතත් බංගලාව තුලට අවුත් ප්‍රභාගේ දෙපා ලෙවකන්නට වූවාය.

"රෙක්ස් ඊට වඩා දුර උඹට යන්න ඉවක් නැද්ද ? එහෙනම් අපට ඕනැ කරන තැනැත්තා මෝටර් රථයකින් පලා ගිහින් තිබෙන හැඩැයි නේද ?"

පොලිස් බල්ලාට ඇගේ කටහඬ හුරුය. පුරුදුය. කතා කිරීමට නොහැකි වූවත් කියනදේ තේරුම් ගැනීමට ඔහු සමත්ය.

තරුණිය කියනදේ තේරුම් ගත්තාක් මෙන් හිස දෙවරක් ඒ මේ අතට වැනූ රෙක්ස් තම දත් වලින් ප්‍රභාගේ සාරිපොට අල්ලා ගෙන මළමිනිය තිබූ කාමරය දෙසට අදින්නට වූවාය.

පොලිස් බල්ලාට ඉව වැටුන විට හැසිරෙන ආකාරය මැනවින් ඈ දන්නීය. එබැවින් ප්‍රභා බල්ලා අනුගමනය කරමින් මළමිනිය තිබූ කාමරයට ඇදුනාය.

රෙක්ස් කෙලින්ම ගියේ ගිල්මන් සමරසේකරගේ සයනය ලඟටය. වලිගය වනමින් දිව එලියට දමා ගෙන මහත්





නොසන්සුන් තාවයකින් පෙලෙන්නට වූ බල්ලා හිටිහැටියේම යුග්ම සයනය යටට රිංගුවේය. රිංගා මොහොතක් ගතවන්නට මත්තෙන් නැවතත් එලියට පැමිණියේය.

යුග්ම සයනය යටින් පැමිණි රෙක්ස්ගේ මුවෙහි දත්වලින් තද කරගත් යමක් තිබෙනු දකින්ම ප්‍රභාගේ මුව ඉබේම විවර විය.

රෙක්ස් ඉව ඇල්ලීමේ ශූරයෙකි. සාජන්ට් ඩිකී වීරකෝන් මෙන්ම රෙක්ස්ද අපරාධකාරයන් පසු පස ලුහුබැඳ ඉව ඇල්ලීමේ ගජ හපනෙකි.

බල්ලා තැති ගැනුනාක් මෙන් එක්වරම මුවතුල රඳවාගෙන තිබූ දෙය බිම දැමීය. අනතුරුව හිටි හැටියේම පණ නැතිවී ගියාක් මෙන් තරුණියගේ දෙපාමත ඇලවුනේය.

බල්ලා සයනය යටට ගොස් සොයාගෙන ආවේ කුඩා කුප්පියකි. එය බිම වැටී තිබුණ නමුදු ප්‍රභා අතින් ඇල්ලීමට යුහුසුලුවූයේ නැත.

කුප්පිය පසෙක තිබියදීම ඈ වහා නැඹුරුව සුනඛයාගේ හිස අත ගෑවාය. ඉන්පසු පිරිසිදු වතුර භාජනයක් ගෙන්වා ඌට බොන්නට සැලැස්සුවාය. විනාඩි කීපයක් ගතවන්නට මත්තෙන් බල්ලාගේ තෝන්තු ගතිය පහව යන්නට විය. ඌ නව ජීවනයක් ලද්දකුමෙන් නැවතත් නොඉවසිලිමත්ව නැගී සිටියේය.

. අනෙක් සී. අයි. ඩී. කාරයන් දෙදෙනා මේ සියල්ල දෙස උනන්දුවෙන් බලා සිටියේය. බිම වැටී තිබුණු කුප්පිය

දෙස විමසිලි සහිත බැල්මක් හෙලූ ප්‍රභා මෙසේ කියන්නට වූවාය.

"මේක මිනිමරුවා ක්ලෝරෝෆෝම් ගෙනාපු කුප්පිය. මිසිස් සමරසේකර සිහිනැති කිරීමෙන් පසු ඔහු මේ කුප්පිය ඇඳ යටට විසිකර තිබෙනවා."

හෙක්ටර් පෙරේරා නමැති රහස් පරීක්‍ෂක නිලධාරියා බිමට නැඹුරුව ලේබලයක් අලවා තිබූ කුප්පිය අතට ගෙන පරීක්‍ෂාකර බලන්නට වූයේය. අනතුරුව තරුණිය අමතන්නට විය.

"මේ ඖෂධය රසායන ද්‍රව්‍ය විකුණන බෙහෙත් සාප්පු වල විකිණීමට තිබෙනවා. ඉතින් මේ නගරයේ තියෙන රසායන ද්‍රව්‍ය විකුණන සාප්පු වලට ගිහින් පරීක්‍ෂණ පැවැත්තුව හොත් ලඟදී මේ කුප්පියක් මිලදී ගත් තැනැත්තෙක් ගැන මතක තියෙන්නට පුලුවනි."

"නමුත් අපේ හවුල්කාරයා අමාරුකාරයෙක් බව පේනවා. හිතා මතා සංවිධානය කර මේ අපරාධය කලා නම් මිහිහා කවදාවත්ම නගරයේ රසායනික වෙලඳ සැලකින් මේ ඖෂධය මිලදී ගන්නේ නැත." මයික් ගුණරත්න - එනම් අනෙක් සී. අයි. ඩී. ඊට පිලිතුරු වශයෙන් පැවසුවේය.

"එහෙම කියන්න එපා මයික්. කොයිතරම් දක්‍ෂ අපරාධකාරයෙකුට උණත් ඉතාම සුලු දෙයින් වරදින්න ඉඩ තිබෙනවා."

ප්‍රභා ඒ කියමන අනුමත කලාය. තමා ලත් අත්දැකීම් අනුව දක්‍ෂ ලෙස සංවිධානය කර මේ අපරාධය කරන්න වුන්





පවා ඉතා සුලු දේවලින් නීතියට හසුවී තිබෙන බැවින් ඈ මෙසේ සඳහන් කරන්නට වූවාය.

"මේ මිනීමැරුම සම්බන්ධයෙන් දැනට අපට සොයා ගන්නට පුලුවන් වුන එකම හෝඩුවාව ඔස්සේ ලුහු බැඳ යාමක් සොයා ගන්නවත් උත්සහ කිරීම නුවණට හුරුයි."

ගිල්මන් සමරසේකරගේ ලෙයින් තෙත්වගිය ඇඳුම් සියල්ලම පොලිස් බල්ලාට ඉව කරනු ලැබීය. ඒවා ඉව කරන විට අමුලේ සුවඳ දැනෙන්නට වූයෙන් බල්ලා දිව දොට්ට දමාගෙනම කිහිපවතාවක්ම ලෙයින් තෙත් වුන ඇඳුම් ඉවත් කර බැලීය. මේ ඇඳුම් වල තවත් යමක් තිබෙන බව තේරුම් ගත්තාක් මෙන් රෙක්ස් සිය තියුණු නෙත් සගල තරුණිය දෙසට යොමු කලාය.

ඒදින සන්ධ්‍යාභාගයේ පුවත්පත් වල මේ මිනිමැරුම ගැන සම්පූර්ණ විස්තරයක් පල කරනු ලැබීය. වැසි කුණාටු සහිත රාත්‍රියේ සිදුකරන ලද මේ මිනිමැරුමට වගකිවයුතු අපරාධකාරයා අල්ලා ගැනීමට ඔත්තුවක් දෙන ඕනෑම කෙනෙකුට ත්‍යාගයක් දෙන බවද පොලීසිය විසින් ප්‍රකාශයට පත්කරනු ලැබීය.

ප්‍රභා ප්‍රමුඛ රහස් පරීක්‍ෂක නිලධාරීන් කිහිප දෙනෙක්ම ඉතා සියුම් පරීක්‍ෂණ වල යෙදී ගිල්මන් සමරසේකර හා අමනාපයෙන් පසුවූ අය ඇත්දැයි සොයා බැලූ නමුදු ඔවුන්ගේ බලවත් පුදුමයට මෙන් ඔහු කාගේත් හිතවතෙක් බව අණාවරණය විය. ගිල්මන්ගේ මරණය ඔහු ඇසුරු කල හැමදෙනෙකුගේම ශෝකයට කාරණයක් විය.

මේ මරණයට හේතුව කුමක්ද? හේතුවක් නැතිව මේ තරම් අහිංසක එමෙන්ම වටිනා ජීවිතයක් සාහසික අන්දමින් කෙලවර කිරීමට ඉටා ගත්තේ කවුද ? රහස් පරීක්ෂක ප්‍රභාගේ හිස ගිණිගෙන දැවෙන්නට වනුයේ මේ අභිරහස් මරණයට හේතුව සොයන විටය.

සමරසේකර මැතිණිය නිරන්තරයෙන්ම තම සැමියා වෙනුවෙන් උණුකඳුලු සැලුවාය. එහෙත් තම සැමියාට මේ විපත සිදුකල තැනැත්තා ගැන කිසිම හෝඩුවාවක් කීමට ඇ අපොහොසත් වූවාය.

මරණය සිදුවූ දා රාත්‍රියේ ගිල්මන් කලබලයේම ඊ. බෝවි නිවසට පැමිණි බවත් ආහාර ගැනීමෙන් පසු දෙදෙනාම සයනයට ගිය බවත් ඇ ප්‍රභාගේ ප්‍රශ්නවලට පිලිතුරු දෙමින් පැවසුවාය. වෙනදා මෙන් ගෘහයේ අමුත්තක් නොතිබූ බවද මොරසූරන වැස්ස පැවති බැවින් තමාට සුවසේ නින්ද ගිය බවත් ඇ වැඩි දුරටත් සඳහන් කලාය. පසුවදා පොලිසියෙන් පැමිණ තමාට ප්‍රථමාධාර දී සිහිය ලබා ගන්නා තුරු සිදුවූ කිසිවක් නොදන්නා බව කඳුලු සලමින් විස්තර කලාය.

''මිසිස් සමරසේකර මට එක කරුණක් ඔබෙන් අහන්නට තියෙනවා. ඔබේ ස්වාමියාගේ මරණය සිදුවූ දිනයේ ඔහු කලබලයේම ඊ. බෝවි ගෙදර ආවා යයි කිවා නේද ?''

''ඔව්'' සමරසේකර මැතිණිය අමුත්තක් නැතිව කිවාය.

''හොඳයි තම සැමියාගේ කටයුතු ගැන සෙව්ල්ලක් දක්වන අන් හැම යහපත් බිරිඳක්ම මෙන්ම ඔහු කලබලයේම -





ඊ. බෝවි ගෙදර ඒම ගැන ඔබ ප්‍රශ්න කලේ නැද්ද ?'' ප්‍රභා බලවත් උනන්දුවකින් විචාලාය.

''ඔව් මට ඒ ගැන කියන්නටත් අමතක වුනා නමුත් ඒක ඒ තරම් වැදගත්යයි මන් හිතන්නේ නැහැ. ඒක මේ මිනිමැරුමට කොහොමත්ම සම්බන්ධ ඇතෙයි කියලා මං හිතන්නේ නැහැ.'' ඇ දිර්ඝ සුසුමක් හෙලා ලය සැහැල්ලු කර ගනිමින් පැවසුවාය.

''නමුත් ඒක කීමෙන් හානියක් වෙන්නේ නැතෙයි කියලා මට හැඟෙනවා. අපට දැන් මේ මිනිමරුවා අල්ල ගැනීම සඳහා ගමන් කිරීමට සිදුවී තිබෙන්නේ සිහින් නූලක් උඩයි. ඒ නිසා මිසිස් සමරසේකර එදා රාත්‍රී ඔබේ සැමියා කලබල වීමට හේතුව මම දැනගන්න සතුටුයි.''

සමරසේකර මැතිණිය මෙතෙක් වේලා අතේ තබාගෙන හුන් ගිල්මන් සමරසේකරගේ ඡායාරූපය පපුවට තබා තදකර ගත්තාය. අනතුරුව රහස් පරීක්ෂකවරියගේ පැණයට පිලිතුරු සැපයූවාය.

''ඔය මරණය සිදුවන දිනයේ දහවල් ගිල්මන් වෙනදා වගේම දහවල් කෑම ගැනීමට හෝටලයකට ගිහින් තියෙනවා. ගිල්මන් පුරුද්දක් වශයෙන් දහවල් කෑම කන්නේ කොටුවේ ටාජ් මහල් හෝටලයෙනුයි. වෙනදා වගේ කෑම කමින් ඉන්නකොට ඊට ටිකක් එහායින් මේසෙ හිටිය කෙනෙක් මහ පුදුමයෙන් වගේ ඇසිපිය නොහෙලා ඔහු දෙස බලා හිඳලා තියෙනවා.''

''ඉතින්''

"ඉතින් ගිල්මන්ට මේ මිනිහා ගැන පුදුම හිතිලා තියෙනවා. ඒ මිනිහා බීමත් පුද්ගලයකුත් නොවන නිසා ඔහු මේ තරම් උනන්දුවෙන් බලා ඉන්නේ මොකදැයි ගිල්මන්ට තේරුම් ගන්න බැරුව ගිහින් තියෙනවා. එතකොට අර මේසේ වාඩිවී සිටි මිනිහා කෙටි සිනා රැල්ලකින් මූණ ඔප කරගෙන ගිල්මන් ලඟට ඇවිත් අහලා තියෙනවා තමා හඳුනන්නට පුලුවන්ද කියලා. ? ගිල්මන්ට ඔහු ගැන නිච්චියක් නැති නිසා හඳුනන්නේ නැතැයි කියලා තියෙනවා."

අමුත්තා හිනා වෙලා මෙන්න මෙහෙම කියලා තියෙනවා.

"අයියෝ ගිල්මන් තමුසෙට මාව හඳුනන්න බැරිව ගිය එක පුදුමයි අයිසේ. තමුසෙට මා ගැන මතක නැති වුනත් මට නම් තමුසෙ කොයිතරම් කාලෙකට පස්සෙ දැක්කත් හඳුනන්න පුලුවනි."

ගිල්මන්ට ඉවසීමේ සීමාව ඉක්මවා යන්න වුනා.

මේ අමුත්තා තමා කවරෙක්දැයි හඳුන්වා දෙන තුරු ඔහු නොයිවසිලිමත් භාවයෙන් පෙලෙන්නට වුනා.

"ඉතින් මිස්ටර් ඉක්මන් කරලා කියනවකෝ මට දැන් කාර්‍යාලයට යන්නත් තියෙනවා."
අමුත්තා නැවතත් සිනාසී මෙසේ කියන්නට වුනා.

'ගිල්මන් තමුසෙ මේ අවස්ථාවේ හුගාක් කාර්‍ය බහුල වගෙයි. ඒ නිසා මට තමුසෙත් එක්ක හිතේ හැටියට කතා කරන්න ලැබෙන්නේ නැහැ. අවුරුදු ගණනක ඉඳල මම තමුසෙව





මූණ ගැහෙන්නට බොහොම ආශාවෙන් හිටියා. ඔව් ලොකුම උවමනාවකට ඒක මේ තරම් කලබලේට කියන්න පුලුවන් දෙයක් නොවෙයි. මට තමුසෙව නිදහසේ මූණගැසී ටිකක් කතා කරන්නට ඕනෑ. ඒ නිසා තමුසෙගේ කාර්යාලෙ ලිපිනය මට දෙන්න. මම අද හැන්දෑවට නොවරදවාම මූණ ගැහෙන්න එන්නම්."

ගිල්මන් ඔහුගේ වෙලඳ ව්‍යාපාරයේ ලිපිනය දී විමතියෙන්ම හෝටලයෙන්ම පිටවී යන්න ගිහින් තිබෙනවා. මේ අමුත්තා තවමත් ඔහුට ප්‍රහේලිකාවක්.

එදා හවස් වරුවේම අමුත්තා ගිල්මන්ගේ කාර්යාලයට ඇවිත් ඔහුගේ විස්තරය කියන්නට පටන්ගෙන තියෙනවා.

"මිස්ටර් ගිල්මන් තමුසෙට මා ගැන මතක නැති වුනත් මට තමුසේ ලෙහෙසියෙන්ම අමතක කල නොහැකියි. තමුසේ මහනුවර ත්‍රිත්ව විද්‍යාලයයේ ඉගෙන ගන්න කාලේ මාත් ඒ පංතියේම ඉගෙන ගත්තා මතක නැද්ද ? මම මේ නාරද වීරසිංහ."

ගිල්මන් පුදුමයට පත්වෙලා අමුත්තා දෙස බලාගෙනම ඉඳලා තියෙනවා. ඇත්තටම තමා ඉදිරිපිට සිටින පුද්ගලයා තමා හා එකට එක පන්තියේ ඉගෙනීම කල නාරද දැයි ඔහුට පුදුම හිතිලා තියෙනවා.

"නාරද උඹ හුගාක් වෙනස් වෙලා නොවැ. මට නම් කොයි විදියකින්වත් හඳුනාගන්න බැරිවුනා. දැන් කොහොමද ජීවිතේ තොරතුරු ? මොනවද ඔබ රැකියාව වශයෙන් කරන්නේ?"

"මම මැණික් වෙළඳාම කරනවා. ලංකාවේ මැණික් ජාත්‍යන්තර වෙළඳ පොලට ඉදිරිපත් කරනවා.

"ඕ - ගජවාසි ලැබෙන ව්‍යාපාරයක්."

"නමුත් ගිල්මන් මට නමුසෙව මූණ ගැහෙන්න උවමනා කල දේ ගැන කතා කරන්න තවම බැරිවුනානේ. එතකොට මගේ හිතේ තියෙන ලොකු බරකින් මට නිදහස් වෙන්න පුලුවනි."

ගිල්මන්ට තවමත් පුදුම නොවී සිටිය නොහැක. ඔහු තම පැරණි පාසල් මිතුරාගේ කතාබහ ගැන හොඳ තරමට නොසන්සුන් වී සිටියේය.

"නාරද ඔය තරම් වැදගත් දේ මොනවාදැයි කියන්න."

නාරද වීරසිංහ දිග සුසුමක් හෙලා ශෝකී හඬකින් මෙසේ කියන්නට වුනා.

"ගිල්මන් ත්‍රිත්ව විද්‍යාලයෙන් අස්වුණු අපි විශ්ව විද්‍යාලයට ඇතුල් වුණා. විශ්ව විද්‍යාලයේදී නුඹ සමග මානෙල් කියලා කෙල්ලක් මිතුරු කමක් ඇති කරගත්තා මතකද ?"

"මානෙ-ල් දෙවියනේ දැන් අවුරුදු කොච්චර පහුවෙලාද? ඇ ගැන මට මතක් වුනේ දැනුයි." ගිල්මන් පුදුමයෙන් කීවා.

"ඔව් නුඹේ මතක නැතිවීමම ඇගේ අවාසනාවට හේතුවුනා. නුඹ ඇත් එක්ක තද මිතුරු කමෙන් හිටියා. ඔව්





ඇත්තම කියනවා නම් ඇ නුඹට අවංකව ප්‍රේම කලා. ඒ බව දන්නේ ඇගේ හිතත් මාත් පමණයි. මානෙල් මට දුර ඥාති සම්බන්ධකමක් තියෙන කෙල්ලෙක්. ඇගේ දෙමව්පියන් උඩරට ධනවත් රදල පරපුරකට අයත් මිනිස්සු. ඇ ඇගේ හද පත්ලෙන්ම නුඹට ප්‍රේම කරලා. ගිල්මන් නුඹ ශිෂ්‍යත්වයක් ලබා එංගලන්තය බලා පිටත්වී යද්දි කියාපු වචන ඇගේ අවසාන මොහොතෙත් සිතේ රැඳී පැවතුණා." පැවසූ නාරද ශෝකයෙන් සුසුමක් හෙලා බිම බලා ගත්තේය.

"අවසාන මොහොතේ? නාරද මට නුඹ කියනදේ තේරුම් ගන්න බැහැ. මානෙල්ට මොකද වුනේ. ?" ගිල්මන් කලබලයෙන් ඇසීය.

"කලබල වෙන්න එපා ගිල්මන් මම මේ කියන්නට සූදානම් වෙන්නේ ඒ ටික තමයි. ඇට වුන දේ තමයි නුඹ එංගලන්තයට ගොස් ආපසු ආ හැටියේම ඇ විවාහකර...."

"ඔව් - නමුත් ගිල්මන්ට ඉන් ඉදිරියට යමක් කීමට ධෛර්යයක් නොමැතිව ගොලුවුනා."

"ඔව් ඒ පොරොන්දුව ඉෂ්ඨ කිරීමට ඔබට නොහැකි වුනා. ගිල්මන් අවුරුදු පහකට පස්සේ ඔබ ලංකාවට පැමිණියා. ඒ අවුරුදු පහ තිස්සේ ඇ ඔබ ගැනම ලොකු බලාපොරොත්තුවක් ඇතිව සිටි බව මා හොඳින් දන්නවා. පවුලේ හැම දෙනෙක්ම ඇගේ මේ බලාපොරොත්තුව ගැන දැන සිටියා. ඒ නිසා ඇට වෙනත් විවාහයකට බලකලේ නැහැ."

ගිල්මන්ගේ මුහුණ ටිකෙන් ටික මලානිකවී ගෙන යන්නට වුණා. එහෙත් නාරද තම කතාවේ ඉතිරි කොටසත් සම්පූර්ණ කරන්නට වුනා.

''බලාපොරොත්තු ඇතිකරගත් නැනැත්තෙකුට ඒ බලාපොරොත්තු සියල්ල එකවර බිඳ වැටුනාම හිතට කොයිතරම් වේදනා ගෙනදෙනවාද ? මව් ඔබ ලංකාවට ආපු හැටියේම මගේ නැනා කෙනෙක් සමග විවාහ වූවායයි යන ආරංචිය මානෙල්ට ආරංචිවුනා. ඒ ආරංචිය ඇගේ හදවත දෙදරවීමට සමත් වුනා. ගිල්මන් සතියක් දෙකක් ගතවන්නට මත්තෙන් ඈ රෝගාතුරවී සයනයට වුනා. ඒ රෝගය දිනෙන් දිනම උත්සන්න වුනා. ලංකාවේ ඉන්නා ඉතා දක්ෂ වෛද්‍යවරුන් කැඳවා ප්‍රතිකාර කල නමුත් මානෙල්ගේ රෝගය ඒ මානසික රෝගය සුව කිරීමට බැරිවුනා. ගතේ රෝගයක් නම් සුවකල හැකියි. නමුත් මානෙල්ට තිබුනේ සිතේ රෝගයක්. එක් අඳුරු සැන්දෑවක ඈ අවසන් හුස්ම හෙලන්නට ආසන්න වුනා.

මානෙල් ලෙඩ ඇඳේ ඉඳගෙනම පහත් හඬින් මට ආමන්ත්‍රණය කලා.

''නාරද මේ ඇඳ ලගට ටිකක් එන්න.'' ඉල්ලූ ඈ දෙනෙත් හැරගෙනම මා දෙස බලා උන්නා.

''අනේ ඒ අවස්ථාවේ ඇගේ මුහුණේ තිබූ ශෝකාකුල පෙනුම ඒ දෙනෙත් වල වූ අහිංසක බැල්ම තමා ආශා කල හැම දෙයකටම සදහටම ආයුබෝවන් කියන්නාක් වැනි දුක්ඛිත හැඟීමක් ඇගේ සිතේ සටහන්වී තිබෙන බව මට දැනුනා.

දැන් අවසානය ලඟාවී ඇතිබව මම තේරුම් ගත්තා. දෙනෙතින් කඳුලු ගලා යන්නට සූදානම් වුවත් මම හිත ධෛර්‍ය කරගෙන ඇගේ ලඟට ලංවුනා.





මානෙල් ඇගේ සුදුමැලි මුහුණ මා දෙසට හැරෙව්වා. ඒ දෙනෙත්වල තිබූ බැල්ම දනසක්දේ ඒ දෙනෙත්වල පිළිබිඹුවී තිබුනද ඒවා හෙලිකරන්නට තරම් ධෛර්‍යයක් ඇයට තිබුනේ නැහැ.

ඈ ඉතා දුර්වල හඬින් කතා කරන්නට වුනා.

''නා-රද මගේ අන්තිම මොහොත ලංවීගෙන එන බව මට තේරෙනවා. මා දුක්වන්නේ නැහැ දුක්වීමෙන් පලක් නැහැ. ඔහු සැපෙන් සන්තෝෂයෙන් ඉන්නවා නම් ඒ හොඳටම ඇති මට සැනසිල්ලේ මැරෙන්න පුලුවනි. ඔබ මා ගැන කිසිවක් ඔහුට කියන්න - එපා එතකොට - ඔහුගේ හිතට වේදනාවක් - ඇතිවෙන්න - පුලුවනි. ඒක ඔහුගේ සොම්නසට කරදරයක් - වන්නත් ඉඩ තියෙනවා. නමුත් නාරද - ඔබ මට එක උදව්වක් කරන්න ඕන. ඔබ මේ ඥාති සොහොයුරියගේ ඉල්ලීම ඉටුකරන්න ඕනෑ. '' මෙසේ පැවසූ ඈ මගේ මුහුණ දෙස බලා සිටියාය.

මම ඒ බැල්මෙන් ඈ අදහස් කරන දේ තේරුම් ගත්තා.

''කියන්න! මානෙල්! කියන්න! ඔබ ඉල්ලන ඕනෑම දෙයක් මා ඉටු කරන බවට පොරොන්දු වෙනවා.'' මම ශෝකයෙන් පැරුණු හදින් යුතුව කීමි.

මානෙල් මහත් අමාරුවෙන් ඇඳේ එක් ඇලයකට හැරී ඇගේ කොට්ටය අස්සට අත දමා යමක් අතට ගත්තා. එය කුඩා ආභරණයක් බව මට පෙනුනා. එය රිදියෙන් තැනූ හදවතක ආකෘතියක් ඊතලයෙන් හදවත පසා කරගෙන යන සේ ගසා තිබුණි. එය ප්‍රේමය හඟවන ලාංඡනයක්. ඈ මහත් ශෝකයෙන් ඒ ලාංඡනය දෙස බලා කතාකරන්නට වුනා.

''නාරද - ඔබ මේ දේ කොහොම හරි ඔහුගේ අතට පත් කරන්න ඕන. නමුත් අවසන් හුස්ම හෙලූ බව පමණක් ඔහුට දන්වන්න එපා. ඔහුගේ නව දිවියට මා සුබ පැතූ බවත් මා සන්තෝෂයෙන් කල් යවන බවත් ඔහුට කියන්න.'' කී ඇ මගේ වේදනාවකින් පපුව අල්ලා ගත්තා.

''ශෝකය උත්සන්නවී ගියෙන් මගේ නෙත් වලින් කඳුලු කඩා හැලෙන්න වුනා. මම ඇගේ අත වැරෙන් අල්ලාගෙන ''මානෙල් මගේ ආදරණීය මානෙල් නුඹේ ඉල්ලීම ඒ විදියටම මම ඉෂ්ඨ කරනවා. ඒ ගැන සැකයක් ඇතිකර ගන්නේ නැතුව සැනසිල්ලේ ඉන්න.''

''ඔව් දැන්නම් සැනසිල්ලේ මැරෙන්න පුලුවනි. නාරද ඔව් මේක ඔහුටම දෙන්න. මගේ සුබ පැතුම් සමග මේක දෙන්න'' ඇ කුඩා රිදීමය ආභරණය මා අත තබා ශෝකයෙන් හරිත වූ මුහුණ පසෙකට හරවා ගත්තා.

එදා රාත්‍රියේම මානෙල් අවසන් හුස්ම හෙලුවා. ගිල්මන් දැන් ඇ මැරිලා අවුරුද්දක් ගතවුනා. මේ අවුරුද්ද ඇතුලත මම සිටියේ බොහොමත් සිත් වේදනාවෙන්. මිය ගිය මානෙල්ට වූ පොරොන්දු ඉටුකිරීමට නොහැකිවීම මගේ හිතටත් ලොකු වේදනාවක් වුනා. ඒ නිසා ඔබ ගැන විස්තර මම සොයන්නට පටන් ගත්තා. අවුරුද්දක් තිස්සේ ඔබ මුණ ගැහෙන්නට මම උත්සහ ගත්තා ඒ උත්සහයේ ප්‍රතිඵල ලැබුණේ අදයි කී නාරද කබා සාක්කුවට අත දමා වොලොට්ටුව දිගහැර රෙදි කඩක එතූ යමක් එලියට ගත්තා.





''ගිල්මන් මානෙල් ඔබට දෙන්නැයි කී දේ මෙන්න. නමුත් ඇයට පොරොන්දු වූ හැටියට ඇ තවම ජීවතුන් අතර ඉන්නවායි මට බොරු කියන්න බැහැ. දැනට ඇ මැරිලා අවුරුද්දක් ගත වෙනවා.''

ගිල්මන් ඔහුගේ පැරණි හිතවතිය එවා තිබුණ ආභරණය අතට ගත්තා. ඒක ප්‍රේමයෙන් වෙලී සිටින දවස් වල ඔහු විසින්ම ඇට තෑගි කරන ලද එකක්. ඔහුගේ හිතට සංවේගයක් ඇති වුනේ ඒ නිසයි.''

සමරසේකර මැතිණිය මේ කතාව ප්‍රභාට විස්තර කරදී දිග සුසුමක් හෙලුවාය. ''ඔන්න ඔය සිද්ධිය නිසා ගිල්මන් එදා කලබලයෙන් ගෙදර ආවා. ඔහු ඒ සිද්ධිය පිළිබඳ සෑම දෙයක්ම මට විස්තර කර දුන්නා. අපි දෙන්නා අතර කිසිම රහසක් තිබුණේ නැහැ.'' ''ඔබේ සැමියා ඔය මානෙල් කියන තරුණියකට වරක් ප්‍රේමකල බව ඔයා කලින් දැන සිටියාද ?'' ප්‍රභා මෙහිදී හරස් ප්‍රශ්නයක් නැගුවාය. සමරසේකර මැතිණිය හිස වැණුවාය. ''අපොයි ඔව්! අපි දෙන්නා විවාහවී සතියක් යන්නට ප්‍රථම ඔහු ඒ ගැන මට විස්තර කරලා ඇ ඔහුට එවා තිබුණු හසුනක් පවා මට පෙන්නුවා. මම ඒ අසරණ තරුණියට අනුකම්පා කලා. නමුත් ප්‍රමාද වුනා වැඩියි. ගිල්මනුත් මාත් අතර විවාහය සිදුවූයේ හිතන්නට බැරි තරම් ඉක්මණින්. ඔව් ඔහු එංගලන්තයේ ඉඳල එන කොට දෙපක්ෂයේ වැඩිහිටියන් මේ කටයුත්ත පිලයෙළ කර හමාරයි. ගිල්මන්ට එයාගේ පෙම්වතිය බලන්නට යන්නටත් ඉඩක් ලැබුණේ නැහැ! විවාහය ඉක්මන් වුනා.''

මිසිස් සමරසේකර මානෙල් ඔබේ සැමියාට තෑගි කල ඒ ලොකැට්ටුව තවමත් ගෙදර තියෙනවාද ?''

''සත්තකින්ම ගිල්මන් ඒ ලොකැට්ටුවට බොහොම ආදරය කලා. තමාගේ ජීවිතයේ සිහිවටනයක් හැටියට ඔහු ඒක ඉතා පරිස්සම් කලා'' සඳහන් කල සමරසේකර මැතිණිය ගෙතුලට වැදුනාය.

මිනිත්තු කීපයකට පසු රන් ආභරණ තැන්පත් කරන කුඩා පෙට්ටියකුත් අතැතිව එලියට පැමිණියාය. පෙට්ටිය තුලින් රන්මය චේන් පොටක එල්ලා තිබූ ලොකැට්ටුවක් ගෙන රහස් පරීක්ෂක වරියගේ අත තැබුවාය.

ප්‍රභා ලොකැට්ටුවේ කුඩා පියන විවෘත කලාය. එහි මැද රූමත් තරුණියකගේ ඡායාරූපයක් තිබුණි. මුවග තිබූ අහිංසක මද සිනා රැල්ල තරුණියකගේ හදවත විනිවිද පෙනෙන කැඩපතක් මෙන් පෙනුනේය.

මද වේලාවක් කල්පනා කිරීමෙන් පසු ප්‍රභා යමක් තේරුම් ගත්තාක් මෙන් මෙසේ සඳහන් කරන්නට වූවාය. ''මිසිස් සමරසේකර අවුරුද්දක් තිස්සේ මේ නාරද කියන මනුස්සයා ඔබේ සැමියාව සොයමින් රටපුරා ඇවිදලා තියෙනවා. ඉතින් ඔහු මුණ ගැසුන දවසේම රාත්‍රියේ ගිල්මන්ව මරාදාලා. මේ නාරද කියන මිනිහා ගැන නම් මට අවිශ්වාසයි.''

''නමුත් නාරදට මේ සම්බන්ධය ගැන මේ තරම් දැඩි පියවරක් ගන්න අවස්ථාවක් තිබුණේ නැහැ. ඔහු කලේ මරණාසන්න මොහොතේ සිටි කෙනෙකුට වූ පොරොන්දුවක් ඉටුකිරීම පමණයි. ගිල්මන්ව මරාදාන්න තරම් හේතුවක් නාරදට තිබුණේ නැහැ.''

''එහෙම කියන්න එපා මිසිස් සමරසේකර. සී. අයි. ඩී.





නිලධාරින් වන අපි හැම කෙනෙක් කෙරෙහිම සැම දෙයක් ගැනම සැක ඇතිකර ගැනීම පුරුද්දක්. විශේෂයෙන්ම අප පුහුණුකර තිබෙන්නේ ඒ අනුවයි. බොහෝ අවස්ථාවල ඒ සැක කිරීම අපේ වාසියට හේතුවී තිබෙනවා.''

''නමුත් නාරද මේකට පටලවගන්න බැහැ. මට ඒ බව හොඳටම විශ්වාසයි.''

''ඔබ නාරද හඳුනනවද ?''

''නැහැ මම කවදාවත්ම ඔහු දැකලා නැහැ. ගිල්මන් අර විස්තරේ කලාට පස්සේ තමයි ඔහු ගැන දැනගත්තේ.''

''බොහොම ස්තුතියි මිසිස් සමරසේකර. මම කොහොම හරි මේ නාරද ජයසිංහ කියන තැනැත්තාව සොයා ගන්න උත්සාහ දරන්නම්. එතකොට ඔබේ ස්වාමිපුරුෂයාගේ මිනීමැරුමට අලුත් පරිච්ඡේදයක් පෙරලෙන බව මට දැනෙනවා. කොයිහැටි වෙතත් මේ ලොකැට්ටුව මට දෙන්න. මම නැවතත් ඔබට ගෙනවිත් දෙන්නම්.''

ඒ ඉල්ලීමෙන් සමරසේකර මැතිණියගේ මුහුණ එකවරම මලානිකවී ගියේය. පූර්ණ චන්ද්‍රයා ඝන කලු වලාවකින් වැසී ගියාක් මෙන් මෙතෙක් වේලා ඇගේ මුහුණේ තිබූ සොම්නස් සහගත භාවය අතුරුදන්වී යනු පෙනින.

''ඔබ නීතිය ඉටු කිරීමට වෙහෙසෙන රහස් පරීක්ෂකවරියක් බව මා දන්නවා. නමුත් ඔබ මගෙන් ඉල්ලා සිටියේ ඉටු කිරීමට නොහැකි - ඉතාම බැරෑරුම් දෙයකි. ඔය ලොකැට්ටුව ගිල්මන් මෙපමණ කලක් බොහොම පරිස්සමෙන්

ආරක්‍ෂා කලා. ඉතින් ඒක ඉල්ලීමෙන් ඔබ කරන්නේ...

"මිසිස් සමරසේකර මේ ලොකැට්ටුව මේ විදියටම නැවත ඔබටම ගෙනවිත් දෙන බවට මා පොරොන්දු වෙන්නම්, ඒ ගැන සැකයක් හිතන්නට එපා."

බලවත් පෙරැත්තයකින් පසු ලොකැට්ටුව ඉල්ලා ගත් සී. අයි. ඩී. තරුණිය කොටුවේ ප්‍රධාන පොලිස් කාර්යාලය බලා සිය මෝටර් රථය පදවන්නට වූවාය.





# 04

ගිල්මන් සමරසේකරගේ මරණය සම්බන්ධයෙන් ඔහුගේ සොහොයුරකුත් තදින් ක්‍රියා කරන්නට වීම නිසා පොලීසියටද එය නොවිසඳුන අපරාධයක් ලෙස හංවඩු ගසා ඒ පයිලය පසෙකට දැමීමට කිසිසේත් නොහැකි විය. රජයේ උසස් තනතුරු දෙකක් දරණ ගිල්මන්ගේ වැඩිමහල් සහෝදරයන් දෙදෙනා තම මල්ලිගේ අභිරහස් මරණය ගැන තියුණු පරීක්ෂණ පවත්වන හැටියට පොලිස් දෙපාර්තමේන්තුවේ උසස් තැන් වලට බලකල බැවින් මිනීමිරුම ගැන නොසලකා හැරීමට පොලිසියට අපොහොසත් විය.

කිසිවකුගේ හව් හරණයක් නැති දුප්පතකු මේ අන්දමින් මරා දැම්මා නම් පොලීසිය ඇසුත් කනුත් වසාගෙන නිසොල්මන්ව ඉන්නා නමුදු ගිල්මන් සමරසේකරගේ මරණය ලෙහෙසියෙන් අහක දැමිය නොහැකි විය. දෙපාර්තමේන්තුවේ උසස් තැන් වලින් ලැබෙන ඇණවුම් නිසාම රහස් පරීක්ෂකයින් රට පුරා ඇවිදිමින් ඔත්තු සොයන්නට වූහ. පුවත්පත්ද ඒ මරණය ගැන හාර අවුස්සමින් සුලු ප්‍රවෘත්ති පලකරන්නට පටන් ගත්හ.

මරණය සිදුවී සතියක් ගෙවී ගියේය. හරියටම දවස් හත ඉකුත් වන දිනයේ උදෑසන දහයට පමණ කොළඹ කොටුවේ රහස් පරීක්ෂක කායාලයේ සුපිරින්ටෙන්ඩන්ට් වරයාගේ

නාමරයට ඇතුලුවූ අමුත්තෙකි. තමා සුපිරින්ටෙන්ඩන්ට් වරයා හමුවට පැමිණියේ මිනීමැරුමක් සම්බන්ධයෙන් තමා දන්නා යමක් ගැන රහසේම ආරංචියක් දෙන්නට බව ඔහු කියා සිටියේය.

සුපිරින්ටෙන්ඩන්ට් ධීරසිංහ තමා අතට පත්වන ඕනෑම කෙනෙකුගේ සිතේ තිබෙන රහස් සියල්ලම අසා දැන ගැනීමට තරම් උපායෙහි දක්ෂ නිලධාරියෙකි. ඔත්තු දීමට පැමිණෙන උදවියගේ සිත් සතුටු වන අන්දමින් කතා කිරීම ඔත්තුව දීම නිසා විරුද්ධ පාක්ෂිකයන්ගෙන් ලැබෙන තර්ජන - ඇණුම් බැනුම් වලින් ආරක්ෂාව සලසා රැකවරණය ලබාදෙන බවට පොරොන්දු වීමෙන් ඔහු තමා මුණ ගැසීමට එන හැම තරාතිරමක කෙනෙකුගෙන්ම නිවැරදි පැහැදිලි ආරංචි සොයා ගත්තේය.

එබැවින් මිනීමැරුමක් ගැන තමාට ඇතිවූ සැක සහිත හැඟීමක් ගැන දැනුම් දීමට පැමිණි මේ තැනැත්තා දෙස විමසිලි සහගත බැල්මක් හෙලූ නිලධාරියා ඔහුට හිඳ ගන්නට අසුනක් පෙන්වීය.

අමුත්තා සුදු කමිසයකින් හා ටසෝර් කලිසමකින් සැරසී සිටියේය. කොණ්ඩය කොටට කපා පස්සට පීරා තිබුණේය. බැලූ බැල්මට හෙතෙම වැදගත් කෙනෙක් බව පෙනෙයි.

සුපිරින්ටෙන්ඩන්ට්වරයා අමුත්තා දෙස යටසින් බලා කතාකරන්නට විය. ''මිස්ටර් මේ කොහේ ඉඳලද ? නම මොකක්ද?

අමුත්තා සාවදානව ඉංග්‍රීසියෙන් පිළිතුරු දුන්නේය. ''මම නැවතිලා ඉන්නේ පුංචි බොරැල්ලේ බෝඩිමක. රස්සාව කරන්නේ මරදාන දුම්රිය පොලේ. මම එතැන බුකිං ක්ලාක්. මගේ නම





නඩරාජා සදානාදන්'' ඕ - හෝ - එතකොට ඔබ ද්‍රවිඩ ජාතිකයෙක්.''

''ඔව් - සර්''

''හොඳයි මාව මුණගැහෙන්නට ආවේ මිනීමැරුමක් ගැන ආරංචියක් දන්වන්නයි කීවා නොවේද ?''

නඩරාජා සදානාදන් මෙතෙක් වේලා අතේ තබාගෙන හුන් දිනපතා පුවත් පත දිගහැර එහි පලවී තිබුණු ආරංචියකට සුපිරින්ටෙන්ඩන්ට්වරයාගේ අවධානය යොමු කර විය. හිස සලා මෙසේ කියන්නට විය.

''මිස්ටර් සදානාදන් පත්තරේ සඳහන් ඔය මිනීමැරුම ගැන තමයි දිවා රෑ නොතකා අපි වෙහෙසෙන්නේ.''

දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවකයා බලාපොරොත්තු සහගත බැල්මක් හෙලා කතා කරන්නට විය.

''සර් ඔය මිණීමැරුම සිද්ධවුනායයි කියන රාත්‍රියේ මට සැක කටයුතු මිනිහෙක් මුණ ගැහුනා. ඔව්! ඒ කියන්නේ ඔහු මරදානෙන් පොල්ගහවෙල බලා යන අන්තිම කෝච්චියට ටිකට් එකක් ගන්න ආවා වගේ මට මතකයි. සිද්ධිය නම් මෙන්න මේකයි. ඒ මිනිහා වේයන්ගොඩට ටිකට් එකක් ඉල්ලුවා කෝච්චිය ඇක්ස්ප්‍රස් නිසා මම කීවා වේයන්ගොඩ නවත්වන්නේ නැහැ කියලා. මිනිහා කලබලයේම පොල්ගහවෙලටම ටිකට් එක ගත්තා. වේයන්ගොඩින් බහින්න උවමනා කරන මිනිහා පොල්ගහවෙලට ටිකට් එකක් ගත්තේ මොකදැයි පස්සේ මට සැකයක් ඇති වුනා. හා තවත් දෙයක් ඔබට කියන්නට තිබෙනවා ඒක තමයි ඉතාම වැදගත්.''

''මිනිහා වැස්සට තෙමී බත්ව් තිබුණා. පොල්ගහවෙලට ටිකට් එකක් ගත්ත මිනිහා කවුන්ටරය තුලින් රුපියල් දෙකේ නෝට්ටුවක් දැම්මා. අනේ ශිව දෙවියනේ ඒ නෝට්ටුවේ ලේ පැල්ලම්. ඔව් අමුලේ පැල්ලම් කීපයක් තිබෙනවා දැක්කම මම ප්‍රශ්න කලා. මිනිහා කිව්වා ලිස්සලා ගිහින් බෝතල් කැල්ලකට කැපුනාය කියා. ඉන්පසු මිනිහා ඉතුරු සල්ලිත් නොගෙන දුවනවා පෙනුනා. මට මිනිහා ගැන සැකය තහවුරු වුනේ ඒ නිසයි. පසුවදා මේ සැකය වඩාත්ම තහවුරු වුනේ පොල්ගහවෙල බලා ගිය කෝච්චිය ගනේමුල්ල වංගුවේදී හිටිහැටියේම දම්වැල ඇදලා නවත්වලා කවුදෝ බැහැල ගිහින් තිබෙනවා ආරංචි වුනාට පසුවයි. ඉතින් සර් රාත්‍රී කෝච්චියෙන් ගිය මේ මිනිහා ඔය මිනී මැරුමට සම්බන්ධ කෙනෙක් බව මට ඉඳුරාම කියන්න පුලුවනි. ඒ රුපියල් දෙකේ නෝට්ටුව මම පරෙස්සම් කරලා තියාගෙන අරගෙන ආවා.'' යි පැවසූ සදානාදන් සුදු කඩදාසි කැබැල්ලක ඔතාගෙන තිබූ රුපියල් දෙකේ නෝට්ටුව සුපිරින්ටෙන්ඩන්ට්වරයා අත තැබුවේය.

''ඔබට බොහොම ස්තුතියි. මිස්ටර් සදානාදන්. මේ ආරංචිය අපි පුවත්පත් වලට දෙනවා. ඊලගට ඒ මාර්ගයෙන් තවත් විස්තර සොයාගන්න පුලුවන් වේ යයි මම අදහස් කරනවා. ඔය කියන වේලාවේ ගමන් කල මිනිහා දැකපු තවත් උදවිය ඉන්න පුලුවනි. එතකොට ඔහුගේ හැඩහුරුකම්වත් අපිට දැනගන්නට හැකි වේවි.''

සුපිරින්ටෙන්ඩන්ට්වරයා පුවත්පත් කාර්යාල කීපයකටම ටැලිපෝන් මගින් කතාකොට ඉතාම වැදගත් හදිසි ආරංචියක් දීම සඳහා වාර්තාකරුවන් එවන්නැයි ඉල්ලා සිටියේය. ඔහුගේ ඉල්ලීම සුලු කලක් යන්න මත්තෙන් ඉටුවිය.





සදානාදන් ගෙන් විස්තර දැනගත් පුවත්පත් වාර්තා කරුවන් නම් කැමරා එල්ලකොට ප්‍රවෘත්තිය සමග පල කිරීමට ඔහුගේ ඡායාරූප රාශියක්ද ගත්හ.

නඩරාජා සදානාදන් දුන් ආරංචිය පුවත්පත් වල මුල් තැනක් දී පලකර තිබුණි. එදා සවස් වන විට ප්‍රධාන පොලිස් කාර්යාලය කරා නිර්නාමික ටෙලිපෝන් පණිවුඩ ගලා එන්නට වූහ. පුවත්පත් වල විස්තර කරන අන්දමේ හැඩහුරුකම් ඇති පුද්ගලයෙක් ඒ වැසිදා රාත්‍රියේ තමන් දුටු බවත් ඔහු උස හීන්දෑරි සිරුරක් ඇති තැනැත්තෙක් බවත් ඇතමෙක් කියා සිටියාහ. ඒ මිනිහා වැහි කබායක් ලාගෙන වහ වහා ගමන් කරනු දුටු බව තවත් කෙනෙක් කීය. කෙසේ වෙතත් ඉදිරියට ඇවිත් සාක්ෂි දීමට කිසිවෙක් ඉදිරිපත් නොවූහ.

පුවත්පතේ පලවූ ආරංචිය ලැව් ගින්නක් මෙන් පැතිරයත්ම මරදානේ ගණිකා මඩමක සාමාජිකාවක්වූ ඇසිලින්ගේ සවන් තුලටද එය වැකුනෙන් ඇ කල්පනා කරන්නට වූවාය. මෙවැනි හැඩහුරුකම් ඇති පුද්ගලයෙක් වැසිදා රාත්‍රියේ ඇ දැක ඇති නමුදු ඒ කොතැනකදී දැයි හරියට නිච්චියක් නොමැති බැවින් ඇ තවත් මොලය වෙහෙසවා කල්පනා කරන්නට වූවාය.

මේ තැනැත්තා තමා සමග රැයක් ගතකල අනුග්‍රාහකයෙක්ද? එසේ නම් රැය ගතකලේ හෝටලයකද ? නැත්නම් ?

හා දැන් මොහු ගැන මතක් විය. මොහු තමාගේ අනුග්‍රහකයෙක් නොවේ. තමා සමග එක දිනක් හෝ රැයක් ගතකල අනුග්‍රාහකයෙක් නම් ඇ කිසි දිනක ඒ තැනැත්තා

අමාරුවේ දැමීමට සාක්ෂි නොකියන්නීය. එහෙත් මොනු ? මොනු තමාගේ යටහත් පහත් ඉල්ලීම පවා නොතකා රවා බැලූ හැටි ඇයට දැනුනු පෙනෙන්නාක් මෙනි. තදින් වර්ෂාව පැවතුනදා රාත්‍රියේ පත්‍රයේ සඳහන් පුද්ගලයා කඩිමුඩියේම දුම්රිය පොලට ඇතුලුවී පල්හොරෙකු මෙන් හැසිරුණු ආකාරය ඇයට මතක් වන්නා විය.

තමාගේ ඉල්ලීමට ඇහුම්කන් නොදී රැවූ මිනිහා ගැන දැන් ඇයට මතකය ඔව් එදා රාත්‍රියේ මරදානෙන් දුම්රිය පොලේදී පත්‍රයේ විස්තරය වී ඇති මිනිහා තමා දුටු බව පොලිසියට දැනුම්දීමට ඈ අදහස් කලාය.

වේලාව රාත්‍රී අටය. එහෙත් මේ ආරංචිය නොපමාව පොලිස් නිලධාරීන්ට දැනුම් දිය යුතුය. තමා වැනි නිදැල්ලේ හැසිරෙන ස්ත්‍රියක් අවේලාවේ පොලිසියට යාමෙන් තවත් කරදර ඇතිවීමට ඉඩ ඇති බැව් කල්පනා වූයෙන් ඈ හෙට උදෑසන වනතුරු තම අදහස කල් දැමීමට අදිටන්කර ගත්තාය.

නඩරාජා සදානාදන් සිය නේවාසිකාගාරයේ සැප පුටුවක දිගාවී වැනිලා සුරුට්ටුවක් උරමින් පසුවූයේය. ඔහු ඉදිරිපිට තිබූ ටීපෝව මත ලංකාවේ පලවන ඉංග්‍රීසි හා සිංහල පුවත්පත් රාශියක්ම තිබුණි. එහෙත් සදානාදන් ඉංග්‍රීසි භාෂාවෙහි හොඳ දැනුමක් ඇත්තෙකු වුවද ඔහුට සිංහල කියවන්නට හෝ ලිවීමට බැරිය. එසේ නම් ඔහු මේ සිංහල පුවත්පත් මිලදීගෙන ආවේ කුමකටද?

තමා පොලිසියට කල ප්‍රකාශය බිඳකුදු වෙනස් නොකොට තමාගේ විවිධ ඉරියව් වලට ගත් ඡායාරූප සමග පුවත්පත් වල පලකර තිබෙනු දැකීම ඔහුට මහත් ප්‍රීතියකි.





කියවීමට බැරිවුවත් තමාගේ ඡායාරූපය පලවී තිබීම නිසා ඔහු පුවත්පත් කිපයක්ද මිලදී ගත්තේය.

වැනිලා සුරුට්ටුව උරමින් දුම්ගුලි ඉහලට අරිමින් ඔහු පුවත්පත් එකින් එක ගනිමින් තම ඡායාරූප දෙස බලමින් ප්‍රීති වුනේය.

එක් දිනක් ඇතුලත තමා ප්‍රසිද්ධ පුද්ගලයකු බවට පත්වූ අන්දම කල්පනා කරත්ම ඔහුගේ සිතට නැගුනේ අධික සොම්නසකි.

සදානාදන් නැවතී සිටි බෝඩිම තිබුණේ පුංචි බොරැල්ලේ සියලු ශුද්ධවන්තයින්ගේ දේවස්ථානයට මදක් නුදුරිනි. ඒ පරිසරය රෑ බෝවන විට බෙහෙවින්ම පාලු ස්වභාවයක් උසුලයි. බෝඩිමේ ඉන්නා අනෙක් ලිපිකරුවන් දෙදෙනා චිත්‍රපටයක් බැලීම සඳහා පිටතට ගොස් සිටි බැවින් බෝඩිමේ ඉතිරිව සිටියේ සදානාදන් පමණි.

පුවත්පත දෙස බලමින් ප්‍රීතිවන සදානාදන්ට හිටිහැටියේම පිටුපසින් ශබ්දයක් ඇසෙන්නාක් මෙන් දැනුනෙන් ඔහු වහාම පස්ස හැරී බැලුවේය. එහෙත් කිසිවෙක් පෙනෙන්නට නොසිටියෙන් හෙතෙම ඒ ගැන නොතකා නැවතත් පුවත්පත දිගහැර කියවන්නට පටන් ගත්තේය.

ගෘහයේ ඉදිරිපසින් නැවතත් කවුදෝ පියවර තබන්නාක් මෙන් ඇසුනෙන් සදානාදන් මෙවර පත්‍රය බිමතබා නැගිට ගත්තේය. බෝඩිමේ ඉන්නා කලු බලල් තඩියා තම කාමරයට රිංගා ගන්නට තැත් කරනවා ඇතැයි සිතූ ඔහු ඌ පලවා හරින්නට මෙන් ජනේලය ලඟට සමීපවී ජනෙල් පොලු අල්ලා ගෙන පිටතට එබිකම්කර බැලීය.

ජනේලය ඉදිරිපිටවූ සේපාලිකා ගසයට කලු සෙවනැල්ලක් මෙන් යමෙකු සිටිනවා දුටුවෙන් සදානාදන් හිගැස්සී වඩාත් ඕනෑ කමින් ඒ දෙසට බැල්මක් හෙලීය.

අඳුර තුට්ටි කඩා ගැන්මට තරම් බියකරුය. එහෙත් සේපාලිකා ගසයට සිටි තැනැත්තාගේ දෙනෙත් අඳුර විනිවිද දිලිසෙන්නට විය. සෙවනැල්ලක් මෙන් පෙනුනු ඒ පුද්ගලයා කලු දිග කබායක් ඇඳ හිස වැස්මක් පැලඳ සිටියේය.

සදානාදන් වහාම මේසය මත තිබූ විදුලි පන්දම ගෙන සෙවනැල්ල තිබූ දෙසට එල්ල කලේය. දෙවියනේ ඔහුගේ ගත පුරා මවිල් කෙලින්වී හදවත වේගයෙන් ගැහෙන්නට විය.

ඒ මුහුණ ඔහුට මතකය. එය අමතක කරන්නට ඔහුට පුලුවන් කමක් නැත්තේය. තමාගේ ඡායාරූපය මේ පුවත්පත් වල ප්‍රසිද්ධ වීමට මුල්කාරයාවූයේ මේ තැනැත්තාය. වැසිදා රාත්‍රියේ කඩිමුඩියේම වේයන්ගොඩට ටිකට් පතක් මිල්දී ගෙන ඉතුරු මුදල්ද දමාගිය මගියා මොහුය. තමා පොලීසියට කීවේ මේ පුද්ගලයා ගැනය. එහි අබමල් රේණුවක වැරැද්මක් සිදුවන්නට නුපුලුවන.

මේ තැනැත්තා පැමිණ සිටින්නේ තමාගේ හොඳකට නම් නොවේ. ඒ බව ඔහුගේ බිහිසුණු මුහුණෙන්ම පිලිබිඹුවේ. සදානාදන් බියෙන් වෙව්ලමින් ආපසු හැරී කාමරය තුලට යන්නට සූදානම් වනවාත් සමගම සේපාලිකා ගසයට සිටි මිනිහා ගොරෝසු හඬින් ආමන්ත්‍රණය කරන්නට විය.





''සදානාදන් උඹ හරි හපන් කමක්නෙ කරලා තියෙන්නේ ? අඳුරේ සිටි මිනිහා විචාලේය.

ඒ කටහඬ ඇසෙන විටත් සදානාදන්ගේ කටේ කෙල සිඳීගියාක් මෙන් විය. ඔහුගේ ජීවිතයටම සියොලඟ ලොමු දැහැගැන්වෙන මෙවැනි බියකරු දර්ශණයක් නම් දැකලා තබා හිතලාවත් නැති ඒ කටහඬින් බියට පත් සදානාදන්ගේ දත් දෙපල එකට ගැටෙන හඬත් සකල ශරීරය වෙව්ලන ආකාරයෙනුත් පෙනෙයි.

කලු අවතාරයක් මෙන් සිටි මිනිසා තවත් අඩි කීපයක් ඉදිරියට ආවේය. කලු හිස්වැස්මෙන් මුහුණ අඩක් ආවරණය කරගෙන සිටියද දෙනෙත් කෙවෙනිවලින් පනින්නට තරම් මහත් කරගෙන තමා දෙසට එන රූපය දකිත්ම සදානාදන් පණබියෙන් ගැහෙන්නට විය.

මිනිහා මදක් නැවතින. ඊලඟට ඔහු කතා කලේය.

''මිත්‍රයා මට විරුද්ධව සාක්ෂි කීමට නුඹට තබා දහසක් නෙත් ඇති ශක්‍රයාටවත් බැහැ. ඉතින් මා ගැන පොලිසියට ගිහින් ඔත්තු දෙන හැම කෙනෙක්ම මගේ ලැයිස්තුවට එක් වෙනවා. සදානාදන් දැන් ඉතින් එදා රෑ දැක්ක මිනිහා ගැන උඹ ඊලඟට කියන්නෙ මොනවද ?'' සරදම් හඬින් විමැසූ මිනිහා මහ හඬින් සිනාසෙන්නට වූයේය.

සදානාදන්ගේ උගුරකට වියලී ගොස් තිබූ බැවින් කතාකර ගැනීමට තරම් ශක්තියක් ඔහුට නොමැති විය. යමක් නොකියා එක්වරම මෙතැනින් ඉවත්වී ගෙතුලට පැනගන්නට ඇත්නම් කොයිතරම් හොඳදැයි ඔහුට කල්පනා විය. එහෙත්

මේ බියකරු පුද්ගලයා දැන් තමා දෙස බලා සිටින හෙයින් එතරම් පැන ගෙතුලට දුව ගැනීමට නොහැකිය. එසේ දුවන විට ඔහු වෙඩි තැබුවොත් ? ඒ බිය ජනක හැඟීම නිසා සදානාදන් කල්මරන්නට වූයේය.

අවතාරයක් වැනි ඒ බියකරු පුද්ගලයා නැවතත් කතා කරන්නට වූයේය. මෙවර ඔහුගේ කටහඬ පෙරටත් වඩා උස්ය. තේජාන්විතය. එහි සාවඥ ස්වරයක් මුසුව තිබුණි.

"මොකද? සදානාදන් නුඹ වැලපෙන්නේ ? බලාපන් උඹ පොලිසියට ඔත්තු කියන්න ගිය වෙලාවේ කොයිතරම් ධෛර්යයෙන් හිටියද ? බලපන් උඹ ඔය පත්තර වල ඉන්නේ කොයි තරම් සන්තෝෂයෙන්ද? හෑ හෑ පුදුමයි. උඹ මා දැක්ක හැටියේ මලම්ණියක් මෙන් සුදුමැලිවුණේ ඇයි ? පිරිමියෙක් වගේ මට මුහුණ දියන් සදානාදන්. දැන් උඹ ඉදිරියේ ඇවිත් ඉන්නේ උඹට සොයන්න උවමනා කරන මිනිහා තමයි. ඔව් මුළු ලංකාවේම මිනිස්සු අස්සක් මුල්ලක් නැර ලුහුබඳින්නේ මා පසුපස්සෙනුයි. මාව අල්ලා දෙන අයට තෑගි ලැබෙනවා. මම ඒ තෑග්ග උඹටම ලබාදෙන බලාපොරොත්තු වෙනුයි මේ තකහනියක්ම ආවේ. වරෙන් වරෙන් සදානාදන් ඇවිත් මාව අල්ල ගනින් අල්ලා පොලිසියට බාරදී තෑග්ග ලබා ගනින්."

සදානාදන් යමක් කියන්නට සූදානම් විය. එහෙත් ඔහුගේ තොල්පොටවල් වේගයෙන් සැලෙන්නට වීම නිසා වචන උච්චාරණය වූයේ මහත් අපහසුවකිනි.

"මම නුඹව අල්ලා දෙන්න අදහස් කලේ "

එහෙත් ඔහුට ඊට වඩා යමක් කතා කිරීමට නොහැකිවූයේ අපරාධකාරයාගේ කටහඬ ඔහුට බාධාවක් වූ බැවිනි.





"නීචයා වහපන් කට මම ආවේ නුඹේ කට සදහටම වසා දමන්නටයි. ඔව්! මැරිච්ච මිනිසුන්ට සාක්ෂි කියන්න බැරි බව මා දන්නවා" කී හෙතෙම නිමේශයක් ගතවන්නට මත්තෙන් සදානාදන්ගේ පපුවට රිවෝල්වරයක් එල්ල කලේය. වෙඩි උණ්ඩ ඔහුගේ පපුව පසා කරගෙන යන්නටත් ප්‍රථමයෙන් දුම්රිය දෙපාර්තමේන්තුවේ ලිපිකරුවා මළවුන් අතරට ගොස් අවසානය.

වෙඩි උණ්ඩ වැදීමෙන් ඔහුගේ පපුව සුණු - විසුණු වී ගොස් තිබුණි. පපුව මැද කුහර තුනකි. ඒවායෙන් මස් වැදලි එල්ල වැටෙන්නට විය. ලේ පැල්ලම් සුදු හුණු ගාන ලද බිත්තියටද ඉසී තිබුණි.

වෙඩි හඬ කන්බිහිරි කරවන තරම් බිය ජනකය. ඉන් තිගැස්සුණු බෝඩිමේ අයිතිකාර මිසිස් සිල්වා නමැති ගැහැණිය කාමරය දෙසට දුව එන්ම දුටු දර්ශණයෙන් ඈ එක් වරම මුව අයා ගත්තාය.

"දෙවියනේ මේ අපරාධය කලේ කවුද ?"යි අසමින් ඈ අසල්වැසියන් කැඳවීමට විලාප හඬ නගන්නට වූවාය.

මොහොතක් ගතවන්නට මත්තෙන් අසල්වැසියන් රැස්වූහ. එහෙත් කිසිවෙක් සදානාදන් මැරී සිටි කාමරය තුලට අඩියක් තියන්නට පවා බිය වූයේ මෙය අභිරහස් අපරාධයක් බව දන්නා බැවිනි. සදානාදන් නමැති මේ ද්‍රවිඩ ජාතික තරුණයා සම්බන්ධ ප්‍රවෘත්තියක් අද පුවත්පත් වල පලවී තිබීමත් ඔහුගේ මරණයත් අතර ඉතාම කිට්ටු සම්බන්ධ කමක් ඇතිබව කවුරුත් වටහා ගත්හ.

පොලිසිය පැමිණ මූලික පරීක්ෂණ පැවැත්වූ නමුදු මොහුට වෙඩි තිබ්බේ කවුදැයි සොයා ගැනීමට අදාල වන

කිසිම හෝඩුවාවක් දැන ගත නොහැකි විය. කවුරුන් හෝ වේවා මොහුට වෙඩි තබන්නට ඇත්තේ ගිල්මන් සමරසේකර මැරූ තැනැත්තාම විය යුතුයයි පොලිස් නිලධාරීන් ඒත්තු ගත්හ.

පොලිස් නිලධාරීන් සදානාදන්ගේ මෘත දේහය ගැන ඉතා නිපුණ පරීක්ෂණයක් කල නමුදු මිණීමරුවා හඳුනා ගැනීමට හෝ ඔහු ගැන ඉඟියක් පලකැරෙන අල්පමාත්‍ර ආරංචියකුදු සොයාගැනීමට නොහැකිවීමෙන් බලාපොරොත්තු සුන්කර ගත්හ.

පොලිස් නිලධාරීන් මෙවැනි අසරණ තත්වයකට වැටී සිටින අතර රහස් පරීක්ෂක ප්‍රභා රෙක්ස් නමැති බල්ලාගේ ආධාරයෙන් මරණය ගැන යමක් සොයා ගැනීමට අදහස් කලාය.

විශ්මයකි සදානාදන් නැවතී සිටි බෝඩිමට ඇතුල් වන ගේට්ටුවෙන් ඇතුලට පොලිස් බල්ලා ගැනීම කිසිසේත් කල නොහැකි දෙයක් විය. ඔහු යමකට බියවූවාක් මෙන් ආපසු දුවන්නට මෙන් දඟලන්නට වූයේය. බල්ලා මේ අන්දමට හැසිරෙන්නේ කලාතුරකින් බැවින් ප්‍රභාද මවිතයට පත්වූවාය.

අධිකරණ වෛද්‍ය නිලධාරියාද මේ අවස්ථාව බෝඩිම තුල සිටිය බැවින් බල්ලාගේ නොසන්සුන් තාවයට හේතුව තේරුම් ගත්තේය. බල්ලා මෙසේ හැසිරෙන්නේ මිණීමරුවා විසින් ගෙවත්තේ ඉසින ලද විෂ මිශ්‍ර කුඩු වර්ගයක් නිසාවෙනි. ඒ විෂ සහිත කුඩ බල්ලාට කොහෙත්ම ඔරොත්තු නොදෙන සුලුය.

එසේ නම් මිණීමරුවා මේ වරත් නීතියෙන් බේරී පලාගොස් තිබේ. ප්‍රභා හිස ගිණි ගත්තකු මෙන් කල්පනා සාගරයේ කිමිදෙන්නට වූවාය.



සදානාදන් මරා දැමීමෙන් පසු පොලිස් නිලධාරීන්ට එක් කරුණක් පැහැදිලි වශයෙන්ම තෝරා බේරා ගැනීමට හැකිවිය. එනම් ගිල්මන් සමරසේකර මරාදමන්නට ඇත්තේ එදා රාත්‍රියේ කඩිමුඩියේම දුම්රියෙන් ගමන් ගත් අද්භූත මගියා බවයි. ඔහු සදානාදන් මරා දැමුවේ තමා හඳුනාගෙන ඇත්දැයි යන සැකයෙනි. මේ සිද්ධිය නිසා අන් කිසිවෙක් යමෙක් දැනගෙන සිටියද ඔත්තුදීමට පොලිසියට නම් නොපැමිණෙන බවද පොලිස් නිලධාරීන් තේරුම් ගත්හ.

එහෙත් සදනාදන්ගේ මරණය සිදුවූදා රාත්‍රියට පසුවදා උදේ අටට රහස් පරීක්ෂක ප්‍රභාගේ කාර්යාල කාමරය තුලට පිවිසියේ ඇසිලින් නමැති අභිසාරිකාවයි. උදාසන පුවත්පත් වල සදානාදන් ඉතා සැහැසි අන්දමින් මරා දමනු ලැබ ඇති බව පලවී තිබුණද ඇසිලින් ඒ බවක් නොදත්තාය. ඇ කලින් ඒ බවක් දන්නේ නම් කවදාවත්ම තමා දුටුදේ ගැන කීමට පොලිස් කාර්යාලය කරා බඩ ගාන්නේ නැත. අනුන්ගේ දේවල් ගැන හාරා අවුස්සන්නට යාමෙන් තමාගේ ජීවිතයද හානිකර ගැනීමට ඇයට උවමනාවක් නැත.

ඇසිලින් තමා වැසිදා රාත්‍රියේ දුටු සියල්ල රහස් පරීක්ෂක වරියට විස්තර කර දුන්නාය. විශේෂයෙන්ම ප්‍රභා ඇසූ ප්‍රශ්න වලට ඈ නොපැකිල පිලිතුරු දුන්නාය. ප්‍රභා ඇගෙන් වැඩිපුර ප්‍රශ්න කලේ මිනිසාගේ හැඩ හුරු කමත් කතා විලාශය ගැනත්ය.

''මිනිසා උසයි. ඇස් දෙක නම් ලොවි ගෙඩි දෙකක් මෙන් රතු පාටයි. මහ ගොරෝසුවෙක් හිතක් පපුවක් අනුකම්පාවක් නැති එකෙක් නොවන පාටයි. ඒ මිනිහා මා දිහා රවපු වෙලාවේ මූනේ කැපිච්ච කැලලක් තිබෙනවා දැක්කා.''

එහෙනම් ඒක අපට ලැබුණු හොඳම - වැදගත් ආරංචියක්. ? හොඳයි ඔය මිනිහා ආයෙමත් දැක්කොත් ඇසිලින්ට හඳුනා ගන්න පුලුවන්ද. ?''
ඔව් නෝනා හඳුනන්න පුලුවනි. නමුත් ඒ මිනිහා ආයෙමත් මට මූණ ගැහෙන්න ඒවි යයි හිතන්න අමාරුයි.''

''එහෙම හිතන්න එපා. ඔබ අපට දැනුම් දුන්නු දේවල් අපි පුවත්පත් වල් ප්‍රසිද්ධ කරනවා. එතකොට මිනිහා ගැන දන්න කෙනෙක් ඉන්න පුලුවනි.''

ඇසිලින් තම කායර්‍ාලයෙන් පිටවෙනවාත් සමගම ප්‍රභා තම සහයක නිලධරීන් දෙදෙනකුට කතා කොට ඇය ලුහුබඳින ලෙස නියම කලාය.

''ඉක්මන් කරලා අර යන ගෑණිව පලෝ කරනවා. කොයිතරම් අමාරුකම් තිබුණත් ඇයව ආරක්‍ෂා කිරීම අපේ යුතුකමක්. ඇගේ ප්‍රකාශය පුවත්පත් වල පලවූ හැටියේම මිණීමරුවා ඇවත් මරා දමන්න එන්න පුලුවනි. ඒ නිසා ඇගේ ආරක්‍ෂාවට අප කටයුතු කරන්න ඕනෑ.''

රහස් පරීක්‍ෂකයින් දෙදෙනා ඇසිලින්ගේ සෙවනැල්ලමෙන් පිටුපසින් ගමන් කරන්නට වූහ. ඇ ප්‍රධන පොලිස් කාර්යාලයේ සිට ට්‍රොලි නැවතුම් පොල දක්වා පයින්ම අවුත් මිනිත්තු කීපයක් පෝලිමට වී සිටියාය. බොරැල්ල බලා යන ට්‍රොලියක් පැමිණිවිට ඇ කඩිමුඩියේම එහි නැග ගත්තාය.

රහස් පරීක්‍ෂකයන් දෙදෙනාද ඇයට නුදුරු අසුන් වල වාඩි ගත්හ.





මරදාන දක්වා ට්‍රොලියෙන් ගමන් කල ගැහැණිය මරදානේ පොලීසිය ඉදිරිපිට නැවතුම් පොලෙන් බැස දුම්රිය පොල දෙසට ගමන් කරන්නට වූවාය. මේ පරිසරය ඇගේ කෙලිබිමය තම වෘත්තිය සරුවට කරගෙන යන ජය භූමිය මේ පරිසරය බැවින් ඇ තමාට සුපුරුදු තිප්පොලක් අයිනේ නතර වූවාය.

රහස් පරීක්‍ෂකයින් දෙදෙනාද ඇයට නොදැනෙන්න ඒ අසලම ගැවෙසෙමින් කාලය ගතකරන්නට වූ නමුදු තමා රහස් පොලිස් නිලධාරීන්ගේ තීක්‍ෂණ නෙත් වලට ලක්වී සිටින බව ඇසිලින් නිකමටවත් නොසිතුවාය.

එදා සවස පුවත්පත් වල ගණිකාව දුන් පුවත් ලොකු අකුරින් පලකර තිබුණි. ඒ පුවත පලවෙත්ම මහජනයා මුහුණේ කැපුන පැල්ලමක් ඇති සැකකරුවෙකු ගැන සැලකිලිමත් වෙන්නට වූහ.

ඇඳිරි වැටීගෙන එන්නට විය. අඳුර දෙවියන්ට බිය නොවූ මිනිසුන් ක්‍රියාකාරී වන කාලයයි. සොරුන් මංකොල්ලකරුවන් හා දුශ්චරිතයේ යෙදෙන්නවුන් ලුහුසුලුව ක්‍රියාත්මක වන්නේ අඳුර තදින් බලපවත්වන කාලයටය. මරදානේ ගණිකාවන්ද ජැන්ඩියට හැඳ පැලඳගෙන තම තිප්පොලවල් වලට වී අනුග්‍රාහකයන් එනතුරු බලාපොරොත්තුවෙන් බලා ඉන්නේ මේ කාලවේලාවන් හිදිය.

ඇසිලින් ලා රෝස පැහැති හැට්ටයකින් හා ඊට ගැලපෙන සාරියකින් සැරසී මරදානේ දුම්රිය පොල ඉදිරිපිට පදික වේදිකාවට යමෙකු පැමිණෙනතුරු බලා ඉන්න කාන්තාවක් මෙන් බලා සිටියාය.

සී. අයි. ඩී. නිලධරින් දෙදෙනා ඇසැලින් සමග වරින් වර කතා කල උදවිය ගැන විමසිලිමත්වූ නමුදු ඇ දන්න හඳුනන සාමාන්‍ය අය මිස අමුත්තන් නොවන බව ඇ කතා කල ආකාරයෙන්ම තේරුම් ගත්හ.

මරදානේ ඔරලෝසු කණුවේ හත වැදෙනවා ඇසිණ. ඒ සමගම පැමිණි පියට් වර්ගයේ මෝටර් රථයක් ඇසිලින් සිටි තැනට මදක් දුරින් නැවතිණ මෝටර් රථය ටැක්සියකි.

ටැක්සියේ රියදුරා වීදුරු කවුලුව තුලින් හිස මැත් කොට පිටතට එබිකම්කර බැලීය අනතුරුව අතක් එලියට දමා ඇසිලින්ට සංඥාවක් කරනු පෙණින.

ටැක්සියේ නොම්මරය 1 ශ්‍රී 4444

තමාට වාසියක් ලැබෙන්නට යන බව සිතූ ඇසිලින් පියවර ඉක්මන් කරමින් ටැක්සිය දෙසට ගොස් රියදුරා සමග කතාවට වැටුනාය. රහස් පරීක්ෂකයන් දෙදෙනා ඇයට නොදැනෙන්නට ඒ අසලට වී කතාවට සවන් දීගෙන සිටියාය.

ටැක්සි රථයේ රියදුරා ඇ දන්නා හඳුනන තැනැත්තෙකි. ඔහුගේ රථයෙන් ඇ නොයෙක් වතාවල ගමන් බිමන් ගොස් පලපුරුදු ඇත්තේය.

"කොහේටද විල්සන් ?" ඇසිලින් ප්‍රශ්න කලාය

"හයිලෙවල් පාරට"

"කවුද මිනිහා ලෝභයෙක්ද?"





"අපොයි නැහැ බං හොඳ වැදගත් මහත්තයෙක් ගජ පොහොසතෙක් හැඩයි. වරෙන් වරෙන් නැගපන්."

ඇසිලින් ටැක්සිය තුලට ඇතුලුවනවාත් සමග රියදුරා එක් වරම රිය වේගයෙන්ම ආපසු හරවා ගත්තේය. ඉන්පසු හෙතෙම මරදානේ හන්දියෙන් හරවා පංචිකාවත්ත පාර ඔස්සේ ධාවනය කරන්නට විය. මේ දුටු සී. අයි. ඩී. නිලධරින් දෙදෙනාද ටැක්සි රථයකට අත වනා ඊට ඇතුලුව පංචිකාවත්ත පාර ඔස්සේම ගමන් කරන්නට වූහ. ඇසිලින් ගමන් ගත් රථය ඔවුන්ට වඩා විනාඩි කීපයකට පෙරටුවගමන් කල බැවින් පෙනෙන තෙක් මානයේ නොවීය. එහෙත් සී. අයි. ඩී. නිලධරින් දෙදෙනාට ඒ ටැක්සියේ නොම්මරය හොඳට මතකය. එය 1 ශ්‍රී 4444 පියට් වර්ගයේ රථයකි. රථය නොපෙනුනත් එය වැඩි දුරක් නොයන බව දත් නිලධාරීන් දෙදෙනා එය අතර මගදී මුණ ගැසෙන බලාපොරොත්තුව ඇතිවම ගමන් කලහ. පුදුමයකට මෙන් ටැක්සි රථය අතුරුදහන් විය. ටැක්සිය කොතැනක හෝ අඳුරු මුඩුක්කු පාරක් තුලට වදින්නට ඇතැයි සිතූ නිලධාරීන් දෙදෙනා කනස්සලු සිතින් රථයෙන් බැස ආපසු ගමන් ගන්නට වූහ.

ඇසිලින් පසුපස ලුහුබඳින්නට අණ ලැබී තිබුනද මෙවැනි ගැහැණුන්ගේ ගමන් බිමන් ගැන හොඳින් දන්නා නිලධරීන්ට ඇය පසුපස ගමන් කිරීම විහිලුවකට කාරණාවකි. එමෙන් ඇය දැන් කැඳවා ගෙන ගියේ ඇය හා ඇසුරු කොට පලපුරුදු කාරයෙකු බැවින් අනතුරක් සිදුවන්නට ඉඩක් නැතිබව ඔවුන් ඒත්තු ගත්හ.

## 05

ප්‍රභා මහනුවර පොලිස් ස්ථානයට ටැලිෆෝන් මගින් කතාකොට නාරද වීරසිංහ නැමැත්තෙකු ගැන වහාම විස්තර සොයා දන්වන ලෙස දන්වා සිටියාය. ප්‍රධාන පොලිස් කාර්යාලයෙන් ලැබුණ හදිසි පණිවුඩයක් නිසාවෙන් පැය දෙකක් ගතවන්නට මත්තෙන් ඇයට පිලිතුරක් ලැබිණ. ''නාරද වීරසිංහ මහනුවර සැලකියයුතු වැදගත් පවුලක කෙනෙක් මිස් ප්‍රභා. ඔහු අද උදේ කොළඹ ගිය බව අපට ගෙදරින් දැනගන්නට ලැබුණා. හොඳයි ඔබට ඔහු ගැන තවත් දැනගන්නට උවමනා මොනවද ?''

''ඒ තැනැත්තා ආපසු මහනුවරට එන්නේ කොයි වේලාවේද?''

''අද රෑම ඔහු එන්න නියමිතයි.''

''හොඳයි! මට ඉතාම වැදගත් පරීක්ෂණයකට අදාලවන කරුණු වගයක් දැනගැනීමට ඔහුගෙන් ප්‍රශ්න කරන්නට උවමනා වෙලා තියෙනවා. ඒ නිසා මම හෙට උදේ පාන්දරම මහනුවරට එනවා මිනිහා ගරන සෙවිල්ලෙන් ඉන්න ඕනෑ තේරුණාද ?''

''ඕ - කේ - මිස් ප්‍රභා''





සමරසේකර මැතිණිය දූන් ලොකුවිටුවත් රැගත් ප්‍රභා පසුවදා උදෑසනම තම මෝටර් රථය පදවන්නට වූවාය. ඈ රිය පැදවීමෙ දක්ෂතාවයක් ඇති තරුණියකි. පැය දෙකහමාරක් ගතවන්නට මත්තෙන් ඈ තම මෝටර් රථය මහනුවර පොලිස් ස්ථානය ඉදිරියේ නවත්වා ඉන් බැස ගත්තාය.

මහනුවර පොලිස් ස්ථානයේ අධිපති ඉන්ස්පෙක්ටර් ධර්මරත්නගේ ආධාර ඇතිව ප්‍රභාට නාරද වීරසිංහගේ නිවසට ලඟා වීමට හැකි විය. ඈ එහි ගොඩ වදින විට නාරද ඔහුගේ නිවසේ සිටියේය.

නාරද අවුරුදු තිහක් පමණ වයස් වූ කඩිම රූසපුවකින් හෙබි තරුණයෙක් බව ප්‍රභාට පෙනුණි. ඔහුගේ පෙනුම නම් ඉතා විනීත වැදගත් කෙනෙකු ලෙස පෙනුන නමුදු කෙනෙකුගේ පිටස්තර පෙනුමෙන් චරිතය මැනීම තරම් ප්‍රභා මෝඩියක් නොවූවාය.

නාරද ඉතා කාරුණික අන්දමින් ප්‍රභාටත් ඉන්ස්පෙක්ටර් ධර්මරත්නටත් අසුන් ගන්නා ලෙස ඇයද සිටියේය. ඔවුගේ ඉල්ලීමට එකඟවී අසුන් ගත්හ.

නාරද මහත් පුදුමයට පත්වූවාක් මෙන් ඉන්ස්පෙක්ටර් දෙස බලා කතා කරන්නට විය.

''ඉන්ස්පෙක්ටර් මට පුදුමයි ඊයේ නිලධාරීන් දෙන්නෙක් ඇවිත් මා ගැන තොරතුරු අහගෙන ගියාය කියලා මට ආරංචියි. මම ඊයේ ගෙදර හිටියේ නැහැ. බිස්නස් කටයුතු වගයකට කොළඹ යන්න මට සිද්ධ වුනා. හැබැටම මොකක්ද ඔබලාට මගෙන් කෙරෙන්න ඕනෑ.''

නාරද වීරසිංහ මහනුවර ප්‍රදේශයේ වැදගත් රදල පරපුරකට අයත් තරුණයෙක් බව කලිනුත් සඳහන් කල බව ඔබට මතක ඇතුවාට නිසැකය. ඉන්ස්පෙක්ටර් ධර්මරත්න වීරසිංහ පරපුර ගැන හොඳින් දන්නෙකි. එබැවින් ඔහු තරුණයා දෙස සිනහවක් පාමින් ප්‍රභාගේ මුහුණ බැලුවාය.

ප්‍රභා තරුණ නාරද දෙස හෙලුවේ විමසිලිමත් බැල්මකි. ඉන්පසු ඈ මෙතෙක් වේලා රැකි මෞන ව්‍රතය බින්දාය.

''මිස්ටර් වීරසිංහ ඔබ ගිල්මන් සමරසේකරගේ මිත්‍රයෙක්ද?'' ඈ ප්‍රශනයක් නැගුවාය.

තරුණියගේ ප්‍රශ්නයෙන් නාරද තිගැස්සුනේය. ඒ බව ඉන්ස්පෙක්ටර් ධර්මරත්නටත් ප්‍රභාටත් මැනවින් පෙනී ගියේය. ගිල්මන්ගේ නම කියවනු ඇසෙත්ම මෙතෙක් වේලා තරුණයාගේ මුහුණේ තිබූ උද්යෝගී භාවය එකවරම අතුරුදහන් වී ගියේය. ඒ වෙනුවට සැකයත් සන්තාපයත් පිලිබිඹුවූ බව අනෙක් දෙදෙනා තේරුම් ගත්හ.

''ගිල්මන් - අපොයි ඔව්... මම ඔහු හඳුනා ගත්තේ පාසල් යන කාලේ පටන්. නමුත් ඔහුගේ හදිසි අකල් මරණය අසා මම බොහොම දුක් වුනා. අවුරුදු ගණනාවකට පස්සේ මුණගැහුනදා රාත්‍රියේම ඔහුට කවුදෝ සාහසිකයෙකු අතින් මැරුම් කන්නට සිදු වුනා. අනේ දෙවියනේ'' කී හෙතෙම තරුණිය දෙස විමසිලිමත් බැල්මක් හෙලීය. ''මේ මිසිස් ගිල්මන් වෙන්න ඕනෑ?'' අනතුරුව ඉන්ස්පෙක්ටර් ධර්මරත්න ගෙන් ඇසීය.

''නැහැ මිස්ටර් වීරසිංහ. ඒ අපේ ක්‍රයිම් ඔපිස් එකේ රහස් පරීක්ෂක වරියක්.'' ධර්මරත්න සිනහමුසු මුහුණෙන් යුතුව කිවේය.





''ඕ - මට සමාවෙන්න මම හිතුවේ මේ මිසිස් ගිල්මන් කියලයි. - ඔබේ නම ?'' ඔහු තරුණියගෙන් විමැසිය

''මගේ නම ප්‍රභා මිස්ටර් නාරද ගිල්මන් ගැන වැදගත් ආරංචි රාශියක් ඔබෙන් දැනගන්න මට ඕනෑ කරනවා.''

''මොන විදියේ ආරංචිද මිස් ප්‍රභා ?'' නාරද විමැසිලිමත් භාවයෙන් ඇසීය.

''ඔහුගේ මරණය සිදුවනදා සවස ඔබට ගිල්මන් මුණ ගැහුණා නේද? ඒ මුණ ගැසුන අවස්ථාවේ ඔබ දෙදෙනා අතර දීර්ඝ සාකච්ඡාවක් ඇතිවුනා. ඒ පැරණි ප්‍රේම සම්බන්ධයක් ගැන එහෙම නේද ?''

''සත්තකින්ම ඔබ මේ කරුණු දන්නේ කොහොමද ? ඔය කතාව අපි දෙදෙනාටම පමණක් සීමාවූ දෙයක්.''

''නැහැ මට තවත්කෙනෙකුගේ මාර්ගයෙන් දැන ගන්නට ලැබුනා.''

''පුදුමයි මන් හිතන හැටියට ඒ කතාව ගැන කරුණු දන්නේ අපි තුන්දෙනා විතරක්ය කියලයි.''

ඈ නිහඬව බලාසිටියාය.

''ඒ කියන්නේ ගිල්මනුත් මාත් ඒ මැරුණ මානෙලුත් පමණක් කියලයි.''

එහෙම හිතනවා නම් වැරදියි මිස්ට නාරද. මිසිස්

සමරසේකර ඒ ප්‍රේම ශෝකාන්තය ගැන මට කරුණු පැහැදිලි කලා. ඔවුන් දෙදෙනා අතර තිබූ ප්‍රේමය ඇයට රහසක් නොවෙයි. ගිල්මන් සියලුම තොරතුරු ඇයට කලින් දන්වා තිබෙනවා.''

නාරද සුසුමක් හෙලීය. ''දෙවියනේ එහෙනම් මිසිස් සමරසේකරට කේන්ති ගිහින්.''

ප්‍රභා හිස වැනුවාය. නාරද වීරසිංහ වෙනින් යමක් අදහස් කරගත් බව ඇයට වැටහුනාය. එහෙත් ඔහුගේ අහිංසක භාවය ඇයට පිළිගත නොහැකිය. දක්ෂ අපරාධකාරයකුට මුහුණුවර කිහිපයකින් හා දිවවල් රාශියකින් කතා කිරීමේ දක්ෂතාවයක් තිබේ.

''මිසිස් සමරසේකර ගිල්මන්ගේ ප්‍රේම සම්බන්ධයක් තිබූ බව දැන ගත්තේ විවාහවී සතියකිනුයි. ඒ නිසා ඒක ඇගේ පුදුමයටවත් කේන්තියටවත් කාරණයක් නොවෙයි.''

''මම හිතුවේ මේ බව කිවාම ඇයට කේන්ති ගිහින් තවත් කලබලයක් සිදුවුනාවත්ද කියලායි.''

''අපොයි නැහැ.''කී රහස් පරීක්ෂකවරිය. තම අත් බෑගය විවෘත කර එහි තිබූ ලොකැට්ටුව ගෙන නාරදගේ අතේහි තැබුවාය.

''මිස්ටර් වීරසිංහ මෙන්න මේ ලොකැට්ටුව අයිති කාටදැයි ඔබට කියන්න පුලුවන්ද?''

නාරද වීරසිංහ ලොකැට්ටුවේ පියන ගැලවීය. එහි තුල තිබෙන ඡායාරූපය දකිත්ම ඔහුගේ මුහුණ නැවත වරක් මලානිකවී යනු පෙනින.





ඔහුට නොදැනුවත්ම ඔහුගේ දෙනෙතින් ගැලූ කඳුලු බිඳුවක් කම්මුල දිගේ ගලාබසින්නට විය. තරුණයා මහත් උද්යෝගයකින් යුතුව පිළිතුරු දෙන්නට විය.

''ඇත්තෙන්ම මිස් ප්‍රභා මේවා දකිනකොට මගේ හිතට හරිම වේදනායි.''

''මගේ හිතට යවුලකින් අනින්නාක් මෙන් දැනෙනවා. ඇගේ අහිංසක මුහුණ - ඒ සොම්බර හිනාව දකිනකොට මගේ පපුව පැලෙන්න එන්නාක් මෙන් දැනෙනවා. අයියෝ මගේ හිත පාරන්න මේවා තව තවත් පෙනෙන්නේ ඇයි. ඔව් මේ ලොකැට්ටුව අයිති මානෙල්ට මට අද වගේ මතකයි. ඇ විශ්ව විද්‍යාලෙට එන දවස්වල මේ ලොකැට්ටුව කරේ බැඳ ගෙන ආ හැටි... ඔව්... ඇ මේ ලොකැට්ටුව ගිල්මන්ට තෑගි කල බව මා සමග කිව්වා. ඇගේ ප්‍රේමයේ සංකේතයක් වශයෙන් තබා ගන්නැයි ගිල්මන්ට දුන් ලොකැට්ටුව මෙයයි. මට අඳුනන්න පුලුවනි. ඔහු කැලඹිගිය චිත්තියෙන් යුතුව පැවසීය.

''බොහොම හොඳයි මිස්ටර් වීරසිංහ. මට මේ මිය ගිය මානෙල් කියන තරුණියගේ දෙමව්පියන් මුණගැසීමට පුලුවන්ද? ඔවුන් මුණගැසීමට ඔබ අපට උදව් කරනවාද?

''සත්තකින්ම ඔව්. ඔවුන් හමුවීමට යාමෙන් අහිංසක ගිල්මන්ව මරාදාපු අපරාධකාරයා අල්ලා ගැනීමටආධාරයක් වෙනවා නම් මම ඕනෑම මහන්සියක් වීමට සතුටුයි.''

නාරද වීරසිංහගේ ආධාර ඇතිව මියගිය තරුණියගේ දෙමව්පියන් මුණගැසෙන්නට ගිය ප්‍රභාට මානෙල් ගැන සාමාන්‍ය විස්තරයකට වඩා වැඩිපුර යමක් දැනගත නොහැකි

විය. තම දුවණියගේ අකාල මරණය ගැන විමසීම ඔවුන්ට දැරිය නොහැකි වේදනාවක් විය.

රහස් පරීක්ෂක වරියට දැනගැනීමට අත්‍යවශ්‍ය වූයේ නාරදත් මියගිය තරුණියත් අතර ප්‍රේම සම්බන්ධ කමක් තිබුණිද යන්න එලිදරව් කරගැනීමය. එසේ තිබුනා නම් ගිල්මන්ගේ ඛේදජනක - අභිරහස් මරණයට හේතුව නිරායාසයෙන්ම අනාවරණය වන්නේය.

එහෙත් ඒගැන කල්පනා කිරීමේදී තවත් වැදගත් ප්‍රශ්නයක් මතුවෙයි. ඔවුන් දෙදෙනා අතරේ ප්‍රේම හැඟීමක් හට ගෙන තිබුනා නම් තරුණිය සිත්වේදනාවෙන් අකාලයේ මියගියේ මන්ද ?

සමහරවිට තරුණිය ඔහුට ප්‍රේම නොකලා විය හැකිය. ඇයට නොදැනුවත්වම නාරද ඇ කෙරෙහි ආලයෙන් පසුවන්නට ඇති. එවිට ඇගේ හදවත උදුරාගෙන සිටින ගිල්මන් කෙරෙහි ඊර්ෂ්‍යාවක් ඇතිවීම පුදුමයට කාරණයක් නොවේ. කිසියම් හේතුවක් නිසා ගිල්මන් වෙන විවාහයක් කරගත් බැවින් මානෙල් ප්‍රේම සන්තාපයෙන් වෙලී මානසික පීඩනයෙන්ම මිය යන්නට ඇති. නාරදගේ බලාපොරොත්තු සියල්ල පුන් විය. ඇගේ මරණයට මූලික හේතුව ගිල්මන් කල ද්‍රෝහිකම බව දන්නා නාරද සිද්ධිය අමතක වී යනතුරු කල්මරා ගිල්මන්ගෙන් පලිගත්තා යයි සිතිය නොහැකිද? ප්‍රභා මේ අභිරහස අනාවරණය කරගැනීමේ අපේක්ෂාවෙන් අවුල්වුණු නූල් බෝලයක් දිග හරින්නාක් මෙන් එකින් එක විග්‍රහ කරමින් කල්පනා කරන්නට වූවාය.





# 06

දින තුනක් ගතවූ නමුදු ට්‍රන්ක් පෙට්ටියේ අයිතිකාරයා එය ලබා ගැනීමට දුම්රිය පොලට නොපැමිණියේය. එය නානුඔය දුම්රිය පොලට ලැබුණේ දින දෙකකට පෙරය. **සිරිල් අත්තනායක - දුම්රිය ස්ථානාධිපති බාරේ - නානුඔය** යන ලේබලය ට්‍රන්ක් පෙට්ටියේ ලියා අලවා තිබූ නමුදු එය භාර ගැනීමට සිරිල් අත්තනායක කෙනෙක් තබා කිසිවෙක් නොපැමිණියේය.

තුන්වන දිනයද ඉකුත්වී හතරවන දිනයට උදාවිය. එහෙත් වෙනදා මෙන් නොව එදා මුලු දුම්රිය පොලේම සිටි සේවකයන් නැහැය හකුලුවා ගෙන මහත් අප්‍රසන්නතාවයෙන් කාලය ගත කරන්නට වූහ. ඒ දුර්ගන්ධය වහනය වූයේ දුම්රියෙන් ගෙනෙන බඩු බාහිරාදිය ගබඩාකර තබන පාර්සල් කාමරය දෙසිනි.

දුම්රිය ස්ථානාධිපති තැන පෝටර් කෙනෙකුට කතා කරමින් ඉවසිය නොහැකි මේ දුර්ගන්ධය හමන්නේ කොහෙන්දැයි සොයා බලන ලෙස දැන්විය.

පෝටර් තැන බලවත් පිලිකුලෙන් යුතුව පාර්සල්

කාමරයට පියවර තැබීය. එහි ඇතුළුවූ සැනකින් ඔහු නාසය වසාගෙන එළියට දුවගෙන ආවේය. ආ හැටියේම වමනය කරන්නට පටන් ගත්තේය.

පෝටර් තැන වමනය කර අවසානවත්ම දුම්රිය ස්ථානාධිපති මහතා ඔහුගෙන් ඊට පිළිතුරු විමැසීය.

''අපොයි සර් ඔය කුණු ගඳ එන්නේ අර පාර්සල් කාමරේ තියෙන ට්‍රන්ක් පෙට්ටිය ඇතුලෙන්. ඒ ට්‍රන්ක් පෙට්ටියෙන් ඔජස් ගලායනවා. මොනවහරි මාලු කුරියෙක් වත් ඒක ඇතුලේ නැම්බිලා ඇති මෙච්චර ගඳ ඒකයි.

''මේ ට්‍රන්ක් පෙට්ටිය පාර්සල් කරලා තියෙන්නේ කොළඹ කොටුවෙන්. නමුත් අයිතිකාරයා ඒක ලබාගන්න තවම ඇවිත් නැහැ. නමුත් අපිට තවත් මේ ගඳ ඉවසන්නට බැහැ දැන් ඉතින් ට්‍රන්ක් පෙට්ටිය පාර්සල් කාමරයෙන් ඉවත් කරන්නයි. අපිට සිද්ධ වෙන්නේ. මේ ගඳ උහුලන්න බැහැ. පෝටර් ඒක උස්සගෙන ඇවිත් අන්න අර මාලු පෙට්ටි දාන කාමරෙන් දාලා ගෝනි තුන හතරකින් වහල දාපන්. අයිතිකාරයෙක් ඉන්නවා නම් එන දවසක ඇවිත් ගෙනියන දවසකුත් ඇති නොවැ.'' දුම්රිය ස්ථානාධිපති තැන මහත් නොසතුටු ලීලාවෙන් පැවසුවේය.

පෝටර් තැන තම ප්‍රධානියාගේ අණ ඉටු කිරීම සඳහා හිතට දිරිගෙන යලි පාර්සල් කාමරය තුලට ඇතුලු වූයේය. කාමරය නිල මැස්සන්ගෙන් පිරී පැවතිණ. ඔහු කුණුවූ මාලු පෙට්ටි ඕනෑ තරම් දැක පලපුරුදු ඇතත් මේ තරම් දුර්ගන්ධය හමන මාලු ගඳක් නම් ආඝ්‍රහනය කර නැත.





එය මාලු කුණු ගඳකට වඩා මළමිනී කුණුවී ගිය ගඳකට සමාන බව ඔහුට දැනින. ඔජස් බිම දිගේ ගලා යමින් තිබුණි. නිලමැස්සන් පොර කමින් ට්‍රන්ක් පෙට්ටිය මත රොක් වෙමින් සිටිනවා පෙනින.

දුර්ගන්ධය බලවත් බැවින් නාසය ලේන්සුවකින් බැඳගත් පෝටර් තැන මහත් උත්සාහයකින් පසුව ට්‍රන්ක් පෙට්ටිය ඔසවා එළියට ආවේය. එය උස්සා ගැනීමට නොහැකි තරම් බරය. එහෙත් තම අධිපතියාගේ අණ ඒ හැටියටම ඉටුකිරීම තම යුතුකම බැවින් බලවත් පිළිකුලෙන් වුවද ට්‍රන්ක් පෙට්ටිය ඔසවාගෙන අවුත් මාලු පෙට්ටි දමන කාමරය තුලින් තැබීය.

ට්‍රන්ක් පෙට්ටිය ඒ මේ අතට පැද්දීම නිසා දුගඳ දස ගුණයකින් අධිකවූ බව කාටත් වැටහිණ. ඔවුන් නාස් හකුලුවා ගෙන සැකමුසුව එකිනෙකාගේ මුහුණ බලන්නට වූහ.

මෙවැනි ගඳක් - ඉවසිය නොහැකි මේ තරම් පිළිකුල් දුගඳක් හමන්නට වූ ප්‍රථම අවස්ථාව මෙය බැවින් දුම්රිය ස්ථානාධිපති තැනද ට්‍රන්ක් පෙට්ටිය ගැන තව දුරටත් සෝදිසි කර බැලීමට ඉටා ගත්තේය.

ඔහු හරමානිස් නමැති සේවකයාට කතා කොට ට්‍රන්ක් පෙට්ටිය විවෘතකර බලන ලෙස නියම කලේය.

''හරමානිස් මොනවා වුනත් මේ පෙට්ටිය මෙතෙනම තිබෙන්නට ඉඩ හැරියොත් අපි හැමෝටම මහ විපත්තියකට මුහුණ දෙන්න වෙනවා. මා ඉදිරියේදී මේ පෙට්ටිය විවෘත කරපන් විරුද්ධකමක් ඇතිවුනොත් මම ඒ ගැන බලා ගන්නම්.''

හරමානිස් මුලත් විටක් හපාගෙනම ට්‍රන්ක් පෙට්ටිය ලගට කිට්ටු විය. එහි පියන කුඩා ඉබ්බෙකු දමා වසා තිබෙන බව දුටු හෙතෙම අඬුවක් ගෙන ඉබ්බා කඩා දැම්මේය.

ඉන් පසු හෙතෙම අගුලු ඔසවා ට්‍රන්ක් පෙට්ටියේ පියන විවෘත කලේය.

දෙවියනේ - එහෙමත් දුර්ගන්ධයක්. දුගඳ ඉවසන්න නොහැකි වූයෙන් සියල්ලෝම දෑත් වලින් නාස් වසා ගත්හ.

හමා එන දුර්ගන්ධය ඉවසිය නොහැකි වුවද ට්‍රන්ක් පෙට්ටිය තුල තිබූ දෙය දකින්ම හරමානිස්ගේ ඇස් උඩුකුරුවී ගියාක් මෙන් දැනුනේය. ඒ - හිරිකිත - බිහිසුණු දර්ශණය දකින්ම හරමානිස් ක්ලින්තවී ගියාක් මෙන් පසෙකට ඇලවුනේය

ට්‍රන්ක් පෙට්ටිය තුල තිබුණු බිහිසුණු දේ දකින්ම දුම්රිය ස්ථානාධිපති තැනගේද ශරීරයේ මවිල් කෙලින්වී ගියේය. උගුර කට වියලී ගියෙන් කිසිවක් කතාකර ගැනීමට නොහැකිවූ හෙතෙම භ්‍රාන්තවී බලා සිටියේය.

ට්‍රන්ක් පෙට්ටිය තුල තිබුණේ මළකඳකි. මළකදේ හිස කපා වෙන්කර කලු කඩදාසියකින් ඔතා තිබුණි. අත්පා වෙන් වෙන් වශයෙන් කපා ට්‍රන්ක් පෙට්ටිය තුල මනාව තැන්පත් කර තිබුණි.
එය ගැහැණියකගේ මල සිරුරක් බව දුම්රිය ස්ථානාධිපති තැන වටහා ගත්තේය.

දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවයට බැඳී අවුරුදු විසිතුනක් ගෙවී තිබුණු නමුදු දුම්රිය ස්ථානයකදී මෙවැනි



බිහිසුණු දෙයකට මුහුණපාන්නට සිදුවූ ප්‍රථම අවස්ථාව මෙය බැවින් දුම්රිය ස්ථානාධිපති තැන හොඳටම බිය විය. මෙය අබිරහස් මිනීමැරුමක් බව වටහාගත් හෙතෙම වහාම ටැලිෆෝන් මගින් පොලිස් ස්ථානයට දන්වා සිටියේය.

අධිකරණ වෛද්‍ය නිලධාරියා ඇතුලු පොලිස් නිලධාරීන් රාශියක්ම අවුත් ට්‍රන්ක් පෙට්ටියේ තිබූ මළසිරුර එලියට ඇද මළකඳ පරීක්ෂාකර බලන්නට පටන් ගත්හ. මැරී දින කීපයක් ගතවීම නිසා හිස නැති කඳ හොඳටම ඉදිමී හම පැලී යාමට ආසන්න වූවාක් මෙන් පෙණින. සිරුරේ කපා කොටනු ලැබූ තැන් වලින් ඔජස් ගලා යමින් තිබුණි.

එය ගැහැණියකගේ මළ කඳකි.

හිස එතූ කලු කඩදාසිය ඉවත් කරන ලදි. මුහුණ බලන්නට හිරිකිතය. බිය එලවන සුලුය. ඇගේ එක් ඇසකට උලක් වැනි තියුණු අයුධයකින් ඇනීම නිසා ඇස දොට්ට පැන තිබුණේය. දොට්ට පැන තිබූ ඇසින් - නාස්පුඩු වලින් - හා මුව දෙපැත්තෙන් මළමිනී ඔජස් වැගිරෙන්නට විය.

ගැහැණිය අවුරුදු තිහකට වැඩි විය නොහැකි බව අධිකරණ වෛද්‍යවරයා මද වේලාවක් පරීක්ෂාකර බැලීමෙන් පසුව සඳහන් කලේය. බෙල්ල මිරිකා හුස්ම හිර කිරීමෙන් මරණය සිදුවී ඇති බවත් ඉන්පසු ශරීරය කැබලිවලට වෙන්කොට ට්‍රන්ක් පෙට්ටිය තුල බහා පාර්සල් කර ඇති බවත් කෝරනර් තැන ප්‍රකාශ කලේය.

නැවතත් මළකුණ ට්‍රන්ක් පෙට්ටියේ තැන්පත් කල පොලිස් නිලධාරීන් එය තව දුරටත් පරීක්ෂකර බැලීම සඳහා

කොළඹ මිනී කාමරයට ගෙන යාම සඳහා වහාම කටයුතු පිළියෙල කරන ලදී.

කොළඹ මිනී කාමරයට ගෙනෙනු ලැබූ කුණු වන මළකඳේ හිසත් කඳත් එකට ලංකරනු ලැබීය. අනතුරුව මේ භයානක අපරාධය අනාවරණයකර ගනුවස් මළ ගැහැනියගේ පුවත දිනපතා පුවත්පත් වල ප්‍රසිද්ධ කරනු ලැබීය.

**"ට්‍රන්ක් පෙට්ටියේ නාඳුනන ස්ත්‍රියකගේ මළ කඳක්."** යන මාතෘකාව යටතේ සෑම පුවත් පතකම පලවී තිබුණු ඒ බියජනක ආරංචියෙන් මුළු රටම කැලඹී ගියේය. එය මීට පෙර සිදු නොවූ විරූ අන්දමේ බියජනක මරණයකි. මෙවැනි මිනීමැරුම් බහුලව කෙරෙන්නේ අමෙරිකාව ආදී අපරාධ සංඛ්‍යාව අතින් ඉහල ගිය රටවල පමණි. එහෙත් ලංකාවේත් එවැනිම දෙයක් කර තිබීම කාගේත් පුදුමයට හේතු විය.

කොළඹ මෘතාගාරයේ තිබෙන මේ නාඳුනන ගැහැණියගේ මළසිරුර හඳුනා ගන්නා හැටියට පොලිසියෙන් ආයාචනයක් කර තිබුනෙන් මහජනයා වැල නොකැඩී බොරැල්ලේ මිනී කාමරය කරා ඇදී එන්නට වූහ.

නැතිවුන සහෝදරියක් ගැන තැවෙන සහෝදර සහෝදරියන් හිටි හැටියේම ගෙදරට නොකියා ගිය බිරියන් පිට ප්‍රදේශවල දූ වරුන් සිටින දෙමව්පියන් බලවත් සැකයෙන් යුතුව මිනී කාමරයේ සිමෙන්ති පඩියක් මත හොවා තිබූ මළමිනිය දෙස බලාගත්වනම සිටිය නමුදු ඒ කාගේ කවුදැයි හඳුනාගත නොහැකිව බලාපොරොත්තු කඩ කරගෙන ආපසු ගියාහ.





එහෙත් මළකඳ මෘතාගාරයට ගෙනවුත් පැය විසි හතරක් ගත වන්නට මත්තෙන් මරදානේ ජදික වේදිකාවේ වෙළදාම කරන පීරිස් අයියා නමින් හඳුන්වන තැනැත්තා මේ ස්ත්‍රිය තමාට හඳුනා ගැනීමට පුලුවන් බව ප්‍රකාශකර සිටියේය.

රහස් පරීක්‍ෂකවරිය - ප්‍රභා පීරිස් නැමැත්තා පසෙකට කැඳවාගෙන ගොස් ප්‍රශ්න කරන්නට පටන් ගත්තාය.

"මේ මළකඳ නමුසෙට ඒකාන්ත වශයෙන්ම හඳුනන්නට පුලුවන්ද ? පුලුවන් නම් ඒ ගැන දන්නා තොරතුරු කියන්න එහෙම නැතුව දෙගිඩියාවෙන් අඳුනා ගත්තොත් මහා කලබලයක් සිදුවෙන්න ඉඩ තියෙනවා. අර කඩුගන්නාවේ මරා දමා තිබුණු තරුණියගේ මළකඳ වරදවා හඳුනාගෙන අපට මහා කරදර රාශියකට මුහුණ දෙන්න සිද්දවුනා."

පීරිස් නමැත්තා පරීක්‍ෂකවරියගේ මුහුණ බලමින් මහත් උනන්දුවකින් පිළිතුරු දෙන්නට විය.

"නෝන මහත්මයා මට මේ ගැනිව හඳුනන්න බැරි නම් මගේ ඇස් මට විශ්වාස කරන්න බැහැ. මේ ගෑණි නිතර දෙවේලේ උදේ හවස මට මූණ ගැහෙනවා. මේකිගේ නම ඇසිලින්. ඈ හොඳ චරිතයක් ඇති ගෑණියෙක් නොවෙයි."

ප්‍රභා තිගැස්සුනාය. පදික වෙළෙන්දාගේ මුවින් තරුණියගේ නම කියවෙනවාත් සමගම ඈ තුෂ්නිම්භූතවූ චක් මෙන් භ්‍රාන්තවී බලා සිටියාය. එසේ නම් මිනීමරුවා හිතුවාටත් වඩා ඉක්මණින්ම ක්‍රියාත්මකවී තිබේ.

එහෙත් මේ ඒ ගැහැණිය දැයි ඇයට තවමත් පුදුමයකි.

තමා ඉදිරි පිටට ඇවිත් සාක්ෂි දුන් ඒ ගැහැණියගේ මුහුණ මලමිනියේ මුහුණ හා සසඳා බලන්නට උත්සහ කල නමුදු ඇයට කිසිසේත් එය කල නොහැකි විය.

පීරිස් යලි කතා කරන්නට වූයේය. "ඇසිලින් අර කවුදෝ මහත්තයෙක් මරාදාල ගිය මිනිහා දැක්කාය කියලා විස්තරයක් පත්තරේ පලකරපු දවසේ ඉඳල අතුරුදහන් වුනා වගෙයි. ඈ දවස් දෙක තුනක් නොපෙනෙන්න වුනාම මට සැකයක් ඇතිවුනා. අර පත්තරවල ප්‍රසිද්ධ වී තිබුණු මිනීමරුවා ගැන ඔත්තු කියාපු මහත්තයෙක් මීට ඉස්සර වෙලාත් මරාදාලා තිබුණ නිසා ඇසිලින්ටත් ඔය ටිකම වෙන බව මගේ හිත නිතරම මට වද කරන්න පටන් ගත්තා. වැඩි කාලයක් නොගිහින් එදාම ඈට මේ අපරාධය වෙලා තියෙනවා අයියෝ කාලකන්නි ගෑණි."

මිනීමරුවා රහස් පොලීසියටත් වඩා වේගවත් පියවරක් ගෙන තිබේ. රහස් පොලිසිය යමක් කිරීමට සංවිධානය වන අතර මිනීමරුවා එය ඉව වැටුනාක් මෙන් අඩි කීපයක් ඉස්සර වී තමාට එරෙහිව තිබෙන හැම දෙයක්ම විනාශකර දමා තිබේ. ඇසිලින්ගේ මරණයද එවැනිම එකකි.

එදා ඇසිලින් පසුපස ලුහුබඳින්නැයි අණ දුන් රහස් පොලිස් භටයන් දෙදෙනා කැඳවූ ප්‍රභා බලවත් කොපයකින් ඔවුන් අමතන්නට වූවාය. ඔවුන්ට නියම කරනු ලැබූ කාර්‍ය අතපසු කිරීම නිසා මිනී මැරුමේ තවත් වැදගත් සාක්ෂිකාරියක් මලවුන් අතරට ගොස් තිබේ. මිනීමරුවා දැක ඇතැයි කියන දෙදෙනාම දැන් මරා දමා ඇති බැවින් පොලීසියේ දූර්වල කම් ගැන මිනීමරුවා දැන් කොක් හඬලා සිනාසෙනු ඇතැයි සිතූ ප්‍රභා නිලධාරීන් දෙදෙනාට තරවටු හඬින් කතා කරන්නට වූවාය.





"තමුසෙල කර තියෙන්නේ නීතිවිරෝධී වැඩක්. මට මේ සම්බන්ධව රිපෝට් කලා නම් දෙදෙනාම පැය විසි හතරක් ඇතුලතදී දිස්මිස් කර දමන එක සහතිකයි. නමුත් මම තමුසෙලාට තව ටිකක් අනුකම්පා කරන නිසා ඉවසනවා. තමන්ට නියම කල පරීක්ෂණය ඒ හැටියටම පැවැත්වීම තමා නියම රහස් පරීක්ෂකයෙකුගේ යුතුකම. අද ලංකාවේ අපරාධ වැඩිත් ඒවා නොවිසුඳුන අපරාධ ගණයෙහිලා වැටෙන්නෙත් පොලිස් පාලනයේ දුර්ලකම නිසයි. ලංකාවේ හැම පොලීසියකම වාර්තා සටහන් පොත් අරගෙන බලමු. අපරාධ සියයක් වෙලා තිබෙන බවට පැමිණිලි තිබුණත් ඒවායින් විසඳී ඇත්තේ සියයට තුනක් හෝ හතරක් පමණයි. අනෙක් සියලුම දේවල් විසඳුනේ නැති අභිරහස් හැටියටම තිබෙනවා. නමුත් ස්කොට්ලන්ඩ්යාඩ් වැනි ආයතනවල ඉන්නා නිලධාරීන් එහෙම නොවෙයි. තමන්ට නියම කල පරීක්ෂණ කොතරම් බැරෑරුම් බිය ජනක වුවත් ඔවුන් ජීවිතය පවා නොතකා ඒ ගැන පරීක්ෂණ පවත්වනවා. යම්කිසි මිනීමැරුමකට අදාල වන තැනැත්තෙක් වසන්වෙලා ඉන්නා බව දැනගත් විට ස්කොට්ලන්ඩ්යාඩ් ආයතනයේ හොඳින් පුහුණුව ලැබූ නිලධාරීන් ඒ තැනැත්තා අල්ලා ගැනීමට ඔත්තු සොයනවා. ඒ ඔත්තු අනුව යන ඔවුන්ට ඈත පිටිසර ගම්මාන වලට පවා යන්න සිදුවෙනවා. ගම්මාන පමණක් නොවෙයි. පිටරට වලටත් යාමට සිදුවෙනවා. අපරාධකාරයා ගැන කිසියම් හෝඩුවාවක් ඉව වැටුනාම ඒ රහස් පරීක්ෂක නිලධාරීන් ඔහු අල්ලා ගැනීමේ පරමාර්ථයෙන් තම ජීවිත පවා පරිත්‍යාගයෙන් කටයුතු කරනවා. ඔවුන් අපරාධකාරයාට හිතවත්කම් දක්වන ගැහැණුන් සමග පවා අනියම් සබඳකම් ඇතිකර ගන්නවා. හිඟන්නන් මෙන් අන්ධයන් මෙන් ශාස්ත්‍රකරුවන් වගේ වෙස් වලාගෙන ඇවිදිනවා. පිස්සන් වාගේ උමතුවෙන් කියවමින් අම්බලන්වල නිදියනවා. ඔවුන් ආපසු එන්නේ ඒ අපරාධකාරයන් අතට මාංචු ලාගෙන මිස නිකම් නොවෙයි. නමුත් තමුසෙලාට

නම් කියාපු වැඩෙන් කරන්න කම්මැලියි. ලංකාවේ රහස් පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ඉන්නේ පුහුණුවක් නොලැබූ පොලිස් දෙපාර්තමේන්තුවේ ඉන්නා දක්ෂ අය අතුරෙන් තෝරාගනු ලැබූ ටික දෙනෙක් පමණක් බව මා පිලිගන්නවා. පුහුණු වූ අය ඉන්නේ සියයට කෙනෙක් හෝ දෙන්නෙක් පමණයි. ඒ කෙසේ වුවත් තමුසෙලාගේ ප්‍රමාදය නිසා මිනීමැරුමක වැදගත් සාක්ෂිකාරියක් අපට නැතුව ගියා.'' යි ප්‍රභා දීර්ඝ දේශනයක් පවත්වමින් කීවාය.

රහස් පරීක්ෂක භටයින් දෙදෙනාගේ නෙත් බිමට යොමුවී තිබුණි. ඉන් එක් තැනැත්තෙක් පමණක් ප්‍රමාදයට හේතු දක්වන්නට විය.

''මිස් ප්‍රභා අපි ඒ ගැණි පලෝ කරගෙනම හිටියා. නමුත් හවස් වුනායින් පස්සේ තමයි අපට ඇව මග හැරුනේ.'' ''ඒ කොහොමද ? ඇ හිටි හැටියේම අතුරුදහන් උනාද ?

''නැහැ මිස්. මෙන්න මේකයි සිද්ධ වුනේ. ඇ අඳුරන ටැක්සිකාරයෙක් ඇවිත් ඇව කාරෙකේ දාගෙන යන්න ගියා. අපි ටැක්සියකට නගින කොට ටිකක් ප්‍රමාද වුනා. ඒ ප්‍රමාදයෙන් ඇ මග හැරුනා.''

''අනේ දෙවියනේ ටැක්සියේ නොම්මරය බලාගත්තෙවත් නැද්ද? ඇ මරා දමන්නට ඇත්තේ මේ ටැක්සිකාරයා වෙන්න ඕනෑ?''

''අපි ඒ නොම්මරේ ලියා ගත්තා. 1 ශ්‍රී 4444 පියට් වර්ගයේ කාර් එකක්. ටැක්සිකාරයාගේ නම විල්සන්.''



පැය භාගයක් ගතවන්නට මත්තෙන් 1 ශ්‍රී 4444 නොම්මරය දරණ ටැක්සියේ රියදුරා පොලිස් අත්අඩංගුවට ගනු ලැබීය. රහස් පොලිස් නිලධාරීන් ඔහු සොයමින් යන විට විල්සන් විහාරමහාදේවි උද්‍යානයේ ඉදිරිපස ටැක්සි රථය නවතා එහි තුලට වී නිදා සිටියේය.

පොලිස් අත්අඩංගුවට ගනු ලැබූවිට විල්සන් හොඳ තරමට බියවී සිටියේය. තමා දෙපස සිටින රහස් පොලිස් නිලධරින් දෙස යටහත් බැල්මක් හෙලූ ඔහු තමාගේ නිර්දෝෂත්වය ගැන කරුණු කියමින් කන්නලව් කරන්නට විය. තමා අත්අඩංගුවට ගත්තේ කුමන හේතුවක් නිසා දැයි විල්සන් තවමත් නොදන්නේය.

අයියෝ සර්. මගේ අතින් නම් මේ වනතුරු කිසිම හදිසි අනතුරක් සිද්ධවෙලා නැහැ. මම එලවන්නේ බොහොම පරිස්සමෙන්. මට වරෙන්තු මොකුත් ඇත්තෙත් නැහැ. ටැක්සි එලවන්න පටන් ගත්ත දවසේ ඉඳලා මම කිසිම මාර්ග නීතියක් කඩලා නැහැ.'' යි කී විල්සන් මෝටර් රථ පැදවීමේ බලපත්‍රය දිගහැර නිලධාරීන්ට පෙන්වා සිටියේය.

නිලධාරීන් තමන්ට මොහු අත් අඩංගුවට ගැනීමට උවමනා කලේ කුමන හේතුවක් නිසාදැයි ඔහුට නොදැන් වූහ.

''හා ඒ ගැන කියලා දැන් ඇති වැඩක් නැහැ. උඹ තොත්ත බබෙක් වෙන්නද හදන්නේ මිනිහෝ. වරෙන් වරෙන් අපිත් එක්ක හෙඩ් ක්වාටර්ස් වලට ගියාම තේරේවි අපට උඹ අල්ලගන්න ඕනෑ වෙලා තිබුණේ මොකටද කියලා.''

විල්සන් පොලිස් කාර්යාලයට ගෙනයනු ලැබීය. රහස්

පරීක්ෂකයන් පිරිසක් විසින් වටකරනු ලැබූ ඔහු ගෙන් ප්‍රභා ප්‍රශ්න කරන්නට වූවාය. ඇසිලින්ගේ නම කියැවෙන විට ඔහු පුදුමයෙනුත් පුදුමයට පත්විය. ඇසිලින් මියගොස් ඇතැයි දැනගත් හැටියේම ඔහු එය විශ්වාස ගත නොහැකිවාක් මෙන්ම නෙත් අයාගෙන බලා සිටියේය.

"විල්සන් මීට දවස් පහකට ඉස්සර වෙලා ඇසිලින් එක්ක ගමනක් ගියා නේද ? ප්‍රභා විල්සන් හිඳ ගැනීමට අසුනක් පෙන්වමින් ඇසුවාය.

"ඔව් නෝනා. මම ඇසිලිනුත් එක්ක නිතර ගමන් ගිහින් පුරුදුයි. එදා මහත්තයෙක් කියාපු නිසා" ඔහු අනෙක් හරිය සම්පූර්ණ කරන්නට චකිතයෙන් වටපිට බලන්නට වූවාය.

"කියාපන් කිසිම දෙයක් හංගන්නේ නැතුව. කියාපන් මේක මිනීමැරුමකට සම්බන්ධ බරපතල කාරණයක්.

"එදා මරදානේ හන්දියේදී මට මහත්තයෙක් මුණ ගැහුනා. මහත්තයා ඇසිලින්ව පෙන්නලා කිව්වා ඒ ගැනිව එයාට මුණ ගස්සන්න කියලා. මට පගාවකුත් දුන්නා. නමුත් මහත්තයා එතන හිටියේ නැහැ. එයා කිව්වා මට ඇසිලිනුත් එක්ක දිවුල්ගස් හන්දියට එන්න කියලා. මම ඒ මහත්තයා කියාපු හැටියටම කලා. ඇසිලිනුත් එක්ක දිවුල්ගස් හන්දියට යනකොට මහත්තයා ලයිට් කණුවකට මුවාවෙලා අපි එනතුරු බලා හිටියා. ආ හැටියේම මගේ ටැක්සි ගාස්තුවත් වැඩිපුර මුදලකුත් දීලා ඇසිලින්ව බස්සාගෙන තවත් කාරෙකට නැගුනා."

"ඒ මහත්තයා උඹ කලින් අඳුනනවාද ?"





"නැහැ"

"එහෙනම් ඔය තරම්ම උඹ ඒ මිනිහා වෙනුවෙන් මහන්සි වුනේ මොකද ?"

"එහෙම තමයි නෝනා ඔය රස්සාවෙ හැටි. ඔහොම තමයි ඔය වගේ වැඩ වලින් වැඩිපුර පගාවක් හොයාගන්න පුලුවන් බව දන්න නිසා තමයි ටිකක් මහන්සි වුනේ."

ප්‍රභා හිස සලමින් කල්පනා කරන්නට වූවාය.

මද වේලාවකට පසු ඈ යලිත් ප්‍රශ්න කරන්නට වූවාය.

"ඒ මහත්තයාගේ හැඩ හුරුකම උඹට කියන්න පුලුවන්ද? විල්සන් මේක මිනීමැරුමක් බොරු කියන්න උත්සහ ගන්න එපා. බොරුකිව්වොත් ඇසිලින්ගේ මරණේ ගැන එල්ලුම් ගස් නගින්න වෙන්නේ උඹටයි. ඒ නිසා ඇත්තම ප්‍රකාශ කරන්න උත්සහ ගනින්." තරුණිය රියදුරාගේ හිතට භීතිය ඇතුලු කරවමින් පැවසීය.

"නෝනා මන් කිව්වේ සම්පූර්ණ ඇත්ත. එදා රැයින් පස්සේ තව වෙනතුරු මම ඇසිලින්ව දැක්කේ නැහැ" රියදුරා අහිංසක භාවයෙන් කීය.

"ඉතින් නුඹට ඇසිලිනුත් එක්ක හයර් යන්න හම්බු වෙන්නෙ නැහැ. ඇගේ බෙල්ල කපාදාලා මළකඳත් බෙල්ලත් ට්‍රන්ක් පෙට්ටියක දාලා එවලා."යි ප්‍රභා සඳහන් කලවිට රියදුරා ඈ කීදේ පිලිගත නොහැකිවාක් මෙන් දෙනෙත් විදහාගෙන ගල්ගැසී බලා සිටියේය.

රියදුරු විල්සන් වෙත පොලිස් බල්ලාද ලංකල නමුදු ඉන් පලක් නොලැබිණ. රෙක්ස් ඔහු දෙස නිකමට හෝ බැලුවේවත් නැත කොතරම් කාලයක් ගියත් අපරාධකරුවකුගේ ඉව ඇල්ලීමට පොලිස් සුනඛයා දක්‍ෂයෙකි. මේ මිනීමරුවාට විල්සන්ගේ සම්බන්ධකමක් නැතිබව එයින් කාටත් වැටහිණ.

ගිල්මන් සමරසේකර මිනීමැරුම විසඳෙනවා වෙනුවට දිනෙන් දිනම අවුල් ජාලයක් බවට පත්වෙයි. මිනීමරුවා දැක ඇතැයි සාක්‍ෂි කීමට ඉදිරිපත් වූ අහිංසකයන් දෙදෙනෙක්ම දැන් මරු වසඟට පත්ව තිබේ. පුවත්පත් හා මහජනයා පොලීසියේ උදාසීන භාවය ගැන දොස් පවරන්නටත් තදින් විවේචනය කරන්නට පටන් ගත්තෙන් මුලු මහත් පොලිස් දෙපාර්තමේන්තුවම මිනීමරුවා ඉදිරියේ අසරණ භාවයට පත්විය.

ගිල්මන් සමරසේකරගේ මිනීමැරුම වසන් කිරීම සඳහා තවත් මිනීමැරුම් දෙකක් කර තිබේ. එබැවින් මෙය මෙතැනින්ම කෙලවරකට පත්වේ යයි සිතිය නොහැක.

රහස් පරීක්‍ෂක ප්‍රභා මේ අභිරහස් අනාවරණය කිරීමට නොහැකිව කණස්සල්ලෙන් පසු වූවාය. මේ අපරාධය එලිදරව්කොට මිනීමරුවා නීතියට ගෙනවුත් දඬුවම් පැමිණ වීමට ඇගේ බලවත් අධිෂ්ඨානය කොතරම් දැයි කීවොත් ඇ රහස් පරීක්‍ෂක ඩිකී වීරකෝන් හමුවට ගොස් ඇගේ පරීක්‍ෂණයට හවුල්වී උදව් කරන ලෙස ඉල්ලා සිටියාය.

ලංකාවේ රහස් පරීක්‍ෂකයන් අතර සක්විති රජ මෙන් වැජඹෙන සාජන්ට් වීරකෝන්ට ප්‍රභාගේ ඉල්ලීම අහක දැමිය නොහැකි විය. මේ දිනවල ඔහු කඩුගන්නාවේ හැට එක්වැනි කණුව අසල මරා දමා තිබූ තරුණියගේ මිනීමැරුම් නඩුව





ගැන වෙහෙසෙන බැවින් වෙනත් කටයුතු වලට ඇඟිලි ගැසීමට තරම් කාලවේලාවක් ඔහුට නොවිය. කාලය ඔහුට රත්තරන් වලටත් වඩා අගනේය. කොතරම් කාර්‍ය බහුල වුවත් මේ සුකුමාර මතියගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට ඩිකී කැමති නොවිය.

ගිල්මන් සමරසේකර සදානාදන් හා ඇසිලින් අබිරහස් ලෙස මරා දැමූ මිනිමරුවා ගැන ගතයුතු පියවර කුමක් දැයි ප්‍රභා ප්‍රශ්න කලවිට ඩිකී මඳ වේලාවක් කල්පනා කිරීමෙන් පසු පිලිතුරු දෙන්නට වූයේය.

"මිස් ප්‍රභා අපි දැන් මිනීමරුවා නැවත වරක් ක්‍රියාත්මක කරවන්න ඕනෑ. දැන් ඔහු ඉන්නේ වසන් වෙලා තමා සැම දෙයින්ම නිදහස් පුද්ගලයෙක් හැටියට සිතාගෙන මිනීමරුවා සැනසුම් සුසුම් හෙලනවා ඇති. ඒ නිසා ඔහුගේ හිතට නැවත වරක් භීතිය ඇතුලු කරවන්න ඕනෑ."

ඩිකී වීරකෝන් ප්‍රභාට දුන් උපදෙස් අනුව පසුවදා පුවත්පත් වල විශාල සිරස්තලයක් යටතේ පලකරන ලද ප්‍රවෘත්තියක් විය. එය දුටු හැමෝම භීතියෙන් භීතියට පත්වූහ.

ගිල්මන් සමරසේකර මරා දැමූ මිනීමරුවා ප්‍රථම මිනීමැරුමෙන් බේරීම සඳහා තවත් මිනීමැරුම් දෙකක් සිදුකර ඇති නමුදු ඔහුගේ අවාසනාවට මෙන් අන්තිම මිනීමැරුම කරන අවස්ථාවේදී මරදානේ විල්සන් නමැති ටැක්සි රියදුරකු විසින් හඳුනාගනු ලැබූ බව පුවත්පත් වල පලවී තිබුණි.

සාජන්ට් වීරකෝන්ගේ හැඟීම අනුව මේ ප්‍රවෘත්තිය පුවත්පත් වල පලවූ හැටියේම මිනීමරුවා පෙරටත් වඩා බියට පත් වෙයි. ඊලඟට ඔහු වෙහෙසෙන්නේ ටැක්සි රියදුරා මරා

දැමීමටය. තමා හඳුනාගත්තේ නැතැයි ඔහුට සිතිය නොහැකිය. මිනීමරුවන් දැක ඔවුන්ගේ සිතුම් පැතුම් ගැන දීර්ඝ පලපුරුද්දක් ඇති සාජන්ට් වීරකෝන් මෙ පුවතින්ද මිනීමරුවාට ඇතිවන මානසික විපර්යාසය කොතරම් දැයි නියත වශයෙන් දන්නේය.

"ප්‍රභා අපි මේ සෙල්ලම පටන් ගත්තේ විල්සන්ගේ ජීවිතය පරදුවට තියලයි. පොඩ්ඩක් වැරදුනොත් විල්සනුත් මළවුන් අතරට යන්න ඉඩ තියෙනවා. ඒ නිසා විල්සන්ගේ පසුපස්සේම නිලධාරීන් දෙදෙනෙක් පලෝ කරවන්න ඕනෑ. ඔහුට යමක් වුනොත් ඒ ගැන වග කියන්න ඕනෑ අපි දෙන්නායි"

"මම දැන්මම විල්සන්ගේ ආරක්‍ෂාවට කටයුතු සලසා ඉවරයි සාජන්ට්." ප්‍රභා සැනසිලි සුසුමක් හෙලමින් පැවසුවාය.

නාරද වීරසිංහගේ ගමන් බිමන් කෙරෙහි පරීක්‍ෂාවෙන් පසුවීමට විශේෂ නිලධාරියෙක් පත්කල ප්‍රභා දින දෙකක් ගතවන්නට මත්තෙන් සාජන්ට් වීරකෝන්ගේ උපායෙන්ද මිනීමරුවාගේ එක් උත්සාහයක් ව්‍යර්ථකර දැමීමට සමත් වූවාය.

ටැක්සි රියදුරු විල්සන් බීමට වහල් වූවෙකි. මුලු දවස තිස්සේම කුලී රථය පදවන හෙතෙම රාත්‍රී නමය දහය වන විට බාර් එකකට ඇදෙයි. හොඳ තරමට බීමත්වන ඔහු ආපසු හිඳගත් පුටුවෙන් නැගිටින්නේ කෙලින් හිටගන්නටත් බැරිවන තරමට "ඇඟපත" රත්වූවාට පසුවය.

කොතරම් වෙරිමත් වුවද සුක්කානම අල්ලා ගත්විට මෝටර් රථය කිසිදු හදිසි අනතුරකට භාජනය නොකොට පදවාගෙන යාමේ දක්‍ෂතාවයක් ඔහු සතුය. බීමත් වූවිට ඔහු පෙරටත් වඩා සැලකිල්ලකින් රථය හසුරුවාගෙන පදවයි.





තමාට සුපුරුදු පරිදි විල්සන් එදා රාත්‍රියේද මොන්ටිකාලෝ බාර් එකට ඇතුලු විය. ජින් බෝතල් බාගයක් හා සෝඩා බෝතලයක් ගෙන්වා ගත් ඔහු ටිකින් ටික එය හිස් කරමින් පසුවන්නට විය.

එදා සෙනසුරාදාවකි. මොන්ටිකාලෝව බීමත් ජනයාගෙන් පිරී පැවතින. විල්සන් සිටි මේසයට ඉදිරිපස මේසයේ වාඩිවී සිටියේ ඇෆ්ගන් ජාතික බායියෙකි. දික්වූ රැවුලකින් හා තලප්පාවකින් සැරසී සිටි බායියාගේ දෙනෙත් වරින් වර තනියම සිටි විල්සන් කරා යොමුවනු පෙනින.

බායියා තමාගැන විමසිලිමත්වනු නොදත් විල්සන්ගේ සම්පූර්ණ අවධානය යොමුවී තිබුනේ ජින් වීදුරුව කෙරෙහිමය.

බායියා ටයිගර් බියර් බෝතල් දෙකක් හිස්කර අවසානය. වීදුරු පත්ලේ තිබූ අන්තිම බිඳුවද හිස්කල හෙතෙම සිගරැට්ටුවක් මුව රඳවාගෙන එය දල්වා ගැන්ම සඳහා තමාගේ ඉදිරිපස මේසයේ බොමින් සිටි තැනැත්තා කරා ලඟා විය.

බායියා බිඳුණු සිංහලෙන් කතාකරන්නට වූයේය.

"මාතියා මට ගිනිපෙට්ටිය ටිකකට දෙන්න පුලුවන්ද ?

විල්සන් දෙනෙත් මහත් කොට බායිදෙස බලා හිස සැලීය.

"ඕ ගිනිපෙට්ටියද බායි ?" ඇසූ හෙතෙම කමිස සාක්කුවට අතදමා ගිනිපෙට්ටියක් එලියට ගෙන බායි අත තැබීය.

බායියා සිගරැට්ටුව දල්වා දුම් ගුලියක් කැරකි කැරකී ඉහලට යනසේ හැරියේය. ඉන්පසු ගිනිපෙට්ටිය ආපසු දුන් ඔහු බොමින් සිටි තැනැත්තාත් සමග කතාවට වැටුනේය.

"තමුසෙ බොන්නෙ ජින්ද. ඔහෝ.... මාතියා ඒ බීම බොහොම ෂරයි."

"මොන පිස්සුද බායි. ජින් තමයි පිරිමින්ට කියාපු බීම. හුලං වදින්න වදින්න ඔරේ සූර්."

"නෑ මාතියා. ජින් පපුවට හොඳ නැහැ. එක්කො විස්කි නැත්නම් බියර් ඒවා හොඳා."

"විස්කි ඕ... විස්කි බොන්න අපි ඒ තරම් පෝසත්තු නොවෙයි. බායි තමුසෙලා නම් ගිණි පොලී කාරයෝ. විස්කි නොවෙයි බ්‍රැන්ඩි උනත් බොන්න සල්ලි තියෙනවා."

"හා ඒක නොවෙයි. මා ගණනේ විස්කි අඩියක් ගහන්න තමුසෙ කැමතිද ? මට තනියම බොන්න බැහැ. බොනකොට කතා කරන්න මනුෂ්‍යයෙක් ලග ඉන්න ඕනැ මා ගානේ එක විස්කි අඩියක්."

විල්සන් ඊට විරුද්ධතාවය පල නොකලේය. බායියා අත්පුඩි ගසමින් වේටරයාට කතාකොට විස්කි බාගයක් ගෙනෙන ලෙස දැන්වීය.

බායි විස්කි වීදුරුවක් පුරවා විල්සන් අතට දී තමාද එක් වීදුරුවක් පුරවා ගත්තේය. ඔහු තම අලුත් මිතුරාට සුබ පතමින්ම විස්කි දිව ගාන්නට වූයේය. ක්‍රමයෙන් දෙදෙනාම ටිකින් ටික දොඩමලු වන්නට වූහ.





ප්‍රථමයෙන් කතා කලේ විල්සන්ය.

"බායි තමුසෙ බාර් එකට අමුත්තෙක් වගෙයි. මම හැමදාම මෙහාට එනවා. නමුත් මෙහේදි තමුසෙ දැක්ක පලමු වතාව මෙයයි."

බායියා මුවපුරා සිනාසුනේය. ඔහු සිනාසෙනවිට එක් දත් ඇන්දක දත් කීපයක් අඩුබව විල්සන්ට පෙනුනි. බායි කතාකරන විට ඔහුගේ මුවින් තුලින් "ස්-ස්" යන හඬක් නිකුත්වන බව විල්සන්ට වෙරි මරගාතේ වුවද ඇසෙයි.

"එහෙනම්.... මාතියා. තමුසෙ මාව දකින්නෙ නැති එක පුදුමයක් නොවෙයි. මාත් මෙතනට පුරුදු කාරයෙක්. හැම සෙනසුරාදාකම මම බාර් එකට එනවා. එන්නේ දවාලියෙත් අද මට ණය කාරයෙක් පස්සේ එලවන්න සිද්ධවුනා. ඒක නිසා එන්න රෑබෝවුනා."

"බායිලා රෑට බොනඑක හොඳ නැහැ. තමුසෙලා ලඟ සල්ලි තියෙන විත්තිය හැමෝම දන්නවා ඉතින් බීගෙන යනකොට රස්තියාදුකාරයො එහෙම දැක්කොත් නිකරුනේ කරදර වෙන්න සිද්ධ වෙනවා. දැන් මේ රටේ කිසිම කෙනෙකුට යමක් හම්බ කරගෙන කන්න ඉඩක් නැහැ. මැරවරයෝ මංකොල්ලකාරයො පිරිලා. ගිය සුමානේ මා හඳුනන අහිංසක ගෑණියෙක් මරාදාලා.... දෙවියනේ." කී විල්සන් විස්කි වීදුරුව මුව ලඟට කිට්ටු කරගත්තේය.

"කවුද මාතියා ඔකුන්ට බය. අපි බොන වෙලාවට සල්ලි ගේ ගේනවයැ. මගේත්තෙ බොන සල්ලිත් ටැක්සි කුලියත් පමණයි.

නමුත් මෙහේ මම නාඳුනන අය ඉන්නේ බොහොම ටික දෙනයි. ඒ නිසා මට අරියාදු කරන්න කවුරුවත් නැහැ.''

විල්සන් සිගරැට්ටුවක් දල්වා ගත්තේය. දුම්ගුලියක් ඇදලා හැරිය හෙතෙම ''එහෙම හිතන්න එපා බායි. මේ රටේ හැටියට දැන් කවුරුවත් විශ්වාස කරන්නට බැහැ. ඇයි මතක නැද්ද ගිය සුමානෙ අර කොම්පඤ්ඤ වීදියේ පාලු පාරක මරා දාලා තිබුණු මනුස්සයා. ඒ මනුස්සයා අහිංසක මිනිහෙක් නමුත් අපරාධකාරයින් අතින් මැරුම් කන්න සිද්ධවුනා.''

ඇල්සන් ජාතිකයා විල්සන්ගේ කීම පිළිගත්තාක් මෙන් හිස වැනුවේය.

''තමුසෙගේ කතාවෙන් මට බය හිතුනා. ම් මීට පස්සේ මම රෑට බොන්න එන්නේ නැහැ. එනවා නම් එන්නේ තමුසෙ එක්ක විතරයි. හැබැටම මාතියා තමුසෙගෙ රක්ෂාව මොකද ?

''මම ටැක්සි එලවනවා. ''

බොහොම හොඳයි. හුඟක් සල්ලි හම්බුකරන්න පුලුවන් රක්ෂාව. ඕ... අල්ලා මට යාලුවුනේ කියාපු මිනිහා. දැන් මට රෑ ගමන් බීමන් යන්න බය නෑ. මාතියගේ ටැක්සියෙන් යන්න පුලුවනි. එහෙම නේද? බායි විල්සන්ගේ වීදුරුවට තවත් විස්කි වත්කරමින් විමැසීය.

ඒව ඔක්කොම හරි බායි. මම තමුසෙත් එක්ක ගමන් යන්න එන්නම්. මට අද හොඳ හැටි බොන්න ඕනෑ. හිතේ අමාරුව මග ඇරෙනකම් බොන්න ඕනෑ. උන් මාව එක්ක ගිහින් මහ විකාර වගයක් ඇහුවා. කවුද ඔයි ඔව දන්නේ. කෙහෙල්





මල උන් දන්නේ මං වගේ අහිංසකයෙක් අල්ලගෙන වදකරවන්න විතරයි.''

විස්කි වීදුරු දෙක විල්සන්ගේ ශරීරය තුල ක්‍රියාකාරීවන්නට වූයෙන් ඔහු ක්‍රමයෙන් දොඩමලු වන්නට විය. බායි ඔහු කීදේ තේරුම් ගත නොහෙනුවාක් මෙන් කතාකරන්නට වූයේය.

''කවුද? මාතියා කවුද? මාතියට කවුරුවත් අරියාදුවක් කලාද?''

''අරියාදුවක් නොවෙයි, බායි. මන් හඳුනන ගෑනියෙක් කවුදෝ මරාදාලා. ඉතින් සී. අයි. ඩී. යෙන් මාව අල්ලගෙන ගිහින් පැය ගාණක් තිස්සේ ප්‍රශ්න කලා. මම ඔය මළඉලව් ගැන මොකුත්ම දන්නේ නැහැ.''

බායි සාජු විය. ඔහුගේ නෙත් අවට මේස වල මත්පැන් බොමින් පසුවන උදවිය කරා යොමුවිය. එහෙත් ඔවුන්ගේ කතාබහට කිසිවෙක් සවන් දී නොසිටින බව දුටුවෙන් ඇල්සන් ජාතිකයා යලි පහත් හඬින් කතාකරන්නට වූයේය.

''ඔව ගැන කතා කරන්න හොඳ නැහැ. දැන් ඉතින් අපි යමු මාතියා රෑ එකොලහටත් ලඟයි. හෙට උදේ පාන්දරින්ම නැගිටලා ණය කාරයෙක් අල්ල ගන්නට යන්නත් තියෙනවා.''

වෙනදාට වඩා බීමත්කම අධිකවූ බැවින් විල්සන්ටද තවත් බොන්නට ප්‍රියක් ඇත්තෙම නැත. බායිගේ කීම පිළිගෙන ඔහු හුනස්නෙන් නැගිට්ටේය.

''මාව කොම්පඤ්ඤ වීදියට ගිහින් ඇරලන්න.'' බායි ඉල්ලීමක් කලේය.

''ඒක සුදු වැඩක්. බායි කියන තැනකට ගිහින් ඇරලන්නම්.''

බායි වේටරයකු කැඳවා බිල ගෙවා දමා ඉතුරු මුදලත් නොගෙන බාර් එකෙන් පිටවී ගමන් කරන්නට විය. මොන්ටිකාලෝවේ දොරටුවෙන් එලියට බැසගත් ඔවුන් පාර අයිනේ නතරකර තිබූ ටැක්සිය කරා ගොස් ඊට ඇතුලුවූහ.

ප්‍රථමයෙන් විල්සන් හෝටලයට ඇතුලුවූවායින් පසු හෝටලය අබියසටවී රැකවල් කරමින් සිටි සී. අයි. ඩී. කාරයින් දෙදෙනාගේ තීක්ෂණ නෙත් වලට විල්සනුත් බායි කෙනෙකුත් ලක් වත්ම ඔවුන් දෙදෙනාගේ ඉරියව් ගැන මනා පරීක්ෂාවෙන් සිටියාහ.

ටැක්සිය ප්‍රාණවත්වී ඉදිරියට ඇදෙත්ම සී. අයි. ඩී. නිලධාරීන්ද තම මොරිස් මයිනර් රථයට නැග එය ලුහුබඳින්නට වූහ.

ඔවුන් ගාලුපාර දිගේ අවුත් ගෝල්පේස් පිට්ටනිය අයිනේ ටැක්සිය නතර කලහ. අනතුරුව රථයෙන් බැස ගත් ඔවුන් මුහුද දෙසින් හමන සීතල මඳ පවන විඳිනු රිසියෙන් දෝ පිට්ටනිය මැදට ගමන් කරන්නට වූහ. සැකයක් ඇති නොවන පරිද්දෙන් මදක් ඈතින් තම මෝටර් රථය නැවතූ රහස් පරීක්ෂකයින්ද බායියාත් - විල්සනුත් කරන්නට සූදානම් වන්නේ කුමක්දැයි බලාගෙන විමැසිල්ලෙන් පසුවූහ.





සී. අයි. ඩී. කාරයින් දෙදෙනා නිකමට හෝ සියනෙත් මේ පුද්ගලයින් දෙදෙනා කෙරෙන් ඉවත් නොකලාහ. මේ වනාවේදි නම් කිසිවක් අතපසු නොකිරීමට ඔවුන් හැම පරිශ්‍රමයක්ම දැරූහ.

විල්සන් බංකුව මත වාඩි වූවිට බායියා හිටගෙනම මුහුද දෙස බලා සිටියේය. පිට්ටනියේ සවිකොට තිබූ ලාම්පු කණුවේ දුර්වල ආලෝකයෙන් වුවද ඔවුන් දෙදෙනා පොලිස් නිලධාරීන්ට පැහැදිලාව පෙනේ.

මුහුදු හුලං වැදීම නිසා විල්සන්ට ක්‍රම ක්‍රමයෙන් නිදිමත හැදීගෙන එන බවත්, ඔහු ටිකින් ටික බංකුවට ඇලවීගෙන එන බවත්, බායියාට පෙනෙයි.

ඇෆ්ඝන් ජාතිකයාගේ එක් අතක් තම කබායේ අස්සට යනවා පෙනින. නිමේශයක් ගතවන්නට මත්තෙන් ඔහු කබාය යට සඟවා ගෙන තිබූ රිවෝල්වරයක් අතට ගෙන වට පිට බලන්නට වූයේය.

අධික ලෙස බීමත්ව සිටි විල්සන් මුහුදු සුළං වැදීම නිසා නිදිකිරා වැටෙන්නට විය.

බායියා ලේන්සුවක් ගෙන රිවෝල්වරයේ මූණිස්සම පිටවන කටට තබා ආවරණය කලේය. ඉන්පසු ඔහු කල්යල් බලා නිදිකිරා වැටෙන මිනිසාගේ හිසට රිවෝල්වරය එල්ල කලේය.

එහෙත් ඔහුට රිවෝල්වරයේ කොකා ගැස්සීමට තරම් කාලයක් නොලැබුණි. අන්ධකාරය දෙසින් පිට පිටම වෙඩි හඬ

නිකුත්වන්නට වූයෙන් බායියා කලබල විය. අඳුර පැවති දෙසින් මෝටර් රථයක් නතරකර තිබෙනවා පෙනින. වෙඩි හඬ නිකුත් වූයේ ඒ දෙසින් බව දැනගත් බායි තමා කරන්නට සූදානම් වූ කටයුත්ත අතපසු කොට අඳුර දෙසට දුවන්නට පටන් ගත්තේය.

වෙඩි තැබූ අයද තමා පසුපස ලුහුබැඳ එන බව නොබෝ වේලාවකින්ම බායිට අවබෝධ වූයෙන් ඔහු සම්පූර්ණ ශක්තිය යොදා පාර අයිනේ නතර කර තිබූ ටැක්සිය දෙසට දිව්වේය.

බායියා ටැක්සිය තුලට වැදී රිය ප්‍රාණවත් කරගෙන මාරාවේශවූවකු මෙන් පදවන්නට වූයේය. ඔහු පාර්ලිමේන්තු ගොඩනැගිල්ල ලඟින් වමට හරවා ලේක් හවුසිය දෙසට ගමන් කරනවා පෙනුනි.

දැන්නම් රහස් පරීක්ෂකයින්ට එක් කරුණක් ඉර හඳ මෙන් පැහැදිලිය. තමන් ලුහුබඳින්නේ අන් කිසිවෙකු නොව මිනීමැරුම් තුනකටම අවශ්‍යව තිබෙන භයානක මිනීමරුවා බව ඔවුන්ට පැහැදිලිවී අවසානය. ඉදිරියෙන් පවනට බඳු වේගයෙන් පලායන මිනීමරුවාගේ රථයේ ටයර් වලට වෙඩි තබමින්ම සී. අයි. ඩී. නිලධාරීන් ද ත්‍රාස ජනක ලුහුබැඳීමක යෙදුනාහ.

බායියාගේ රථය මැකලම් පාරට වැටුණු කෙනෙහිම රථය ගමන් කලේ පුදුමාකාර වේගයකිනි. ගාමිණි හෝල් එක අසලින් මරදාන පාරට වැටුණු ටැක්සි රථය අනතුරුව පංචිකාවත්ත පාරට හරවා වේගයෙන් ගමන් කරන්නට විය.

ටැක්සියේ ගමන් වේගය කොතරම් සීඝ්‍රගාමී වූයේදයත් සී. අයි. ඩී. නිලධාරීන්ට එයට ලඟාවීමට කිසිසේත් නොහැකි





වූහ. එහෙත් ඉන් අධෛර්යයට පත් නොවූ ඔවුන් හලාව ශබ්ද කරමින්ම පලායන රථය ලුහුබඳින්නට වූහ.

ඔවුන්ගේ රථය දිවුල්ගස් හන්දියෙන් හරවනවාත් සමගම මිනිසුන් කිහිප දෙනෙක් ලාම්පු කණුවක හැපී කුඩුපට්ටම වූ මෝටර් රථයක් දෙස බලා සිටිනු දුටුවෙන් සැක ඇතිකරගත් රහස් පරීක්ෂකයින් තම රථය නවතා එබිකම්කර බැලූහ. දෙවියනේ මේ අර බායියා පලාගිය ටැක්සිය බව හඳුනාගත් ඔවුන් වහාම මෝටර් රියෙන් පිටතට පැමිණියාහ.

ඔවුන් රැස්ව සිටි පිරිසගෙන් ප්‍රශ්න කරන්නට වූහ.

“මෙක එලවගෙන ආපු මිනිහා කෝ ?”

පිරිස තුෂ්ණිම්භූතව බලාසිටියා විනා වචනයකුදු කතා නොකලාහ.

“මිනිහට හොඳටම තුවාල ඇති තමුසෙලා මිනිහා දැක්කේ නැද්ද ? මේක ඵලවාගන ආවේ බායි කෙනෙක් ” එක් සී. අයි. ඩී. නිලධාරියෙක් පැවසීය.

පිරිසේ සිටියෙක් පිළිතුරු දෙන්නට විය. “මහත්තයා මේ ටැක්සිය පුදුමාකාර වේගයකින් වංගුව හරවා ගෙන ඉදිරියට එනවා දැක්කා. වංගුව හරවා ටිකදුරක් එන කොටම කාර් එකේ දොරක් ඇරුණා. ඇරුණ ගැටියේම උස මහත මිනිහෙක් එකපාරටම එලියට පැන ගත්තා. හරි පුදුම බේරිල්ලක් අතක් පයක් නොකැඩී බේරුන එක තමයි පුදුමෙ. ඒ මිනිහා මොකට පැන්නද කියලා මට තේරුම් ගන්න බැහැ. පැන්න හැටියේම මිනිහා අන්න අර මුඩුක්කුව ඇතුලට රිංගා දුවන්නට පටන්

ගත්තා. එහකොටම ටැක්සිය ගිහින් ලාම්පු කණුවේ හැපී සුණු විසුණු වුනා. මම මේ සියල්ලම වෙනවා ඇස් දෙකින්ම දැක්කා.''

සී. අයි. ඩී. කාරයින් දෙදෙනාට කාරණය පැහැදිලිවී ඉවරය. මිනීමරුවා ලෙහෙසියෙන් මෙල්ල කර ගත හැකි ලෙහෙසි පහසු අයෙක් නොවේ. ඔහු සෙල්ලම් කරන්නේ පොලිසියත් සමග නොවේ. ඊටත් වඩා දරුණු සැඩපරුෂ මාරයා සමගය.

මේ අවස්ථාවේ අපරාධකාරයා පසුපස ලුහුබැඳීම නුවණට හුරු නොවේ. මේ තරම් මරු කපොල්ලකිනිදු පැන තුවාලයක් නොලබා බේරී පලා යන්නට තරම් වාසනාවක් ඔහු සතුව තිබේ නම් නීතියේ නිලධාරීන්ගේ ග්‍රහණයට හසු නොවී පලා යාම එතරම් අරුමයක්ද ?

මිනීමරුවා විල්සන්ගේ ජීවිතයටද හානියක් කිරීමේ බලාපොරොත්තුවෙන් ඇෆ්ඝන් ජාතිකයෙකු මෙන් වෙස් වලාගෙන අවුත් අන්තිමේදී ඒ තැත ව්‍යවර්ථ වී ගිය අවස්ථාවේදී මෝටර් රථය ලාම්පු කණුවක හප්පා නීතියේ නිලධාරීන් අතරින් බේරී ගිය අන්දම සැලවෙත්ම ප්‍රභාගේ ඉහින් කනින් දහඩිය මුගුරු වැගිරෙන්නට විය.

විල්සන් මාර මුඛයෙන් ගැලවුනේ අනූනමයෙනි. රහස් පොලිසිය තමාට උගුලක් අටවා තිබෙන බව දන්නා බැවින් මිනීමරුවා විල්සන්ගේ ජීවිතයට හානියක් කිරීමට නොපෙලඹෙනු ඇත.

ප්‍රභා කල්පනා සාගරයේ කිමිදෙමින් ඉන්නා විට ටෙලිපෝනය නාදවන්නට වූයෙන් රිසීවරය එසෙව්වේය.





''හලෝ මේ හෙඩ්ක්වාටස් ප්‍රභායි කතා කරන්නේ.''

''මට වැදගත් ආරංචියක් දැනුම් දෙන්න තියෙනවා.''

''මොනවා - මොන විදියේ ආරංචියක්ද ?''

මම ඊයේ රෑ හුණුපිටියේ එම්පයර් නාට්‍ය ශාලාවේ පෙන්වූ ෆ්‍රැන්කන්ස්ටීන්ගේ පලිගැනීම නැමැති භයානක ඉංග්‍රීසි චිත්‍රපටය බලන්න ගියා. ඒක මහ අති බිහිසුණු කතාවක් අවසාන වෙනකොට රෑ එකහමාරත් පහුවෙලා. මම පදිංචිවෙලා ඉන්නේ නාරාහේන්පිට. ඉතින් රෑට බස් නැති නිසා මම පයින්ම ගමනාරම්භකලා චිත්‍රපටයේ පෙන්වූ දේවල් මගේ හිතේ තදින්ම කා වැදී තිබුණා. ඒ භයංකාර කතාවෙන් මළමිනී වලට පණ දෙන හැටි. මිනිසුන්ගේ ශරීර අවයව කපා තවත් මිනිසුන් නිර්මාණය කරන හැටි. ඒ භීෂණ චිත්‍රපටයෙන් විස්තර වුන නිසා මගේ හිත භීතියෙන් සැලෙන බව මට දැනුනා. අඳුර බල පවත්වන තැන් දකින කොට මට චිත්‍රපටියේ පෙනුණු ඒ ෆ්‍රැන්කන්ස්ටීන් සිටුවරයා නිර්මාණය කල භයානක සත්වයා පෙනෙන්නාක් මෙන් වුනා. මොනවා කරන්නද? ගෙදර යන්නත් එපායැ. හිතට ධෛර්‍ය ගෙන මම කෙටි පාරවල් දිගේ ගමන් කරන්නට වුනා. මම රොඩනි මාවතට හැරුණා. රොඩනි මාවත මට ඒ නම හොඳට මතකයි. මීට සති දෙකකට ඉස්සරියෙන් මේ මාවතේ සිදුවූ භයානක මිනීමැරුම නිසා පුවත්පත් වල ලොකු අකුරින් මේ මාවතේ නම පලකර තිබුණා. ඒ ගැන මතකයට නැගෙනවාත් සමගම හිතේ තිබුණු භීතිය දස ගුණයකින් අධික වුනා. මම වටපිට බලන්නේ නැතුව කෙලින් බලාගෙන ගමන් කරන්නට වුනා. හිතේ තියෙන බය නැතිකර ගන්නා අටියෙන් මම උස් හඬින් උරුවම් බාමින්ම ගමන් කලා.''

රහස් පරීක්ෂකවරියට දැන් ඉවසුමක් නොමැති අබිරහසක් ගැන කියන්නට සූදානම් වන මේ අද්භූත ආගන්තුකයා කවරෙක්ද ? ඔත්තුවක් ලබා ගැනීමට පෙර ඔත්තු දෙනු ලබන පුද්ගලයා ගැන දැනගෙන සිටිය යුතුමය. රහස් පරීක්ෂක වෘත්තියේ මූලික සිද්ධාන්තය මෙනෙහි කල ඈ මහත් නොඉවසිලිමත් භාවයකින් මෙසේ විමසුවාය.

"මිස්ටර් තමුසෙගෙ නම මොකක්ද ? කරුණාකර ආරංචිය දෙන්නට කලින් ඔබ ගැන තොරතුරු ටිකක් දන්වන්න. ඒක ඔබේ ආරක්ෂාව සඳහායි."

"ඔ... මම කියන්නම්. මම කොළඹ ආකාශ වස්තු පරීක්ෂණාගාරයේ සේවය කරන්නෙක්. මම එතැන කාලගුණය පරීක්ෂාකර බලන නිලධාරියා. මගේ නම සූර්ය සංකර් ජයවීර. නැවතිලා ඉන්නේ නාරාහේන්පිට නොම්මර 49 බෝඩිමේ."

"තැන්ක්යූ එහෙනම් දැන් ඉතින් ඔබේ විස්තරය ඉක්මන් කරන්න." ප්‍රභා ටෙලිෆෝනයෙන් කතාකල තැනැත්තා උනන්දු කරවමින් පැවසුවය.

"මම රොඩ්නි මාවත දිගේ ගමන් කරන්නට වුනා. මිනිහෙක් මරාදාපු බංගලාවේ ජේනතෙක් මානයට එන කොට මගේ පපුව වේගයෙන් ගැහෙන්නට පටන් ගත්තා. ඒ මොකදැයි කීවොත් ඒ මරණේ බලන්න මාත් ඔය බංගලාව ඇතුලට ගියා. මට මිනිය ජේන්නාක් මෙන් වගේ දැනුනා. ඒත් මොනවා කරන්නද? දත්මිටි කාගෙන මම ඉස්සරහට තියාපු අඩිය ආපසු තියන්නෙ නැතුව ඉදිරියටම ගමන් කලා."

"අර බංගලාව පසු කරන්න මම අඩිය ඉක්මන් කලා.





දෙවියනේ ඒ වෙලාවේ මට ඇති වුන භය බංගලාවේ දෙවෙනි තට්ටුවේ ඉඳලා කවුදෝ කෙනෙක් වතුර ගලා බැසීමට තිබෙන පිල්ල දිගේ පහලට ඇදෙනවා දැක්කම මගේ ඇගේ මවිල් කෙලින් වී සිටියා. මිනීමැරුම් සිදුවූ තැන් වල අවතාර තිබෙන බව මම කලින් අහල තියෙනවා. ඒ නිසා මේ නම් හොල්මනක්ම තමයි කියලා මට හිතුනා. මට ඇතිවුන භය කොච්චරද කීවොත් මට මගේ කකුල ඉබේටම දිවෙන්නට වුනා. මම දුවලා ගිහින් පාර අයිනේ තිබුණු ලොකු ගහකට මුවාවෙලා හැංගුනා. අර මිනිහා පයිප්පය දිගේ බඩ ගාගෙන බිමට බැහැලා පල් හොරෙක් වගේ වටපිට බලා ඇවිත් තාප්පෙන් පාරට පැන්නා. පැනලා ටික දුරක් ඉස්සරහට ආවා. අනේ දෙවියනේ ඒ මිනිහාගේ මූණේ ලොකු තුවාලයක් වෙච්ච කැලලක් තිබුනා. මිනිහා කලු ඇඳුම ඇඳගෙන කලු තොප්පියක් ඔලුවේ දමාගෙන හිටියා. මම මිනිහාට පෙනේවිය යන භයෙන් තවත් ටිකක් මුවා වුනා. කලු ඇඳුම්කාරයා ඉදිරියට ගිහින් එකපාරටම අතුරුදන් වුනා වගේ වුනා. ඒ එක්කම කලුවර තැනක නතරකර තිබුණු මෝටර් රථයක් ප්‍රාණවත්වී වේගයෙන් ඉදිරියට ඇදුනා."

කතාකල තැනැත්තා සිය කතාව මදකට නැවැත්වූ බව දැනගත් ප්‍රභා ඊලගට මොහුගෙන් ප්‍රශ්නකල යුත්තේ කුමක්දැයි නිගමනයකට බැසීමට උත්සහ දැරුවාය.

"මිස්ටර් සූර්ය සංකර් කලුවර නිසා ඔබට ඒ කාර් එකේ නොම්මරේ බලාගන්න බැරිවෙන්න ඇති එහෙමනේද?

"ඔව්.... ඉතින්. මේ පරිසරයෙන් ඉක්මණින්ම ඈත් වීමට නුවණට හුරුබව පෙනුනා. හෙට එලිවෙන කොට තවත් මිනීමැරුමක් ගැන ආරංචි වේ යයි මම බලාපොරොත්තු වුනා.

නමුත් එහෙම දෙයක් එතැන සිදුවන බවට ඔබට රිපෝට් එකක් ලැබිලා නැ නේද?''

''නැහැ.'' ප්‍රභා ස්ථිරවම කීවාය.

මට පුදුම අන්න ඒකයි. එහෙනම් ඒ මහ රෑ කලු ඇඳුම් ඇඳගෙන පයිප්පය දිගේ බඩගාපු මිනිහා කවුද ?''

''මිස්ටර් අපි ඒ ගැන ඉක්මනටම කරුණු සොයා ගන්නම්. හැබැයි අපිට මින් ඉදිරියටත් ඔබේ සහාය අවශ්‍ය වෙන්න ඉඩ තියෙනවා. ඒ නිසා අපි පණිවුඩයක් එවූ හැටියේම කාර්යාලයට එන්න අමතක කරන්න එපා.''

''බොහෝම ස්තුතියි.''

ගිල්මන් සමරසේකරගේ බංගලාවට රෑ දෙගොඩ හරි යාමයේ ඇතුලුවූ පුද්ගලයා කවරෙක්ද ? ඔහු තමා සොයන මිනීමරුවා නම් මෙලහකටත් ගිල්මන් සමරසේකර මැතිණියත් මරා දමා පලා යනවාට නිසැකය. පයිප්පය දිගේ පහලට බඩගාගෙන අවුත් මෝටර් රථයකින් පලාගිය මේ අභිරහස් පුද්ගලයා ගැන කරුණු සෙවීමට ඈ තරයේම අධිෂ්ඨානය කරගත්තාය.

ජීවිතය ඔට්ටුවට තබා කරන මේ පරීක්ෂණයෙන් එක්කෝ තමාට ජය අත්විය හැකිය. එසේ නැත්නම් මිනීමරුවා තවත් බිහිසුණු ක්‍රියාවල නිරතවෙමින් මහජන දේහයට තර්ජනයක් වනු නොඅනුමානය.

ප්‍රභාගේ සිතේ දැන් එක් සැකයක් තදින්ම බලපවත්වයි.





ඒ සැකය නැතිකර ගැනීමට අදිටන් කරගත් ඈ රෑබෝවන තුරු මහත් නොයිවසිල්ලෙන් කාලය ගතකරන්නට වූවාය.

රෑ දහය වදිනවාත් සමග සිය මෝටර් රථයට නැගුණු ප්‍රභා කුරුඳුවත්ත බලා රථය පදවන්නට වූවාය. රොඩ්නි මාවතට නුදුරින් වූ කුඩා පටුමගක සිය රථය නැවතූ රහස්පරීක්ෂකවරිය සයිලන්සරයක් සවිකල තම රිවෝල්වරය සූදානම් කරගෙන පයින්ම ඉදිරියට ගමන් කරන්නට වූවාය.

අටවක දිනයක් වූ බැවින් ඝනාන්ධකාරය බිහිසුණුය. සමරසේකර බංගලාවේ පහත මාලයේ ලයිට් සියල්ල නිවා දමා තිබෙන බව ඇයට පෙනෙයි. එහෙත් දෙවන මාලයේ වම්කෙලවරේ කාමරයේ විදුලිමය බුබුලක් දැල්වෙමින් තිබෙනවා ආවරණය කරන ලද ජනේලයක් තුලින් පෙනින.

ප්‍රභා සෙමින් සෙමින් ඉදිරියට අවුත් තාප්පයෙන් පැන බංගලාවේ මිදුලට අවතීර්ණ වූවාය. මල් පඳුරු අස්සේ සැඟවෙමින් ඉදිරියට ගමන් කල රහස් පරීක්ෂකවරිය බංගලාවේ කුස්සිය දෙසට ගමන් කලාය.

ඈ කුස්සියේ දොර හරින්නට උත්සහ දැරුවාය. එය අගුලුදමා වසා තිබුනේ ගෙතුලට ඇතුලුවීමට සුදුසු මාර්ගයක් සොයමින් වෙහෙසෙන්නට වූවාය.

රහස් පරීක්ෂකවරියගේ වෙහෙසීමේ ප්‍රතිපල ලැබුනේ මිනිත්තු කීපයක් සෙවීමෙන් පසුවය. මුලුතැන්ගෙය කෙලවරේ කෙටි තාප්පයක් බැඳ තිබෙනු දකින්ම එක්වරම ඇගේ සිතට අලුත් අදහසක් ඇතුලු විය. මේ කෙටි තාප්පයට නැග ගතහොත්

ඇයට පහසුවෙන්ම ගෙතුලට රිංගාගත හැකි බවයි. එහෙත් ප්‍රශ්නය වී තිබෙන්නේ කෙටි තාප්පයට නැග ගැනීමය.

ඇ කඩිමුඩියේම වටපිට බලන්නට වූවාය. වැල් කැඩුණු පුටු කබලක් අයිනක තබා තිබෙනු දුටු ඇ වහාම එය ඔසවා ගෙනවුත් කෙටි තාප්පයට හේත්තු කොට එහි නැග ගත්තාය. ඉන්පසු මහත් ආයාසයකින් තාප්පයට නැග එහි දිගේ මදක් තැන් ගොස් ගෙතුලට බැස්සාය.

ගෙය තුල පැවතුනේ අමුසොහොනක නැති තරමේ තදබල නිශ්ශබ්දතාවයකි. ඒ නිහැඬියාව තමා ගිලගන්නට සැරසී සිටින මිනිසෙකුමෙන් ප්‍රභාට දැනෙයි. හිතට ධෛර්‍ය්‍ය නංවා ගත් ඇ රිවෝල්වරයද එල්ලකොට ගෙන සෙමින් පියවර ඉදිරියට තබන්නට වූවාය.

වාසනාව ඇ දෙස බලා සිනාසුන හෙයින් වැඩි දුෂ්කරතාවයක් නොමැතිව බංගලාවේ දෙවෙනි මහලට නැග ගැනීමට ඇ සමත් වූවාය. එහෙත් තරප්පු පේලිය නගිද්දී ඇ අඩි හඬක් නොනැගීමට බොහෝ සේ පරිස්සම් වූවාය.

දෙවෙනි මහලට පිවිසුනු ප්‍රභා විදුලි බුබුල දැල්වෙන කාමරය තිබුනේ කොයි පැත්තෙන්දැයි බලන්නට වූවාය. එය දකිත්ම ඇ පල්හොරෙකු මෙන් පියවර ඉක්මන් කලාය.

විදුලි බුබුල දැල්වූ කාමරය දෙසින් කවුදෝ කහින හඬක් ඇසුනෙන් තිගැස්සුනු රහස් පරීක්‍ෂකවරිය දොර රෙද්දට මුවාවී සැඟවුනාය. කාමරය තුල කවුදෝ එහා මෙහා සක්මන් කරන අඩි ශබ්දය ඇයට පැහැදිලිවම ඇසෙයි.





මෙ හුදකලා බංගලාවේ අවේලාවට නිදිවර්ජිතව සිටින තැනැත්තා කවුද ? ඒ ගිල්මන් සමරසේකර මැතිණියද ? ඇ ඉතා දුර්වල - ඉතා ඉක්මනින් බියට පත්වන තාලේ ගැහැණියකි. එවැන්නියක් නිදිමරාගෙන සිටිවීයයි ඇයට විශ්වාස කල නොහැකිය.

මිනිත්තු කීපයක් ගතවනතුරු නිහැඬියාව පැවතින එහෙත් කිසිවෙක් කාමරය තුලින් එලියට නොපැමිණියෙන් ප්‍රභා සැගවී සිටි තැනින් මෑත්වී කාමරයේ දොරේ සිදුර තුලින් එබිකම් කර බැලුවාය .

රාත්‍රී ඇඳුමකින් සැරසුණු ගිල්මන් සමරසේකර මැතිණිය කාමරයේ ඔබ මොබ සක්මන් කරමින් පසුවූවාය. ඇගේ සිත යම් අරමුණක් කරාම යොමුවී ඇති බව ඇ හැසිරෙන ආකාරයෙන්ම ප්‍රභාට දැනෙයි.

මිනිත්තු කීපයක් ගෙවියත් සමරසේකර මැතිණිය යලි සයනය මතට පිවිස පොතක් දිගහැර කියවන්නට පටන් ගත්තාය. එහෙත් පොත වැඩි වේලාවක් කියවන්නට නොලැබුණි. ඇ හිටිහැටියේම තිගැස්සී ඇඳෙන් නැගිට භ්‍රාන්තවී බලා සිටියාය.

යම් දෙයකට ඇ හයවුනා විය යුතුය. ඒ දෙය කුමක්ද ? එය සොයා බැලීම තම සතු කාර්‍ය්‍යයකි. ප්‍රභා හඬක් නොනැගෙන්නට පියවර තබමින් ආපසු හැරී පහත මාලයට බසින්නට වූවාය.

තරප්පු පේලියේ අඩක් බසිත්ම බංගලාවේ ඉදිරිපස දොර ඇරී වැසෙන 'ක්‍රීස්' යන හඬ ඇසුනෙන් රහස් පරීක්‍ෂකවරිය ගල්ගැසී නැවතුනාය.

කවුදෝ කෙනෙක් බංගලාව තුලට ඇතුලු වූවාත් මෙන් අඳුරු සේයාවක් දිස්විය. ප්‍රභා තම අත තිබූ විදුලි පන්දම දල්වා අඳුරු සේයාව දෙසට එල්ල කලේය.

කලු ඇඳුම් ඇඟලාගත් කාලවර්ණ පෙනුමැති මිනිසෙක් විදුලි එලියෙන් බියට පත්ව ආපසු දුවන්නට සැරසෙනවා ඈට පෙනින. ප්‍රභා රිවෝල්වරය එල්ල කරගෙනම දුවන්නට සැරසෙන මිනිහාට නවතින ලෙස තර්ජනය කල නමුදු ඔහු ඉතා වේගයෙන් දොර වසා ගෙනම පිටතට පැනගත්තේය. ප්‍රභා අඩියෙන් දෙකෙන් තරප්පු පේලිය ඔස්සේ පහලට දිවගොස් දොර විවෘත කලාය. අඳුරු සේයාව මල් පාත්ති අස්සේ සැඟවෙමින් දුවනවා දකිත්ම ඈ රිවෝල්වරය එල්ලකොට දෙවරක්ම ඒ තැනැත්තා දෙසට වෙඩි තැබුවාය. ඇගේ ඉලක්කය වැරදීමට නුපුලුවන අඳුරු සේයාව එක් අතකින් උරහිසත් තදකර ගෙනම දිවගොස් තාප්පයෙන් පිටතට පැනගත්තේය.

මිනිහාට වෙඩි වැදුන නමුදු ඔහු ප්‍රතිප්‍රහාර දීමට මැදුනු නොනැවතුනේය. ඔහු පසුපස ලුහුබැඳීම නිෂ්පල දෙයක් බව හැඟුනෙන් ප්‍රභා විමැතියෙන් බලා සිටියාය. එකෙනෙහිම මෝටර් රථයක් ප්‍රාණවත් වන හඬ ඇගේ සවන් වලට පැහැදිලිව ඇසිණ

මිනීමරුවා. ඔව්... ඒ තමා මිනීමරුවා. ඔහුගේ කම්මුලේ තිබුණු කැලල විදුලි පන්දම් එලියෙන් ඇයට පැහැදිලිවම පෙනුනි ඔහු පැමිණියේ මිසිස් සමරසේකරගේ ජීවිතයද විනාශකර දැමීමේ බලාපොරොත්තුවෙන් විය යුතුය.

වෙඩි හඬින් පරිසරයේ පැවති දැඩි නිහැඬියාව බිඳිනි සමරසේකර මැතිණියත් ගෘහයේ මෙහෙකරුවනුත් කලබලයට පත්ව පහලට දුවගෙන පැමිණියාහ. තවමත් දුම් නගින



පිස්තෝලයත් අතැතිව සිටින ප්‍රභා දුටු හැටියේම සමරසේකර මැතිණියගේ මුහුණ එක් වරම මළමිනියක් මෙන් සුදුමැලිවී යනු පෙනින.

මොකද? මේ කලබලේ මට වෙඩි ශබ්දයක් ඇහුනා. ඔබ කොහොමද ගේ ඇතුලට ආවේ ?'' සමරසේකර මැතිණිය බලවත් උත්සහයකින් පසු ප්‍රශ්න කලාය.

ප්‍රභා නිරුත්තරව බලා සිටියේය. දුටු දර්ශණය තවමත් ඇයට සිහිනයක් බඳුය. එහෙත් ඒ සිහිනයක් නොව හැබෑහින්ම වුන දෙයක් බව මතකයට නැගෙත්ම ඈ සමරසේකර මැතිණිය දෙසට පියවර තැබුවාය.

''මිසිස් සමරසේකර මිනීමරුවා ගෙට ඇතුලුවන්න උත්සහ කලා. මම ඌට දෙවරක්ම වෙඩි තිබ්බා. වෙඩි පාරක් උරහිසට වැදුන බව මට සහතිකයි. ඌ නැවතත් මෙහේ හොල්මන් කරන්න පටන් ගෙන තිබෙන්නේ නපුරු චේතනාවකින් බව මට හැඟෙනවා.''

සමරසේකර මැතිණිය හිස් බැල්මෙන් බලා සිටියාය. ඇගේ මුහුණ පෙර මෙන්ම සුදුමැලිවී ගොස් තිබුනා විනා ප්‍රභාගේ කතාවෙන් මඳකට වුවද වෙනසක් නොවීය. ඈ මහත් ආයාසයකින් කතා කරන්නට වූවාය.

''මිස් ප්‍රභා... ගිල්මන් මරාදමා සුමානයක් දෙකක් ගතවෙන කොට මේ ගෙදර මට ඉන්නත් එපා වෙන තැනට කටයුතු සැලසුනා. රෑට මහ විකාර ශබ්ද ඇහෙනවා. මගේ දයාබර ගිල්මන් වේදනාවෙන් කෙඳිරි ගාන්න වගේ ඇහෙනවා. තවත් වෙලාවක දොර ඇරගෙන කවුදෝ එහා මෙහා ගමන් කරන්නා

වගේ අමුතු ශබ්ද ඇසෙනවා. දවසක් දෙකක්ම කලු ඇඳුම් ඇඳ ගත් අවතාරයක් වගේ මිනිහෙක් ගේ වටේ ඇවිදිනවා මං දැක්කා. මං හිතුවේ මේ සියල්ලක්ම පෙනෙන්නේ මගේ හිතේ තියෙන බයටය කියලයි. ඔබටත් පේන්න ඇත්තේ ඒ අවතාරය නමා.'' ඇ සුසුමක් හෙලමින් පැවසුවාය.

ඇගේ ප්‍රකාශයෙන් රහස් පරීක්ෂකවරිය පුදුමයට පත්විය. එහෙත් සමරසේකර මැතිණිය මිනීමරුවාගේ වෙස්වලාගෙන මුලාවට පත්ව ඇතිබව තේරුම් ගත්තාය.

''මිසිස් සමරසේකර ඒක නම් අවතාරයක් නොවන බව මට ඉරහඳ මෙන් පැහැදිලියි. අර මූණේ කැපුණු සලකුණු එහෙමමයි. ඔව් ඒ සලකුණ දැකපු දෙන්නෙක් දැන් මළුවන් අතර. ඒ පමණක් නොවෙයි. මෝටර් රථයකින් පලායන අවතාර ගැන ඔබ මීට පෙර අහල තියෙනවාද ?''

සමරසේකර මැතිණිය නිරුත්තරව බලා සිටියාය. රහස් පරීක්ෂකවරියගේ පැණයට ඇයට පැහැදිලි පිලිතුරක් දිය නොහැකිය. ඇගේ නිහැඬියාව තව දුරටත් ඉවසනු නොහැකිව රහස් පරීක්ෂකවරිය නැවතත් කතාකරන්නට වූවාය.

''මිසිස් සමරසේකර මින්පසු ඔබ ඉතාමත් ප්‍රවේශම් වෙන්න ඕනෑ. මිනීමරුවා සූදානම් වන්නේ මහ බිය ජනක දේකටයි.'' කී ප්‍රභා ටෙලිපෝනය කරා ගොස් ප්‍රධාන පොලිස් කාර්යාලයට කතාකරමින් ඇඟිලි සටහන් පරීක්ෂක විශේෂඥයන් හා රෙක්ස් ද වහාම මෙහි පමුණුවන ලෙස ඉල්ලා සිටියාය.

පැය බාගයක් ගතවන්නට මත්තෙන් නිලධාරීන් පිරිසකුත් රැගත් වෑන් රථයක් රොඩ්නි මාවතේ නොම්මර 99





යේ නිවසට ඇතුලු විය. ඇඟිලි සටහන් පරීක්ෂක නිලධාරීන් දොරගුලේ තිබූ ඇඟිලි සලකුණු ඡායාරූප වලට නගන්නට වූ අතර ප්‍රභා රෙක්ස්ව ඉවතට යොමු කලාය.

පොලිස් බල්ලා දොරලඟ මදක් ඉව කලේය. අනතුරුව මහත් නොසන්සුන් තාවයකින් ගෘහයේ දෙවන මහලට දුවන්නට වූයේය. සමරසේකර මැතිණියගේ නිදන කාමරයට ඇතුලුවූ බල්ලා පසෙක තිබූ අල්මාරිය ලඟට ගොස් තම මුවින් එය විවෘත කිරීමට උත්සහ දැරුවේය. එය නොහැකි වූ තැන බල්ලා ආපසු හැරී පහත මාලයට දුවගොස් එලියට පැන ගත්තේය.

රෙක්ස් සමරසේකර නිවසේ තාප්පයෙන් පැන මහා මාර්ගය ඔස්සේ ඉදිරියට දුවන්නම ප්‍රභාගේ මුහුණේ සොම්නස් සහගත පෙනුමක් විය. බල්ලාට ඉව ඇදී තිබෙන බව ඇයට පැහැදිලිය.

මිනීමරුවාගේ ඉව බල්ලාට දැන් තිබේ දැන් ඉතින් අවුරුදු ගණනාවක් ගතවූනද බල්ලාට ඒ ඉව අමතක නොවන බව ප්‍රභා දන්නීය. සෙනගක් මධ්‍යයේ සිටියද මිනීමරුවා නිශ්චය වශයෙන් තෝරා ඔහුගේ බෙල්ලට පැන උගුරු දණ්ඩ කඩා දැමීමට රෙක්ස්ට ඒ ඉව හොඳටම ප්‍රමාණවත්ය.

නිලධාරීන් තවත් හොඳින් ඇඟිලි සටහන් පරීක්ෂාකර බලද්දී බල්ලාත් කැටුව තම මෝටර් රථයට නැගගත් ප්‍රභා සැහැල්ලු සිතින් නිවෙස බලා ධාවනය කරන්නට වූවාය.

# 07

ඇඟිලි සටහන් පිලිබඳ රපෝර්තු සියල්ලම රහස් පරීක්ෂකවරියගේ මේසය මත සූදානම්ව තිබිණි. ප්‍රභා ඒ ඇඟිලි සටහන් සම්බන්ධ විස්තර එකින් එක කියවා බලන්නට වූවාය. කියවා අවසානවත්ම ඇගේ දෙබැම ඉහලට නැගුණි. ඇ මාරයා දුටුවාක් මෙන් භ්‍රාන්තවී බලා සිටියාය.

ඒ මොහොතේ ප්‍රභාගේ හිතට ඇතුලුවූ අදහස් විස්තර කිරීමට කිසිසේත් නොහැකිය. ඒවා තේරුම්කල නොහැකි වූවද, විශ්වාසගත නොහැකිවුවද, එහි වැරදීමක් නම් සිදුවිය නොහැකිය. ඇඟිලි සටහන් පරීක්ෂක නිලධාරීන්ගේ සූක්ෂම යන්ත්‍ර වලට වැරදීමක් සිදු වන්නට කොහෙත්ම නුපුලුවන. ඒවා හැම දෙයක්ම කෙස් ගහට ඉටුකරන යන්ත්‍ර බව ප්‍රභා දනියි.

එහෙත් මේ ඇඟිලි සලකුණු ? දෙවියනේ ඒ ගැන සිතන විටත් ඇගේ ඇඟපතේ හිරිගඩු පිපෙන්නාක්මෙන් ඇයට දැනේ

පසුදින ප්‍රභා මහනුවර පොලිසියට ටෙලිෆෝන් මගින් කතාකොට නාරද වීරසිංහ වහාම ප්‍රධාන පොලිස් කාර්යාලයට ගෙනෙන ලෙස දැන්වූවාය. නාරද වීරසිංහ මුණ ගැසෙනතුරු දැන් ඇයට ඉවසීමක් නැත්තේය.





මහනුවර පොලීසිය රහස් පරීක්ෂකවරියගේ ඉල්ලීම අකුරටම පිලිපැද පසුදිනම නාරද වීරසිංහ කොටුවේ ප්‍රධාන පොලිස් කාර්යාලය කරා ගෙනෙනු ලැබීය.

නාරද වීරසිංහ රහස් කාමරයකට ඇතුලු කරගත් ප්‍රභා මානෙල් හා ගිල්මන් අතර බැඳුණු සෙනෙහස ගැන පැය තුනක් තිස්සේම ප්‍රශ්න කරමින් වැදගත්දේ සටහන් කරගන්නට වූවාය. නාරද කිසිම අමුත්තක් නැතිව රහස් පරීක්ෂකවරිය විසින් අසන ලද සෑම ප්‍රශ්නයකටම නොපැකිලිව පිලිතුරු දුන්නේය.

සිද්ධිය වී දින දෙකකට පසු තවත් භයානක දෙයක් සිදුවිය. එය සැලවූ කෙනෙහිම ප්‍රභාගේ ඉහ මොලය රත්විය. සමරසේකර මැතිණියගේ පියාවන සයිමන් ගුණසේකර මහතාගේ ගෙල මිරිකා මරාදමා තිබෙන බව සැලවෙත්ම ප්‍රභා පවනට බඳු වේගයෙන් මෝටෝරිය ධාවනය කරමින් අපරාධය සිදුවූ ස්ථානයට පැමිණියාය.

මියගිය සයිමන් ගුණසේකර ජිවංවිව සිටියේ නුගේගොඩ මිරිහානේ වත්තක් මැද පිහිටි පරණ තාලේ ගෘහයකය. තම දියණිය ගිල්මන්ට විවාහකර දීමෙන් පසු ඔහු තම සිරිදත් සමග මෙ පාලු ගෘහයට වී තනිව නිහඬ ජීවිතයක් ගත කලේය. ඉඩකඩම් කිහිපයකින් හා සුභද්‍රාරාම පාරේ තිබූ ගෙවල් තුනකින් ලැබුන ආදායමින් ඔහුට අඩු පාඩුකම් වලින් තොර සැපවත් දිවියක් ගෙනයාමට හැකිවිය.

ජීවත්ව සිටි කාලය තුල ඔහු සතියකට වරක් තම දුවණිය දකින්නට පැමිණෙන්නේය. එහෙත් තම බෑනා හිටි හැටියේම මරා දැමූවාට පසුව නම් ඔහු සතියකට නොවරක්ම ගොස් තම එකම දියණියගේ දුක සැප බැලීමට පුරුදුව සිටියේය.

සයිමන් ගුනසේකර මැරී සිටියේ ඔහුගේ කාමරය තුල නොවේ ගෙට ඇතුලුවන ප්‍රධාන දොර අබියස ඔහුගේ මලකද වැතිර තිබිණි. ප්‍රභා පොලිස් බල්ලාද කැටුව එහි පැමිණෙන විට කෝර්නර් තැන තම මූලික පරීක්ෂණ සියල්ලක්ම හමාර කර තිබුණි.

ප්‍රභා කලින්ම මරණය සිදුවීමට හේතුව දන්නා නමුදු ඒ ගැන පැහැදිලි විස්තරයක් දැන ගන්නා අටියෙන් කෝර්නර් තැන හමුවට පැමිණියාය. ඈ ප්‍රශ්න කිරීමටත් පෙර කෝර්නර් තැන මරණයට හේතුව පැහැදිලි කරන්නට වූයේය.

"මිස්ටර් ගුණසේකරගේ මරණය සාමාන්‍ය අන්දමේ එකක් නොවෙයි.'' ඔහු අත තිබූ බස්තම බිම අනිමින් සඳහන් කලේය.

''හැබැටම ඩොක්ටර් මේ මරණය සිදුවී තිබෙන්නේ හුස්ම හිර කිරීමෙන්ද ?''

''හුස්ම හිර කිරීමෙන් ප්‍රාණය නිරුද්ධවූ බව මා පිළි ගන්නවා. නමුත් මේ බලන්න ඔහුගේ ශරීරය හොඳටම නිල්වෙලා මෙහෙම වෙන්නේ මොකදැයි කියලා මා නොකීවාට ඔබ දන්නවා නේ. ඔව් ඔහුට හොඳටම පහර දීලා තිබෙනවා. ඔහුගේ බෙල්ල මිරිකලා තියෙන්නේ සිහි නැතිවූ අවස්ථාවේදියි. මේ ඇස් දිහා බලන්න ඒවා වැසුණු ගමන්ම තාමත්ම එහෙමමයි. සිහිය තිබියදී ගෙල මිරිකුවා නම් මේ ඇස් දිහා බලන්නට තරම් බයයි ඒවා ඇරෙනවා.''

මේ මිනීමැරුමත් ගිල්මන් - සදානාදන් හා ඇසිලින් මරාදැමූ මිනිසා විසින්ම කරන ලද්දක්දැයි ප්‍රභාට බලවත්ම





ප්‍රහේලිකාවකි. මේ මහලු මනුෂ්‍යා මරා දැමීමෙන් කෙනෙකුට පල ඇති ප්‍රයෝජනය කුමක්ද ?

මහලු ගුණසේකර මැතිණිය කඳුලු සලමින් රහස් පරීක්ෂකවරියගේ ප්‍රශ්න වලට මහත් ආයාසයෙන් පිලිතුරු දෙන්නට වූවාය.

''මේක නම් හෙණ හත ගහන අපරාධයක්. අපට මේ තරම් හින්දර දෙනවුන්ගේ දරුපවුල් වලටත් ශාපවේවා. මේ තරම් දුකක් උහුලන්න පුලුවන්ද ? දෙවියනේ අපේ අර ගිල්මන් දරුවාගේ මළකඳේ රස්නේ යන්නත් ඉස්සර වෙලා මේ අසරණ මනුෂ්‍යයා මරා දමලා දෙවියනේ '' කී ඈ දැත් පපුවට තබා තදකර ගත්තාය.

ප්‍රභා මහලු කාන්තාව අස්වසාලන්නට උත්සහ දැරුවාය. ඇගේ කතාවේ සත්‍යයක් තිබේ.

''මිසිස් ගුණසේකර දැන් ඉතින් හැඬීමෙන් පලක් නැහැ. ඔබ කොයිතරම් ඇඬුවත් දුක් වුනත් මිය ගිය ඔබේ ස්වාමිපුරුෂයා නැවත නැගිටින්නේ නැහැ. ඒ නිසා දැන් සිහිනුවනින් යුතුව කටයුතු කරන්න ඕනෑ. මේ අපරාධය කල මිනීමරුවන් අල්ලා නීතියෙන් ඔවුන්ට දියහැකි ඉහලම දඬුවම ලබාදෙන්න උත්සහ කරන්න ඕනෑ. ඒ නිසා ඊයේ රාත්‍රියේ සිදුවූ දේවල් ගැන මට පැහැදිලි විස්තරයක් කරන්න. එතකොට මේ අපරාධය ගැන වගකිව යුතු උදවිය අපට සොයා ගන්නට පහසු වේවි.''

''සයිමන් ඊයේ දවල් දුවලයි ගෙදර ගිහින් ගෙදර එනකොට ඇඳිරි වැටීගෙන එමින් තිබුණා. එයා ගෙදර ආවේ බොහොමත්ම හිත් කණස්සල්ලෙන් දුවලගේ බංගලාවේ මහ

පටලැවිලි වගයක් වුනාය කියලා සයිමන් මා එක්ක කිවා. අපි රෑ කෑම ගත්තායින් පස්සෙ හුගක්වෙලා මේ දේවල් ගැන කතා කරමින් සිටියා.''

''මොනවා ගැනද කතා කලේ ?''

''සයිමන් කිවා මේ හැම දෙයක්ම කරන්නේ අපේ පවුලත් එක්ක වෛරයකින් ඉන්න කවුරු තැනැත්තෙන් කියලා. අපේ තරහ කාරයෝ කවුදැයි මතක් කරන්නට අපි පුලුවන් තරම් උත්සහ කලා. ඒත් දැනුවත්ව නම් මේ තරම් බිහිසුණු අපරාධයක් කරන්නට තරම් අපිත් එක්ක තරහ කෙනෙක් නැහැ.''

''රෑ අමුතු ශබ්ද එහෙම ඇහුනේ නැද්ද ?'' ප්‍රභා සැකමුසුව ඇසුවාය.

මහලු කාන්තාව කල්පනා කලාය. අනතුරුව හිස් බැල්මෙන් බලා ඉඳ පිලිතුරු දෙන්නට වූවාය. ''අපි නින්දට යනකොට රෑ දහයාමාරට විතර ඇති. හැමදාම රෑ දෙකට විතර සයිමන් ඇඳෙන් නැගිටලා දොර ඇරගෙන වත්ත වටේම ටෝච් එලිය ගහලා බලන පුරුද්දක් තිබුණා.''

ප්‍රභාගේ නලල් තලය රැලි ගැස්සින. ''ඒ මොකද ? ඒක සාමාන්‍ය දෙයක් නොවෙයි. මේ වයසේ ඉන්න කෙනෙක් රෑ ජාමෙට නැගිටලා ගෙවත්ත පරීක්ෂාකර බැලීම ස්වාභාවික දෙයක් නොවේ නේද ?''

''නමුත් ඒක මේ අද ඊයේ පුරුද්දක් නොවෙයි. තරුණ කාලේදීත් සයිමන්ට ඒ පුරුද්ද තිබුණා. මේ පලාතේ හොර හතුරෝ වැඩියි. ගෙයක් දොරක් හදාගෙන අනුන්ට අතපාන්නේ







නැතුව ජීවත්වෙන මිනිසුන් එක්ක අනෙක් උදවිය හරි ඊෂාවෙන් ඉන්නවා. කොයි වෙලාවේ උගුලක් අටවමදෝ කියලා අන්න ඒ හේතුව නිසයි සයිමන් ඔය දෙගොඩහරි ජාමෙට නැගිටලා වත්ත පරීක්ෂාකර බලන්නෙ.''

''ඊයේ රෑ ඔහු ගෙයි දොර අරින කොට ඔබට ශබ්දෙ ඇහුනාද?''

''නැහැ මට කිසිම ශබ්දයක් ඇහුනේ නැහැ.''

''ඔහු මරා දමා තිබෙන්නේ ඔය ගෙවත්ත පරීක්ෂා කර බලන්න නැගිට්ට ගමන්මයි. මේ දොර ඇරලා තියෙන්නේ ඔහුමයි. හැම තැනකම ඔහුගේ ඇඟිලි සටහන් තිබෙනවා. මේ කරලා තියෙන්නේ හොරකම කිරීමේ බලාපොරොත්තුවෙන් බව ඔබ පිලිගන්නවාද ?''

ඇ අවධරණයෙන්ම හිස වැනුවාය. ''අපොයි නැහැ. මේ පාලුගෙයි හොරුන්ට ගෙනියන්න තියෙන්නේ මොනවාද ? මේක කරන්න ඇත්තේ අපේ හතුරෙක්. වෛරක්කාරයෙක්. අනේ මගේ දුප්පත් සයිමන් වයෝවෘද්ධ කාන්තාව නැවතත් මුහුණ දෑතින්ම වසාගෙන වැලපෙන්නට වූවාය.

තම පියාගේ හදිසි මරණය ගැන සැලවූ වහාම සමරසේකර මැතිණිය හඬාගෙනම තම මැණියන්ගේ ගෙතුලට කඩා වැදුණාය. නිලධාරීන් මිනිය ඔසවා සයනයක් මත දිගා කරවා තිබුණි. සමරසේකර මැතිණිය මළමිනිය බදා ගෙන වැලපෙන්නට වූවාය. ගහෙන් ගෙඩි එන්නාක් මෙන් එක විට එක සිදුවූ මේ ශෝකජනක මරණ ඇගේ මොලොක් සිතට ඔරොත්තු නොදෙන තරමය.

ප්‍රභා ඇගෙන් ප්‍රශ්න කිරීමට අදහස් නොකලාය. එය ශෝක වූවන්ගේ හදවත් කවදුරටත් පෙලෙන්නාක් බව ඇ දන්නීය. එබැවින් මේ කාලය තුල රෙක්ස්ගේ ආධාරයෙන් යමක් සොයා ගැනීමට ඇ අපේක්ෂා කලාය.

රෙක්ස් - ඉව කෙරේ යොමු කරවනු ලැබීය. ඌ මහත් නොයිවසිලිමත් භාවයකින් මෙන් එක පිම්මෙන් ගෘහයේ කාමර පුරා දුව පැන ඇවිද්දේය. අනතුරුව ගෙට ඇතුලුවන දොර ලඟ මහපොලව කිහිපවතාවක්ම පහුරුගා නිවසින් පිටවී දුවන්නට පටන් ගත්තේය. බල්ලා සැතපුම් කාලක් පමණ දුර දවගොස් පාලු ලිදක් ඉදිරිපිට නැවතුනෙන් ඔහු පසුපසින් පැමිණි ප්‍රභාත් පොලිස් නිලධාරීන් දෙදෙනෙකුත් විශ්මයට පත්ව ලිඳ තුලට එබිකම්කර බැලූහ.

ලිඳ පාලුවට හරින ලද්දකි. එය කුණු කසල ආදියෙන් පිරී තිබිණ. ලිඳට පැන්න නොහැකිවූ බල්ලා මහ කලබලයකින් ලිඳවටා දුවන්නට පටන් ගත්තේය. ප්‍රභා යමක් තේරුම් ගත්තාක්මෙන් හිස සලා පොලිස් භටයින්ගේ මුහුණ බැලුවාය. "මිස් ලිඳට බැහැල බලන්නද ? යම් කිසිවක් නැතිනම් රෙක්ස් මේ තරම් කලබල කරන්නේ නැහැ." පී. සී. බණ්ඩා රහස් පරීක්ෂකවරියගෙන් විමැසුවේය.

"බොහොම හොඳයි පී. සී. බලාගෙන ලිඳට බහින්නෙ. අපේ මිනීමරුවා ලෙහෙසි පහසු මිනිහෙක් නොවෙයි. මේක ඇතුලේ ටයිම් බෝම්බයක්වත් හයිකරලා ඇතැයි කාට කියන්න පුලුවන්ද ?"

තිදෙනාම එකතුව ලිඳ තුලට එබිකම්කර බැලූ නමුදු අනතුරු ඇඟවීම කිසිවක් දක්නට නොවූයෙන් පී. සී. බණ්ඩා





යුනිෆෝමය පසෙකින් ගලවා තබා කඹයක ආධාරයෙන් ලිඳ තුලට බැස්සේය. පොලිස් නිලධාරියා ලිඳ තුලට බසිනවා නොයිවසිල්ලකින් බලාසිටි පොලිස් බල්ලා දෙතුන් වරක් ලිඳ වටා කැරකුනේය. ඉන්පසු හිටිහැටියේම ලිඳ තුලට පැන්නේය. ලිඳට බසිමින් සිටි පොලිස් භටයාගේද ඇගේ හැපීගෙන බල්ලා බිමට වැටෙනවා පෙනුනි.

ප්‍රභාගේ මුව ඉබේම විවර වුනි. රෙක්ස්ට අනතුරක් සිදු වුවහොත් එය තමාට වන බරපතල පාඩුවක් බව ඇ දන්නීය. ලිඳ ගැඹුර නැත එහෙත් එහි තුල තිබෙන විදුරු කැබලි බෝතල් කටු ආදියට බල්ලාගේ කකුල් කැපී ගියහොත් උගේ වටිනා කමට හානියක් වෙයි. අපරාධකාරයන් ලුහුබැඳීමට පාද ශක්තිමත්ව හොඳින් තිබිය යුතුය.

බල්ලා ලිඳ තුලට කඩා පැනීමෙන් ප්‍රභා ඇතුලු නිලධාරීන් දෙදෙනාට එක් කරුණක් විශේෂයෙන්ම පැහැදිලිවී අවසානය. මිනීමරුවාගේ ඉව ස්ථිර වශයෙන්ම නොවැටුනා නම් පොලිස් සුනඛයා මේ තරම් බිහිසුණු ක්‍රියාවක නොයෙදෙන්නේය.

නියම ඉව වැටුණු තැන පොලිස් බල්ලා හැසිරෙන්නේ පුදුමාකාර අන්දමකිනි. යකඩ දම්වැල් දමා බැඳ තැබුවද බල්ලා ඒවා කඩාගෙන හෝ මිනීමරුවාගේ ඉව පසුපස ලුහුබැඳීමට උත්සහ දරන්නේය.

පී. සී. බණ්ඩා ලිඳ පත්ලට බසින විට රෙක්ස් ඔහු පැමිණි කාර්යය නිමකර බලා සිටියේය. බල්ලාගේ මුව තුල රඳවාගෙන තිබූ දේ දකින්ම පී. සී. බණ්ඩාගේ දෙනෙත් මහත්විය.

ලේ බින්දු කීපයක් තැවරුණු ලේන්සුවක් හා අත් මේස් කුට්ටමක් බල්ලා මුවෙහි රුඳවා ගෙන තිබුණි.

විමතිය උත්සන්න වී ගියෙන් පී. සී. බණ්ඩා මහ හඬින් ගොඩ සිටිය වුනට කෑ ගසන්නට විය. ''මිස් රෙක්ස් වැදගත් සාක්ෂි කීපයක්ම සොයා ගත්තා. දැන් ඉතින් අපට බය වෙන්නට කාරණයක් නැහැ. මිනීමරුවා අල්ලගන්න එක දැන් ඉතින් අපහසුවන එකක් නැහැ.''

ප්‍රභාත් - අනෙක් පොලිස් භටයාත් ලිඳ තුලට එබී බැලුව ලිං පත්ලේ සිටිනවුන් ඔවුන්ට පැහැදිලිව නොපෙනෙන නමුදු බණ්ඩාගේ කට හඬ ලිං කණ්ඩියේ හැපී දෝංකාර නං වන්නට විය.

ප්‍රභා කල්පනා කරන්නට වූවාය පී. සී. බණ්ඩාට කෙසේ වුවද රෙක්ස්ට නම් දැන් ස්වඋත්සහයෙන් ලිඳෙන් ගොඩට පැමිණිය නොහැකිය. එබැවින් වහාම ඔහු ගොඩට ගැනීමට කටයුතු සම්පාදනය කල යුතුයි.

ඈ ලඟ සිටි අනෙක් පොලිස් භටයාට කතා කරමින් වහාම බල්ලා ගොඩට ගැනීමෙ කටයුතු සංවිධානය කරන්නැයි විධාන කලාය. පොලිස් භටයා ඇගේ අණ පිලිපැදීමට එතැනින් ඉවතට ගිය නමුදු ප්‍රභා මොහොතකට වුවද ලිඳ අසලින් ඈත් නොවූවාය.

තරමක ලොකු ලැලි පෙට්ටියක් කඹවල ආධාරයෙන් ලිඳ තුලට බැස්සවීමෙන් පසු රෙක්ස් පිටතට ගැනීමට හැකි විය. පෙට්ටිය ලිඳ තුලට බස්සනවාත් සමගම එහි අදහස තේරුම්





ගත් පොලිස් බල්ලා අණක් ලැබෙන්නත් පෙර එහි තුලට ඇතුලු වූයේය.

බල්ලාගේ මුවෙහි තිබූ දේවල් ඒ හැටියටම තිබුණි. රහස් පරීක්‍ෂකවරිය ඉතාමත් ප්‍රවේශමෙන් ඒ සියල්ල ඔහුගේ මුවින් ඉවත් කර ගනු ලැබුවේය.

ප්‍රධාන පොලිස් කායර්ාලය තුල්දී අත් මේස් යුවලත් ලේ තැවරුනු ලේන්සුවත් සියුම් පරීක්‍ෂණ වලට භාජනය කරවනු ලැබීය. එහි ප්‍රතිඵල වාර්තාව රහස් පරීක්‍ෂකවරිය වෙත ඉදිරිපත් කරන ලදි.

ලේන්සුවේ තිබූ ඇඟිලි සටහන් සමරසේකර නිවසේ තිබූ ඇඟිලි සටහන් එක හා සමාන බවත්, ඒවා එකම තැනැත්තෙකුගේ බවත්, ඇඟිලි සටහන් විශේෂඥයා තම වාර්තාවේ වැඩිදුරටත් සඳහන් කර තිබුණි. රස පරීක්‍ෂක තැනගේ වාර්තාව අනුව බලන කල ලේන්සුවේ තිබුණු ලේ පැල්ලම් - මරාදාමා තිබූ මහලු සයිමන් ගුණසේකර මහතාගේ සිරුරෙන් ගලාගිය ඒවා බව ඒකාන්ත වශයෙන්ම පලකර තිබුණි.

හුස්ම හිරකිරීමේදී මහලු මිනිසාගේ නාසයෙන් ලේ නිකුත්වී තිබේ. ඔහු බොහෝ කාලයක පටන් පීනස් රෝගයෙන් පෙලුනෙකි. නාසයෙන් ලේ ගලා ගොස් තිබෙනු දුටු මිනීමරුවා මෙය මිනීමැරුමක් නොව හදිසි හෘදයාබාධයකින් සිදුවූ මරණයක් බව ඒත්තු ගැන්වීමට ලේ පිස දැමුවා විය යුතුය.

# 08

කබුරුපිටියේ පොලිස් වැයික්කියට අයත් නාරන්දෙනිය නම් ග්‍රාමයේ වෙසෙන හරමානිස් අප්පුගේ නමැති ගැමියෙක් එක් දිනක් කබුරුපිටිය පොලිසියට පැමිණ පැමිණිල්ලක් කලේය. එය සාමාන්‍ය අන්දමේ පැමිණිල්ලකි. එවැනි පැමිණිලි නිතරම පාහේ පොලිසිවලට ලැබෙන බැවින් නිලධාරීන් ඒ ගැන වැඩි උනන්දුවක් නොදැක්වූහ.

හරමානිස් අප්පුගේ පැමිණිල්ල මෙයයි. සිරිපාල නැමති තම පුතුයා රාගම වැලිසර ලය රෝහලට ඇතුලත් කල බවත් දැනට සති දෙක තුනකට පෙර ටිකට් කපාගෙන පිටවී ඇති නමුදු ඔහු තවමත් ගෙදර නොපැමිණි බව පැමිණිලිකර සිටියේය.

පොලිස් නිලධාරීන් මේ පැමිණිල්ල ගැන වැඩි තැකීමක් නොකලාහ. එහෙත් මහලු ගැමියාගේ සිත සනසා ගෙදර යැවීම තම යුතුකම බව සලකා ඔහුගෙන් ප්‍රශ්න කරන්නට වූහ.

''තමුසෙගේ පුතාට තිබුණු රෝගය මොකක්ද ? ඔහු ක්ෂය රෝගියෙක්ද ?''

අපොයි මහත්තයා අපේ සනුහරේ කිසිම කෙනෙකුට කාශෙ හැදිලා නැහැ. අපි ගාලු ගිහින් අර ඇ-ස්-රේ කරලා





බැලුවා. ඒ දොස්තර මහත්තුරු කීවා සිරිපාලට තියෙන්නේ කාශ රෝගේ නොවේය කියලා.''

''එහෙනම් උඹෙ පුතාට තිබුණු වසංගතේ මොකක්ද බං ?''

හෘදයවස්තුවේ කලු ලපයක් තියෙනවයි කියලා දොස්තර මහත්තුරු කීවා. ඒක මුලු හෘදයවස්තුවටම බෝවෙන්න ඉස්සර වෙලා නැතිකර දමන්න ඕනෑ බවත් කීවා. ඒක සනීප කරගන්න ගාලු ඉස්පිරිතාලේ බැහැයි කියලා කොළඹ මහ ඉස්පිරිතාලෙට යන්න ලියුමක් දුන්නා. මහල්ලා විස්තර කරන්නට වූයේය.

''ඉතින් ?''

''ඉතින් බුදු මහත්තයෝ මොනවා කරන්නද. වියදම් ගියයි කියලා ඌට මැරෙන්න ඉඩ දෙන්න පුලුවනෑ. මම පසුවදාම සිරිපාලත් එක්ක කොළඹ ගියා. ගිහින් ඉස්පිරිතාලෙට බාර දුන්නා.''

පොලිස් නිලධාරියා මේ අතරවාරේදී ප්‍රශ්නයක් නැගීය.

''මහ ඉස්පිරිතාලෙට ඇතුලත් කරලා කොච්චරකල් ගත වෙනවාද?''

''හය මාසයක් පමණ කල් ගතවූනා. මහත්තයෝ මම මාස දෙකකට වතාවක් කොළඹ ගිහින් පුතාගේ දුක සැප බලාගෙන ආවා. ඒ වුනාට මේ ඉස්පිරිතාලේ බෙහෙත් වලින් ලෙඩේ වැඩි වෙනවා මිසක් සුවවෙන පාටක් පේන්න තිබුණේ නැහැ. මම සිරිපාලගෙන් ඒ ගැන ඇහුවා. එතකොට තමයි මට

දැනගන්න ලැබුනේ මේ ලෙඩේට ඕන කරන බෙහෙත් මහ ඉස්පිරිතාලේ නැති බව.''

''පුදුමයක්නේ බං ඒක. ලෙඩේට ඕනෑ බෙහෙත් මහ ඉස්පිරිතාලේ නැති නම් වෙන කොහේද තියෙන්නේ ? පොලිස් හටයා පොඩි විහිලුවක් කලේය.''

මහල්ලා කණගාටුදායක ලීලාවෙන් කතාකරන්නට විය.

''නැතුවා නොවෙයි මහත්තයෝ. ඒ බේත් ඉස්පිරිතාලෙට ලැබෙනවලු. ඒවා වටිනා කමෙන් බොහොම මිල වැඩි ඖෂධ ලැබුණු හැටියේම ඒකෙ ඉන්න ලොකු මහත්තුරු ඒවා ලොකු සාප්පු වලට විකුණ ගන්නවලු. ඒ වෙනුවට වෙනත් බාල බෙහෙත් වර්ග විදිනවලු. ඒ බෙහෙතම ඕනෑය කියලා ලෙඩ්ඩු ඉල්ලා සිටිනවා නම් දොස්තර මහත්තුරු ඒ බෙහෙතේ නම ලියලා සාප්පුවෙන් ගන්න කියලා ලියුමක් දෙනවලු. ඉතින් සල්ලියබාගෙ තියෙන ලෙඩ්ඩු ලෙඩ සනීප කරගන්න ඕනෑ නිසා කීයක් හරි වියදම් කරලා ඕනෑ කරන නියම ඖෂධය ලබාගන්නවා.''

''උඹ ඉතින් මොකද කලේ ?''

''මොනවා කරන්නද මහත්තයෝ. කුඹුරත් නියරත් ගොයම් කා නම් කාට කියන්නද ඇහුව වගේ ඒ උත්තමයන්ගේ වැඩ ගැන අහිංසක අපි මොනවා කරන්නද? සල්ලි වියදම් උනායි කියලා සිරිපාලට මැරෙන්න ඉඩ දෙන්න පුලුවනැයි. ඒ බෙහෙත් ගන්නැයි කියලා මම බොහොම අමාරුවෙන් කීයක් හරි හොයලා අරිනවා. මම තුන් වතාවක්ම රුපියල් 32/50 ගණනේ ඇරියා.





''සිරිපාලට ඒ බෙහෙත් වලින්වත් ගුණයක් නැද්ද ?''

''ලැබුණා මහත්තයො ඊට පස්සේ පුතා වැලිසර වාට්ටුව මාරු කරලා. මාරුකලා නොවෙයි. අපේ පුතා ඉල්ලුම් කරලම ගියා එතැන පපුවේ රෝග වලට දක්ෂ දොස්තර මහත්තයෙක් ඉන්නවලු. කවුද ඒ මහත්තයාගේ නම ? මගේ දිව අග තිබුණා. ආ...අර හැන්ඩි මහත්මයා ඒ උත්තමයාට බුදු බව අත්වෙන්න ඕනෑ. මගේ පුතාගේ ලෙඩේ නැතිකලේ ඒ මහත්තයා තමයි.''

''හා දැන් ඉතින් කියනවකො තමුසෙගෙ පුතා නැති වුනේ කොහොමද කියලා ?''

''මම දවස් දෙකකට උඩදී පුතා බලන්න වැලිසරට ගියා. මොනවා මට පුදුමයි. පුතා හිටපු ඇඳේ වෙනත් ලෙඩෙක් ඉන්නවා දැක්කම මගේ හිතට බයකුත් ඒ සමගම පුදුමයකුත් ඇතිවුනා. ඒ අවට ඇඳන් වල ලෙඩ්ඩුන්ගෙන් ඇහුවාම මට දැනගන්නට ලැබුණා මගේ පුතා ටිකට් කපාගෙන ගෙදර ගිය විත්තිය. ඒත් මට සැක හිතුනා පපුවෙ රෝග ගැන විශ්වාස තබන්න පුලුවන් කාටද මහත්තයො. කොයිවෙලාවේ පපුවෙ අමාරුවක් හැදිලා පණ යනවද කියන්න බැහැ. අනිත් මිනිස්සු මගේ හිත සනසන්න බොරු කියනවා ඇතැයි යන හැඟීමක් මට ඇති වුනා මම කෙලින්ම ලොකු දොස්තර මහත්තයා ලගට ගිහින් මගේ පුතාට වුනේ මොකද කියලා වැඳ වැටිලා ඇහැව්වා. ඒ මනුස්සයා හරිම කරුණාවන්තයි.

''ලොකු උන්නැහේ නුඹේ පුතාට හොඳටම සනීපයි. අපි ඔහු ඉක්මනින්ම සුවය ලබා දුන්නා. මිනිහා දැන් ටිකට් කපාගෙන ගිහින් සුමාන දෙකකුත් පසුවෙන්න ආවා'' දොස්තර මහත්මයා මට කීවා.

"මගේ හිත සැනසුනේ ඉන් පසුවයි. මන් හිතාගත්තා සිරිපාල එක පාරටම ගමේ එන්නේ නැතුව යාලුවෙකුගේ ගෙදර නවතින්න ඇතෙයි කියලා. මම එදාම ගෙදර ආවා. නමුත් අදවනතුරු සිරිපාල ගෙදර ආවේ නැහැ. මගේ හිතට බය අන්න ඒකයි"

"සිරිපාල කොහැනකවත් රස්තියාදු වෙන්න කැමති දරුවෙක් නොවෙයි."

"ඉතින් හරමානිස් උඹේ පුතා නැතිවුනාය කියලා හිතන්නේ කොහොමද? සිරිපාලට කොහේහරි රක්ෂාවක් හම්බුවෙලා ඇති. ඒ නිසා මිනිහා නිශ්ශබ්දව ඇති."

හරමානිස් දෙගිඩියාවෙන් යුතුව නිවෙස බලා පිටත්ව ගියේය. පොලිස් නිලධාරීන් කීවාක් මෙන් තම පුත්‍රයා කොළඹටවී සුලු රැකියාවක් කරනවා ඇතැයි සිතූ හරමානිස් හිත හදාගැන්මට උත්සාහ දැරීය.





# 09

අපරාධකරුවන් පසුපස ලුහුබැඳීමට ඔවුන් ගැන ක්‍රියාකල යුතු අන්දම කෙසේ දැයි සංවිධානය කිරීමට විත්ත විවේකය අත්‍යාවශ්‍යය. පසුගිය සති කිහිපය තිස්සේ කරන ලද පරීක්ෂණ වලින් විඩාවට පත් ප්‍රභා චිත්ත ආශ්වාදය ලබාගනුවස් තම මෝටර් රියට නැගී ගල්කිස්සේ මුහුදු වෙරළ බලා පිටත්වූවාය. ඇට පොලිස් සුනඛ රෙක්ස් සති කිහිපයකින් මුහුදු වතුර නැවීමට නොහැකිවූ බැවින් ඈ මේ යන ගමනේදී බල්ලාත් රිය තුලට ඇතුලුකර වූවාය.

ඉරිදාවක් බැවින් ගල්කිස්සේ මුහුදු වෙරළ ජනයාගෙන් පිරී පැවතින. වෙරළාසන්නව මෝටර් රථය නතර කළ ප්‍රභා නාන ඇඳුම් කට්ටලයකින් සැරසී බල්ලාත් කැටුව මුහුදු වතුර පැගීමට සූදානම් වූවාය.

ඈ බල්ලාගේ ඇඟට දිය ඉසිමින් ඌ සමග විනෝද වන්නට වූවාය. වරෙක බල්ලා මුහුදේ ඈතට පීනනු බලාසිටි ප්‍රභා ලොකු රළගෙඩි එන විට ඌට ප්‍රවේශම් වන ලෙසද අතින් සංඥා කරන්නට වූවාය.

ප්‍රභා අසලින්ම මුහුදු වතුරේ ක්‍රීඩා කරමින් පසුවූයේ යුරෝපීය ජාතික යුවලකි. බල්ලාගේ කඩිසර භාවය ගැන ඔවුන්

සුදුමයාට පත්වූහ. ඔවුන් බල්ලා ගැන ප්‍රභාගෙන් ප්‍රශ්න කරන්නට වූහ. සුදු යුවල කතා කලේ ඉංග්‍රීසියෙනි.

"මෙනවිය ඌ ඔබට හීලෑ වගෙයි. අපටත් ඔය වගේම තීකරු කඩිසර සුරතලෙක් සිටියා. නමුත් ඌ හිටිහැටියේම මැරුණා..."

ප්‍රභා රැලිමත පිහිනමින් සිටි බල්ලා දෙස බලා අතින් වහා සංඥාවක් කලාය. අනතුරුව යුරෝපීය යුවලගේ ප්‍රශ්ණයට පිළිතුරු සපයන්නට වූවාය.

"ඔව්.. ඌ මට හීලෑයි. විශේෂයෙන් පොලිස් සේවයට පුහුණු කරවා තිබෙන නිසා ඌ බොහොමත්ම කීකරුයි. ස්වාමියා කියන අණ ඒ හැටියටම පිලිපදිනවා. ඉටුකරනවා."

බල්ලා තරුණිය ලඟට පීනාගෙන ආවේය. ඌ තරුණියගේ ඇඟපත ලෙවකන්නට පටන් ගත් විට සුදු ජාතිකයා උගේ හිස අතගාන්නට විය.

"මූගේ නම මොකක්ද?"

"රෙක්ස්"

"රෙක්ස් - ඕ රෙක්ස්" යයි කියමින් සුදු ජාතිකයාගේ බිරිඳද එතැනට ලඟාවූවාය. ඇ අත රබර් බෝලයක් තිබුණි. රබර් බෝලය බල්ලාගේ දෙනෙත් ලඟට කිට්ටුකර පෙන්නූ ඇ එය එකවරම මුහුදේ ඈතට විසි කලාය.

ප්‍රභාද ඇ අදහස් කල දේ තේරුම් ගෙන බල්ලාට කතා කරන්නට වූවාය.





"රෙක්ස් පලයන් ඉක්මනට ගිහින් අර බෝලේ සොයා ගෙන වරෙන්"

බල්ලා රැලි තරංග වලකාලමින් බෝලය වැටුණු දිශාභිමුඛව පිහිනන්නට විය. ප්‍රභාත් - යුරෝපීය ජාතික යුවලත් මහත් ආශාවෙන් ඒ දෙසම බලාගෙන සිටියාහ.

මේ සියල්ලක්ම සිදුවුනේ ගල්කිස්සේ ග්‍රෑන්ඩ් හෝටලයට පහලිනි. හෝටලයේ ඉහලම මාලවල නැවතී සිටින්නන්ට නිතර නොටුපලේ සිදුවනදේ පැහැදිලිවම පෙනෙයි.

මෙතෙක් වේලා මෙසේ සිදුවන දේ කෙරෙහි සිය අවධානය යොමු කරගෙන සිටි තවත් පුද්ගලයෙක් විය. ඔහු තම යුරෝපීය ඇඳුම් කට්ටලයකින් සැරසී සිටි හෙතෙම හිසෙහි කලු තොප්පියක් පැලඳ සිටියේය. තොප්පියේ ඉදිරිපස මුහුණ අඩක් වැසෙනසේ ඉදිරියට නමා තිබුණි. ඔහු උඩු රැවුල් කාරයෙකි.

මේ තැනැත්තා බැලූ බැල්මට පෙනෙන්නේ විජාතිකයෙකු ලෙසිණි. අතේ තිබූ කැටයම් කළ බස්තම ඒ මේ අත වනමින් ඔහු හෝටලයේ තුන්වන මහලේ කාමරයක ජනේලයක් තුලින් නාන තොටුපලේ සිදුවන දේ කෙරෙහි නෙත් රඳවා ගෙන සිටියේය.

තරුණියකුත් - බල්ලෙකුත් එකතුවී කරන ජලක්‍රීඩා දකින මොහොතක් පාසා ඔහුට දත්මිටි කැවෙන්නේය. දැන් ඉබේම මිට මොලවෙන්නේය. වියරු හඬින් දත් කුරු කන්නටවූ හෙතෙම අව්‍යක්ත හඬින් මොනවාදෝ තමාටම කොඳුලා ගන්නවා පෙනුනි.

රේන්ස් චණ්ඩ රැලිවලට නොබියව දියබුං ගසමින් ඉදිරියට පීනයි. හෝටලයේ තුන්වැනි මහලේ ජනේලයෙන් එබිකම් කරගෙන සිටි මිනිසාගේ මුවගට සරදම් සිනා රැල්ලක් නැගුණි.

ඔහු ජනේලයේ ලඟින් ඉවත්වී කාමරයේ මැද තිබූ තම සූට්කේසය විවෘත කොට දුර බලන කණ්ණාඩියකින් එලියට ගෙන නැවතත් ජනේලය සමීපයට පැමිණියේය.

දුර දක්නය දෙනෙත් වලට තබා බලත්ම බල්ලා මුහුදු රැලි මග හරවමින් බෝලය පාවෙමින් තිබූ තැනට ලංවීමට ගන්නා උත්සහය ලංවම පෙණින. ඔහු දත්මිටි කාගෙනම කබා සාක්කුවට අත යැවිය. ඉන් රිවෝල්වරයක් අතට ගත් හෙතෙම මුදු වතුරෙහි පීනමින් ඉන්නා බල්ලාට කුරුමානම් අල්ලන්නට විය. ඉන්පසු උංට තමාගේ ඉව පාරේ එලවීමට නොහැකිය. වෙඩි වැදුන හැටියේම මූ දියේ ගිලී මිය යනු ඇත. රහස් පරීක්‍ෂක දෙපාර්තමේන්තුවට මෙවැනි දක්ෂ රහස් පරීක්‍ෂණ කටයුතුවල නිරතවීම සඳහා බල්ලෙක් පුහුණු කිරීමට අවුරුදු ගණනාවක් ගතවෙයි. ඒ වන විට තමා සම්පූර්ණයෙන්ම නිදහස් පුද්ගලයෙක් වනු ඇත. දැන් සිදුවී තිබෙන භයානක දේවල් එවිට කාලයත් සමග මිනිසුන්ගේ සිත් වලින් අමතකවී යනු නියතය.

දැන් තමාට ඕනෑ කරන්නේ පොලිස් බල්ලා විනාශ කර දැමීම පමණි.

ඔහු කිහිපවරක්ම කුරුමානම නිශ්චය වශයෙන් යොමු කල නමුදු බල්ලා වරින්වර රැල්ල හමන විට උඩ පැනීම නිසා ඒ ඉලක්කය වැරදී ගියේය.





මෙහිදී ඔහුට එකක් කල්පනා විය. බල්ලා බෝලය ගෙන නැවත ඒමට පිටත්වූ විට තමාට එල්ලය අල්ලා ගැනීම පහසුය. එතෙක් ඉවසා සිටිය යුතුය.

ඔහුගේ අදහස කෙස් ගහට හරිය. බල්ලා මහත් ආයාසයෙන් බෝලය පාවෙමින් තිබූ තැනට පීනා ගොස් එය මුවතුල රඳවාගෙන ආපසු පීනන්නට පටන් ගත්තේය.

දැන් තමාගේ වාරය එලඹී තිබෙන බව වටහාගත් මිනිසා වටපිට බැලීය. කාමරයේ දොර අගුලු දමා වසා තිබේ. පිටතින් කිසිදු හඬක් නොනැගේ. දණහිසක් ගැඹුරු මුහුදේ බැසගෙන සිටි තරුණියත් - යුරෝපීය ජාතික යුවලත් දැත් වනමින් බල්ලාට සංඥා කරනු පෙනේ. බල්ලා ඔවුන් කරා පැමිණීමට පෙර තමා ඉක්මණින් ක්‍රියාකාරී විය යුතු බව ඔහු වටහා ගත්තේය.

ඔහු කුරුමානම ඇල්ලුවේය. පිහිනීමෙන් විඩාවටපත් බල්ලා වරින් වර හතිලමින් රැල්ලත් සමග ගොඩ බිම දෙසට ගසාගෙන එන්නට විය. මෙය කදිම අවස්ථාවක් ලෙස සැලකූ මිනිසා රිවෝල්වරයේ බොත්තම කිහිප වරක්ම තද කලේය. කන් බිහිරිවන තරමේ හඬවල් කිහිපවරක් පිටපිටම ඇසිණ. මොහොතකින් බල්ලා දියයට යනු පෙනුනෙන් අමුත්තා වහාම අවුත් දුර දක්නය සූට්කේසයේ දමා වැසුවේය. මිනිත්තුවක් ගතවන්නට මත්තෙන් ඔහු කාමරයේ දොර විවෘත කර ගෙනම පහතට බැසීම සඳහා තිබෙන ''ලිෆ්ට්'' යන්ත්‍රය කරා පිය නැගීය. මිනිත්තු කිපයක් ගතවන්නට මත්තෙන් ලිෆ්ට් යන්ත්‍රයෙ ආධාරයෙන් පහලට බැසගත් හෙතෙම කඩිමුඩියේම අසල නවතා තිබූ ටැක්සි රථයකට අතවනා ඊට ඇතුලු වූයේය.

වෙඩි හඬින් අවට පරිසරයම ගිගුම් දෙන්නට විණ. ප්‍රභා භ්‍රාන්තවී වෙඩි හඬ නිකුත්වූ දෙස බලත්ම හෝටලයේ

පෙවත මහලේ සිටි තැනැත්තෙක් දුම් නගින රිවෝල්වරයක් රැගෙන කලබලයෙන් ආපසු හැරෙනවා ඇයට පෙනින.

තමා මුහුණපා සිටින අන්තරාව දැන් ඇයට මැනවින්ම පැහැදිලි විය. කවුදෝ සතුරෙක් රෙක්ස් මරා දමන්නට උත්සහ කර තිබේ. ඌ විනාශකර දැමීමට අත්‍යාවශ්‍ය වී ඇත්තේ එක් තැනැත්තෙකුට පමණි. ඒ අන් කිසිවෙකු නොව ගිල්මන් සමරසේකර ප්‍රමුඛ තවත් තිදෙනෙක් මරු මුවට කැඳවූ මිනීමරුවාය.

වෙඩි හඬ ඇසෙනවාත් සමග බල්ලා රැලත් සමග නොපෙනී යනු දකින්ම ප්‍රභාගේ හදවත වේගයෙන් ස්පන්දනය වන්නට විණ. මේ කලබලය අස්සේම සුදු යුවල මුහුදේ නෑම පසෙක තිබියදීම නාන ඇඳුම් පිටින්ම ගොස් තම මෝටර් රියට ඇතුලුවනු පෙනින. බල්ලා රැලගෙඩි මත පෙනෙන්නට නොවූයෙන් ප්‍රභා බියෙන් සැලෙන්නට වූවාය.

බල්ලා ගැන පොලිස් දෙපාර්තමේන්තුවට වගකීමට සිදුවන්නේ තමාටය. අනවසරයෙන් බල්ලා ගෙන යාම තහනම්ය. ඇ බල්ලා ගෙනාවේ රාජකාරියකට නොව හුදු විනෝදය සඳහාය.

ඇ සැලෙන ගතින් යුතුව රැල්ල දෙස බලා සිටියාය. තම සුවච කීකරු රෙක්ස්ගේ මළසිරුරවත් දකින්නට නොලැබෙනු ඇතැයි යන හැඟීම ඇතිවූයෙන් ඇගේ හදවත බලවත් ලෙස කම්පාවන්නට විය. ඇ නෙත් පිය නොහෙලා මුහුදු රැළි දෙසම නෙත් හොවාගෙන සිටියාය.

මොහොතක් ගතවිය. තමාගේ පිටුපසින් පැමිණි යමෙක් කලවා පුරමය ලෙවකන්නට වූයෙන් ප්‍රභා එක් වරම තිගැස්සී





ආපසු හැරී බැලුවාය. ඇගේ නෙත් ඇයටම ඇදහිය නොහැකි විය. රෙක්ස් බෝලයත් මුවතුල රඳවාගෙන ඇ සමීපයට ලඟාවී සිටිනු පෙනින.

වහාම නැඹුරුවූ ප්‍රභා මහත් ආදරයකින් බල්ලා තුරුලු කරගෙන වෙරළට දිව්වාය. කඩිමුඩියේම ඇඳුම් පැලඳුමින් සැරසුණ ඇ බල්ලාත් මෝටර් රිය තුලට නංවාගෙන රිය ප්‍රාණවත් කර හෝටලය ඉදිරිපිටට පදවාගෙන ගොස් ඉන් බැස ගත්තාය.

මිනීමරුවා තවමත් මේ හෝටලයේ ඇතිබව ඇගේ හැඟීමය. ඇ කෝපයෙන් සැලෙමින් හෝටලයේ මැනේජර් තැන ඉදිරියට ගොස් තමා හඳුනා ගැනීමට කාඩ්පත ඉදිරිපත් කිරීමෙන් පසු සිද්ධිය ඔහුට විස්තර කර සිටියාය.

තම හෝටලයේ නවාතැන් ගත් නේවාසිකයෙක් මෙවැනි අපරාධයක් කරන්නට සූදානම් වූවායයි ඇසීමෙන් මැනේජර් තැන කලබලයට පත්විය. එය තවමත් ඔහුට විශ්වාස කිරීමට තරම් බැරිය.

''මිස් ඔබ පැහැදිලිවම දැක්කාද ඒ වෙඩි තිබ්බ තැනැත්තා හෝටලයේ කාමරයක හිටපු කෙනෙක් බව''

''මම හොඳටම දැක්කා මිනිහා දුම් නගින පිස්තෝලයක් අතේ ඇතිව හැරිලා කාමරේ ඇතුලට යනවා දැක්කා. ඔහු තවමත් මේ හෝටලයේ සැඟවෙලා ඉන්න බව මට හොඳටම විශ්වාසයි.''

මැනේජර් තැනගේ දෙබැම ඉහලට නැගිණ. ඔහු කලබලයෙන් තරුණියගෙන් මෙසේ විමැසීය.

''ඔහු ඉන්නවා දුටුවේ කීවෙනි මාලයේද මෙනවිය?''

''තුන්වෙනි මහලේ''

''එහෙනම් ඉක්මන් කර එන්න'' කී මැනේජර් තැන එක් කාමරයකට ඇතුල්වී බිත්තියේ එල්ලා තිබූ තුවක්කුවක් අතට ගත්තේය. අනතුරුව වහාම තරප්පු පේලිය ඔස්සේ ඉහලට දුවන්නට පටන් ගත් විට ප්‍රභා ඔහු අනුගමනය කලාය.

තෙවන මහලට පිවිසුණු මැනේජර් තැන මුහුද දෙසට මුහුණලා තිබූ කාමර පේලිය ඔස්සේ ඉදිරියට දුවන්නට වූයේය. මිනිමරුවා සිටියේ කොයි කාමරේ දැයි ඔහුට තේරුමක් නැති බැවින් ඔහු ප්‍රශ්නාර්ථයෙන් තරුණිය දෙස බැලීය.

''අන්න අය කොනේම කාමරේ'' තරුණිය ඔහුගේ බැල්ම තේරුම් ගනිමින් පැවසුවාය.

තුවක්කුව එල්ල කරගත් මැනේජර් වසා තිබුණු දොර පයින් තල්ලුකරගෙනම ඊට ඇතුලුවූයේ කාමරය පුරා විමැසුම් සහගත බැල්මක් හෙලූ හෙතෙම කාමරය තුල කිසිවෙක් සිටිනු නොදැක හිස් බැල්මෙන් තරුණිය දෙස බැලීය.

''මිස් වෙඩි තැබූ තැනැත්තාට කිසිසේත් මෙහි ඇතුලුවීමට ඉඩක් ඇත්තේ නැහැ ..... මේ කාමරය ඊයේ හිටන් හිස්ව තිබුණා.....'' මැනේජර් තරුණිය දෙස බලමින් කීවාය.

ප්‍රභා කාමරය සිසාරා බැල්මක් හෙලුවාය. උකුස්සෙකුගේ මෙන් තියුණු ඇගේ නෙත් වලට යොමුවූයේ කුඩා ලේන්සුවකි.





ලේන්සුවේ එක් පසෙක රතු හා රෝස පැහැති නූලෙන් මසන ලද ඉංග්‍රීසි අකුරු දෙකකි.

ඒ අකුරු ඇන්. - ඇස්ය.

රහස් පරීක්ෂක තරුණිය දෙනෙත් විකසිත කොට ගෙන මද වේලාවක් ලේන්සුව දෙසම බලාගෙන දීර්ඝ කල්පනාවකට වැටුනාය. මේ අකුරු දෙකින් දෙදෙනෙකුගේ නම පිලිබිඹු කෙරෙන බව ඇයට රහසක් නොවේ. මේ අකුරු ඔවුන්ගේ නම් වල මුලකුරු විය යුතුයි. එහෙත් ඒ නම් අයිති පුද්ගලයන් කවුදැයි යන්න නිශ්චය කිරීම බැරෑරුම් ප්‍රශ්නයකි.

එහෙත් මද වේලාවක් ගතවන්නට මත්තෙන් ඇගේ සිතට ඇතිවූ හැඟීමක් නිසා ඇගේ ශරීරයේ මවිල් කෙලින් වී ගියේය. ඇත්තෙන්ම එය විශ්වාස කල හැකිද? වෙඩි තැබූ පුද්ගලයා කලබලයේම ලේන්සුව අතපසු වීමකින් බිම දමා ගොස් තිබේ. සමහරවිට ඔහුගේ ඇඟිලි සටහන් නොවැදීමට මේ ලේන්සුවෙන් පිස්තෝලය අල්ලා ගෙන සිටියා විය යුතුයි. වෙඩි හඬින් කලබලයට පත් වහාම ඔහු ලේන්සුව අමතක කර දමා පලා යන්නට ඇත. ප්‍රභා ප්‍රවේශමෙන් ලේන්සුව අතට ගත්තාය.

දැන් ඉතින් මිනීමරුවාගේ මිනීමැරුමට හේතුවත් පැහැදිලිය. මිනීමරුවාට සහය වීමට තවත් තැනත්තියක් සිටී. අබිරහස් මිනීමැරුම් කිහිපයක්ම කල මිනීමරුවාත් ඔහුට සහයවූ අනෙක් තැනැත්තියත් අධිකරණයට පමුණුවා නිසි දඬුවම් ලබා දීමට දැන් ඇයට ඉඩ ප්‍රස්ථා සැලසෙයි.

තරුණියගේ නලල් තලයෙන් දහඩිය බිඳු වැගිරෙන්නට විය. ඈ ලේන්සුවත් රැගෙන සෙමින් සීරුවේ පහල මාලයට බසින්නට වූවාය.

ඇස්, ඇස් ? ඇත්. යනුවෙන් හඳුන්වන්නේ නාරද විය හැකිය. එස් ඔව් දැන් ඇයට කරුණු නිකමම පැහැදිලිය. ඇස් අකුරෙන් අදහස් කරන්නේ ෂෙරින්ය.

ෂෙරින්. ෂෙරින් සමරසේකර මියගිය ගිල්මන් සමරසේකරගේ අහිංසක බිරිඳ ? ගැහැණියකට කලහැකි දේ නොපමණද ? චෞර ප්‍රේමවන්තයකු සමග එක්ව තම ආදරණීය ස්වාමිපුරුෂයා මරා දමා හොඳට සිහිනැතිවෙන තුරු ක්ලෝරෝෆෝම් නැමැති ඖෂධය ආඝ්‍රාණය කිරීමට ඇයට කොහොම ආත්ම ශක්තියක් තිබිය යුතුද? ගැහැණිය යමක් අදහස් කලවිට එහි කෙලවර දක්වාම නොනැවතී වෙහෙසෙයි. එහි කෙලවර කුමක් හෝ වේවා එය දකින තුරු ඉවසුමක් හෝ ඉවක් බවක් නැති බව දැන් ප්‍රභාට පෙනෙයි. ගිල්මන් සමරසේකර නින්දේ සිටියදීම මරා දැමීමට නාරදට තනිවම කල නොහැක. එක ඇඳේ එකට නිදාසිටි ෂෙරිනුත් ඔහුට ආධාර හා අනුබල දුන්නා විය හැකියි.

පහත මාලයට පැමිණීමෙන් පසු ප්‍රභා මැනේජර් තැන සමග ඔහුගේ කාමරය තුලට ගමන් කලාය. අසුන් ගත් ඈ ඔහුගෙන් ප්‍රශ්න රාශියක්ම අසන්නට පටන් ගත්තාය.

''මැනේජර්.... අද දවල් ඒ කියන්නේ දැනට පැය දෙකක් තුනක් ඇතුලත මේ හෝටලයට ඇතුලුවූ අමුත්තන් ගැන ඔබට විස්තරයක් කියන්න පුලුවන්ද? ඇත්තම කියන්න උත්සහ කරන්න. මේ ලොකු අභිරහසක් අනාවරණය කිරීමට දෙන වැදගත් සාක්ෂියක් බව අමතක නොකරන්න.''

මැනේජර් තැන තම තට්ට හිස අතගාමින් මදක් කල්පනා කලේය. ඒ සමගම ''ඔව් මිස් මම ඉතා කැමැත්තෙන්ම





ඒක කරන්නම් පොඩ්ඩක් ඉන්න මම අපේ ''එන්ට්‍රි'' පොත දිගහැර බලා හෝටලයට ඇතුලුවූ අයගේ නම් ගම් කියන්නම්''

ඔහු ලොකු පොතක් දිගහැර එහි සටහන් කර තිබූ ලිපිනයන් කියවා බලන්නට විය.

''දහයයි කාලට තුන්වෙනි තට්ටුවේ ... නොම්මර හතරේ කාමරය දුන්නේ ඔස්ට්‍රේලියන් ජාතික බ්‍රැඩ්ලි මහතාට. හතරවෙනි මහලේ නොම්මර දොලහේ කාමරේ එංගලන්තයෙන් පැමිණි දේශ සංචාරකයන් දෙදෙනෙකුට හා .... මේ තියෙන්නේ ඒ තැනැත්තාගේ නම .... ජෝන් ස්මිත් සහ එම මැතිණිය. හරියට එකොලහට හෝටලයට ඇතුල් වුනේ.... හා මේ තියෙන්නේ .....ඔහු ඉන්දියන් ජාතික බිස්නස් කාරයෙක් නම...... ''භගවන්දාස්වර්මා'' ඔහුට දීල තියෙන්නේ තුන්වෙනි මහලේ නො. 18 කාමරේ. එච්චරයි මිස් අද දවසටම හෝටලයට ඇතුලුවූ අමුත්තන් එච්චරයි. මේ මිනිස්සු කාටවත් වෙඩි තියන්න ඇති උවමනාව මොකක්ද?'' මැනේජර් තැන අවසානයේදී ප්‍රශ්නයක් නැගීය.

''මැනේජර්...... මට එක අවිස්වාසයක් තිබෙනවා. කරුණාකර ඔය මිනිසුන් කාමර වල ඉන්නවාදැයි සොයා බැලුවොත් නරකද?''

''බොහොම හොඳයි මිස් ... ඔබ පොලිස් නිලධාරියෙක් නිසා ඔබේ ඉල්ලීම අපිට අහක දමන්න බැහැ. අමුත්තන් කාමර කුලියට ගත්තට පස්සේ ඒවාට ඇඟිලි ගැසීම අපේ යුතු කමක් නොවෙයි. ඒක ඔවුන්ට කරන බාධාවක්....''

''නමුත් මේක මිනීමැරුම් පරීක්ෂණයක්'' ප්‍රභා තියුණු ස්වරයකින් මතක්කර දුන්නාය.

මැනේජර් බලවත් නොකැමැත්තකින්ම ඇගේ ඉල්ලීම ඉටු කරන්න සූදානම් විය. කඩිමුඩියේම ටෙලිෆෝනය කරා ගිය හෙතෙම ගෙල්මර කීපයකට කරකවා මොනවදෝ විමසීය. ඉන්පසු නැවතත් තරුණිය ලඟට පැමිණියාය.

"මිස් එන කාමරයක හැරෙන්නට අනෙක් කාමර කුලියට ගත් අමුත්තෝ හැම කෙනෙක්ම ඉන්නවා"

"එහෙම අඩුව ඇත්තේ අර ඉන්දියන්කාරයා විතරයි නේද?" ප්‍රභා දෙනෙත් පිය නොහෙලාම ප්‍රශ්න කලාය.

මැනේජර් තැන ගල් ගැසුනාක් මෙන් රහස් පරීක්ෂක වරිය දෙස බලා සිටියාය. තමා ඒ ගැන ඇයට දැන්වීමට කලින්ම ඇ ඒ ප්‍රශ්න කිරීම ඔහුට තවමත් පුදුමයකි.

ඇ තමාගෙන් පිලිතුරු අපේක්ෂාවෙන් සිටිනු දුටු ඔහු ඉතා සෙමින් හිස සෙලවිය.

"මිස් ප්‍රභා... අර ඉන්දියානු ජාතිකයා කාමරේ නැති බව මට තෙවන මහල භාරව ඉන්නා ලිපිකරුවා මේ දැන් දැනුම් දුන්නා" ඔහු කණගාටුදායක ලෙස දැන්විය.

"මම නිකමට හිතුවා ඒ ඉන්දියානු ජාතිකයා අපට උවමනා කරන පුද්ගලයා බව මට ඉබේම සැකයක් ඇති වුනා" ප්‍රභා හුනස්නෙන් නැගිටිමින් සඳහන් කලාය.

මැනේජරර් තැන කලබලයට පත්විය. තම හෝටලය තුල මෙවැනි භයානක සිද්ධියක් ඇති වීම හෝටලයේ නමට මහත් කැලලක් බව දන්නා හෙයින් ඔහු මේ සම්බන්ධව දැඩි





පරීක්ෂණයක් පැවැත්වීමට අදහස් කලේය. හෝටලයට ඇතුලුවන දොරටුව ලඟ සිටින මුරකරුවාත් ලිෆ්ට් යන්ත්‍රවල සේවය කරන්නනුත් වහාම තම කාර්යාලයට කැඳවූ හෙතෙම ඉහත සඳහන් ඉන්දියනු ජාතිකයා ගැන ප්‍රශ්න කරන්නට වූහ.

ලිෆ්ට් යන්ත්‍රය ක්‍රියා කරපු මජීඩ් නමැති තරුණයා මැනේජර් තැනගේ ප්‍රශ්නයට නියම පිලිතුරු සැපයූ තැනැත්තා විය.

"සර්.... ඒ මහත්තයා ලිෆ්ට් එක හතරවෙනි තට්ටුවේ තිබියදී තුන්වෙනි තට්ටුවේ ඉඳගෙන බෙල් එක කීපවරක්ම නාදකලා. මට මතකයි බෙල්එක හතර වතාවක්ම ශබ්ද කලා. එහෙම කරන්නේ ඉතාම හදිසිකාරයෙක් බව මට තේරුම් ගිය නිසා මම ඉක්මණින්ම ලිෆ්ට් එක තුන්වන තට්ටුවට බැස්සුවා. ලිෆ්ට් එකේ දොර ඇරියා විතරයි. අර ඉන්දියානු මහත්මයා එකපාරටම ඇතුලට කඩාගෙන වැදුනා. ඔහු අතින් සංඥාවක් කර වහාම පහතට ගෙන යන මෙන් මට දැන්වූවා. ලිෆ්ට් එක පහතට බැස්ස හැටියේම මහත්මයා විදුලියක වේගයෙන් පිටවී යන්න ගියා."

හෝටලයේ ප්‍රධාන දොරටුව මුරකරන තැනැත්තා කීවේ ඒ අමුත්තා කලබලයෙන්ම දුවගෙන ඇවිත් ටැක්සියකට අතවනනු තමා දුටු බවය.

මිනීමරුවා නැවත වරක් තමාගේ දස්කම් පෙන්වමින් පලා ගොස් තිබේ. අමෙරිකාවේ විසූ භයානක මංකොල්ල කරුවා වූ ඩිලින්ජර් මෙන් මේ පුද්ගලයාද අපරාධ කරනවාත් සමගම අතුරුදහන්වී යයි.

ප්‍රධාන පොලිස් කාර්යාලයට පැමිණි ප්‍රභාගේ ප්‍රථම කාර්ය වූයේ රෙජිස්ගේ ජීවිතය ආරක්ෂාවට කටයුතු සැලසීමය. ඔහුට දෙන ආහාර ගැන විශේෂයෙන් සැලකිලිමත් වීමටත් පිටස්තර කිසිවෙකුට ඇතුල්විය නොහැකි විශේෂ කාමරයක් ඒ සඳහා පිළියෙල කරවනු ලැබීය.

ඇ ඉතිරි කොටස සම්පූර්ණ කල යුත්තේ ක්‍රමානුකූලවය. එක්වරම කරන්නට යාමෙන් කලබලයක් ඇතිවීමට ඉඩ තිබේ. කලබලයක් ඇතිවනු ඉව වැටෙත්ම අපරාධකරුවන් නීතියෙන් විසන්වීමට උත්සහ ගන්නා බව ප්‍රභා පලපුරුද්දෙන්ම දත්තීය.

ඇ දින දෙකක්ම සිගන ගැහැණියක මෙන් වෙස්වලා ගෙන සමරසේකර බංගලාව පිහිටි රොඩ්නි මාවතේ ගැවසෙන්නට වූවාය. කිසිවෙකුටත් අවිස්වාසයක් ඇති නොවන පිදි ඇ මියගිය ගිල්මන් සමරසේකරගේ බංගලාවට නුදුරින් වූ පාර අයිනේ ගහක් යට වාඩිවී බංගලාව දෙසම යටැසින් නෙත් රඳවා ගෙන පසුවන්නට වූවාය.

කෙස් පැහුණු කිලිටිවී වැරහැලි ඇඳගත් මේ අවාසනාවන්ත පෙනුමැති ස්ත්‍රියගේ එක් අතක කඩමාලු එතු පොට්ටනියකි. මෙවැනි සිගන ස්ත්‍රීන් නගරයේ නිතර දක්නට ලැබෙන බැවින් කිසිවෙක් ඇය කෙරෙහි අවිශ්වාස ඇතිකර නොගත්හ

දින දෙකක් ගතවූ නමුදු තමා බලාපොරොත්තු වන තැනැත්තා එහි නොපැමිනෙන බව දුටු රහස් පරීක්‍ෂකවරිය බලවත් කණස්සල්ලට පත්වූවාය. මේ තරම් දැඩි මහන්සියක් ගැනීමෙන්වත් මිනීමරුවා අල්ලා ගැනීමට නොහැකිවන බව දුටු ඇ සිත් තැවුලෙන් යුතුව කල්පනා කරන්නට වූවාය. දැන්





මේ පරීක්‍ෂණය ගැන වෙහෙසීමෙන් පලක් නොලැබෙන බව ඇයටද පෙනෙයි. මේ මිනීමැරුම් කිහිපයක් නොවිසඳුන අපරාධ අඩංගු පයිල් වලට එකතු වන බව දැනුන හෙයින් ඇ වඩාත් දුක්වූනේය.

තුන්වැනි දිනයේ දහවල් දෙකට පමණ සමරසේකර බංගලාවට ඇතුලුවන මෝටර් රථයක් දුටු ප්‍රභාගේ මුහුණ එක්වරම මුකුලිත පුෂ්පයක් මෙන් ප්‍රභාමත් විය. ඇ දින කීපයක් වෙහෙස මහන්සි වූයේ මේ පුද්ගලයා බලාපොරොත්තුවෙනි.

පෝටිකෝව යට තම රථය නැවතූ නාරද වීරසිංහ කිසිදු අමුත්තක් නැති ලීලාවෙන් බංගලාවට ඇතුලුවිය. සමරසේකර මැතිණිය මද සිනාරැල්ලකින් මුව සරසා ගෙන තරුණ නාරද සාලය තුලට කැඳවා ගෙන යනු රහස් පරීක්‍ෂක වරියට පෙනින.

ප්‍රභාගේ හදවත වේගයෙන් ස්පන්දනය වන්නට විය. තම ස්වාමිපුරුෂයා මරාදමා මාසයක් ගතවන්නට පෙර මේ ස්ත්‍රිය තම අනියම් පුරුෂයාත් සමග ප්‍රීතිවෙන අන්දම දකිනවිට ප්‍රභාගේ සිතට ඇතිවෙන්නේ කෝපයකි. ඒ කෙසේ හෝ මැය නීතියේ හස්තයට හසුකර බන්ධනාගාර ගතකරවීමට ඇ තරයේම අධිෂ්ඨාන කරගත්තාය.

නාරද වීරසිංහ - තිදෙනෙකුගේ මාරයාවූ නාරද වීරසිංහ - සමරසේකර මැතිණිය සමග බර සාකච්ඡාවක යෙදෙන අන්දම ප්‍රභාට පෙනෙයි. එහෙත් ඒ කතාබහට සවන් දීමට නොහැකිවීම තම අවාසනාවක් ලෙස ඇ සැලකුවාය.

පැය භාගයක් ගතවන්නට මත්තෙන් නාරද වීරසිංහත් සමරසේකර මැතිණියත් මෝටර් රථයට නැගී බංගලාවෙන් පිටවී

යනු දුටු ප්‍රභා කලබලයෙන්ම නැගිට ඉදිරියට ගමන් කරන්නට වූවාය. ඇගේ උපදෙස් මත අසල මාවතක නවතා තිබූ මෝටර් රථයකට නැගගත් ඇ නාරදත් - සමරසේකර මැතිණියත් ගමන් කල මෝටර් රථය පසුපස ලුහුබඳින්නට වූවාය.

ඔවුන් ගමන් කල මෝටර් රථය බොරැල්ලේ මංසන්ධිය දක්වා ගමන් කොට බේස්ලයින් පාරට හරවනවා පෙනින. බේස්ලයින් පාර ඔස්සේ සැතපුම් කාලක් පමණ ඉදිරියට ගමන්කල රථය මවුන්ට් මේරියේ පිහිටි දුම්රිය බංගලාවක් ඉදිරිපිට නතර කරනු ලැබීය.

ප්‍රභා ගමන්කල රථය ඊට නුදුරින් නැවතින. ඇ රිය තුලින් එලියට නොබැස තම සැකකරුවන් දෙදෙනා ඇතුලුවූ බංගලාව දෙස නෙත් යොමා ගෙන සිටියාය.

මොවුන් මෙහි පැමිණියේ යම්කිසි පරමාර්ථයක් ඇතිවය. මොවුන් මෙහි පැමිණියේ එක්කෝ තවත් උගුලක් ඇටවීමට විය හැකිය. පොලිස් බල්ලාට එල්ලකල වෙඩි දෙකම අපතේ ගිය බව දැන් මොවුන්ට කෙසේ හෝ ආරංචිවී ඇතුවාට නිසැකය. රියදුරු විල්සනුත් තවම ජීවතුන් අතර සිටී. ඔවුන් විනාශකර දැමූ විට මොවුන් සැම දෙයින්ම නිදහස් පුද්ගලයන් බව ප්‍රභා දනියි.

ගෘහයට ඇතුලුවූ පුවල පැයක් පමණ ගත කිරීමෙන් පසු නැවතත් එලියට පැමිණ මෝටර් රථයට නැගී පිටත්ව යනු පෙනින. ප්‍රභා නැවතත් ඔවුන් පසුපස ලුහුබැන්ද නමුත් ඉන් පලක් නොවීය. රොඩ්නි මාවත ඔස්සේ රථය පදවාගෙන ගිය නාරද සමරසේකර බංගලාව තුලට ගමන් කලාය. ඉන්පසු නාරද වේගයෙන් රිය පදවාගෙන යන්නට ගියේය.



ප්‍රභා වහාම සිය නිවෙසට ගොස් සිඟන වේශය අත්හැර වෙනත් ඇඳුම් කට්ටලයකින් සැරසී මවුන්ට් මේරියේ ගෘහය බලා පිටත්වූවාය.

තමා කවරෙක්දැයි හැඳින්වීමෙන් පසු ප්‍රභා සැකකරුවන් දෙදෙනා මෙහි පැමිණියේ කුමක් සඳහා දැයි නිවසේ සිටියවුන්ගෙන් ප්‍රශ්න කරන්නට වූවාය.

''නාරද මගේ එකකුස උපන් සහෝදරයායි. මිස්ටර් ගිල්මන් සමරසේකරගේ මරණය සිදුවුන දවසේ ඉඳලා එයා ඉන්නේ බලවත්ම සිත් කණස්සල්ලකින්. මේ ලඟදී රහස් පොලීසිය තමා අල්ලාගෙන ගිහින් පැය ගණනාවක් තිස්සේ ප්‍රශ්නකල බව ඔහු මා සමග කීවා. ගිල්මන් සමරසේකර මහත්මයාගේ මරණේ ගැනත් ඊට පස්සේ සිදුවුන අබිරහස් මරණ ගැනත් රහස් පොලීසිය තමා ගැන සැක කරන බව නාරද මට දැන්නුවා. නමුත් මගේ සහෝදරයා ඔයවාගේ අපරාධවලට සම්බන්ධවන කෙනෙක් නොවන බව දිවුරා කියන්නට පුලුවන්.''

ඇ එකහෙලාම ප්‍රකාශකර සිටියාය.

''එහෙනම් ඔහු මිසිස් සමරසේකරත් එක්ක කඩිමුඩියේම මෙහාට ආවේ මොකටද?'' ප්‍රභා ප්‍රශ්න කලාය.

''ඔහු ආවේ මා ඉදිරිපිටදීම මිසිස් සමරසේකරට කරුණු පහදා දීමේ බලාපොරොත්තුවෙන් තමා මේ අපරාධ කිසිවකට සම්බන්ධ නොමැති බව ඇයට ඒත්තු ගන්වන්න ඔහුට අත්‍යාවශ්‍යව තිබුණා. ඔහු දෙවියන් ඉදිරියේ දිවුරා පොරොන්දු

වෙනින් මේ අපරාධවලට තමාගේ කිසිම සම්බන්ධයක් නැති බව කියා සිටියා."

"ඕව කොයි අපරාධකාරයාගේත් ස්වභාවය එහෙම තමා. තමාගේ අත්ලේ ලේ තැවරුනේ නැති බව කීමටයි උත්සාහ ගන්නේ."

"අපරාධකාරයෙක් ...? නාරද අපරාධකාරයෙක්.....නැහැ. ඔහු මගේ සහෝදරයා. ඔහු අපරාධකාරයෙක් නොවෙයි. ඔබට වැරදීමක් වෙලා තිබෙන හැඩයි..." මැදිවියෙහිවූ කාන්තාව කඳුළු සලමින් ප්‍රකාශ කලාය.

"හොඳයි... නීතිය ඉදිරියට පැමුණුනායින් පස්සේ තමන්ගේ නිර්දෝෂීභාවය ඔප්පු කරන්න ඔහුට හොඳටම ඉඩකඩ තියෙනවා" යි පැවසූ ප්‍රභා තම මෝටර් රථයට නැගී පවනට බඳු වේගයෙන් ප්‍රධාන පොලිස් කාර්යාලය බලා රිය පදවන්නට වූවාය.





# 10

ඈ එහි පැමිණි වහාම මිසිස් ෂෙරින් සමරසේකර අත්අඩංගුවට ගෙන තමා ඉදිරියට පමුණුවන ලෙස නිලධාරීන්ට නියම කලාය. පැය භාගයක් ගතවීමටත් මත්තෙන් සමරසේකර මැතිණිය පොලිස් රැකවල් ඇතිව ප්‍රධාන පොලිස් කාර්යාලයේ කාමරයක් තුලට ඇතුලු කරනු ලැබීය.

ප්‍රභා ෂෙරින් දෙස අප්‍රසන්න බැල්මක් හෙලා තියුණු ස්වරයකින් ප්‍රශ්න කරන්නට වූවාය.

"මිසිස් සමරසේකර . දැන් මේ නාට්‍යයේ අවසාන ජවනිකාව රඟපෑමටයි අපි සූදානම් වන්නේ. ඔබේ ස්වාමියාට ද්‍රෝහිවී අනියම් පෙම්වතාත් සමග හවුල්වී ඔබේ නීත්‍යානුකූල ස්වාමිපුරුෂයා මරා දැමීම ගැන මම ඔබට චෝදනා නගනවා."

මේ ප්‍රකාශය සවන් වැකෙත්ම සමරසේකර මැතිණිය උඩගොස් බිම වැටුනාක් මෙන් රහස් පරීක්ෂකවරිය දෙසම නෙත් රඳවාගෙන සිටියාය. ඇගේ දෙනෙත් වලින් ගැලූ කඳුළු කම්මුල් දිගේ ගලා බසින්නට විය.

"අයියෝ... ඔබ මට නිකරුනේ දොස් පවරන්නේ ඇයි මිස් ප්‍රභා ? මගේ වේදනාවෙන් පැරුණු හදවතට තවත් ගින්දර

දෙන්න ඔබට දුක නැද්ද? ගැහැණියකගේ දුක සංවේගය තවත් ගැහැණියකට තේරෙන්නේ නැද්ද? මා නිර්දෝෂයි. මම දිවි තිබෙනතුරු ප්‍රාර්ථනා කලේ එක සැමියෙකු යටතේ ජීවත් වන්න මිසක් අනියම් ප්‍රේමවන්තයෙකු සෙවීමට නොවෙයි. මා සිහිනෙකින් හෝ නොසිතූ දෙයක් ගැන ඔබ දැන් මට චෝදනා කරනවා. ඔබ ඔය සඳහන් කරන මගේ අනියම් ප්‍රේමවන්තයා කවුද?'' ඇ කඳුලු බේරෙන දෙනෙතින් යුතුව ඇසුවාය.

''ඔහු අන් කිසිවෙක් නොවේ. නාරද'' ප්‍රභා ක්ෂණයකින්ම කීවාය.

''නා-රද ?'' යි ප්‍රතිරාවය කල ෂෙරින් සමරසේකර මැතිණිය දෑතින් මුහුණ වසාගෙනම වැලපෙන්නට වූවාය.

''අනේ දෙවියනේ මේ මොන අපරාධයක්ද ? එක චෝදනාවක් සංසිඳෙන කොට තවත් දරුණු චෝදනාවල් දහයකින් මා පෙලෙන්නේ ඇයි. මෙවැනි නින්දා අපහාස විඳිමට මා කල වරද කුමක්ද ? මගේ නිර්දෝෂී භාවය දන්නේ මගේ හෘද සාක්ෂිය පමණයි. අයියෝ මේ සිදුවන්නට යන විපත මොකක්ද ? ඇ ලතැවෙන්නට වූවාය.

ප්‍රභා ලාච්චුවක් විවෘතකොට ලියුම් කවරයක බහා තිබූ ලේන්සුවක් අතට ගත්තාය. එය දිගහැරිය ඇ ෂෙරින් සමරසේකරට පෙනෙන්නට සලස්වා මෙසේ පැවසුවාය. ''මිසිස් සමරසේකර මේ ලේන්සුව අයිති....කාටදැයි කීමට පුලුවන්ද?''

කාන්තාව කඳුලු සැලීම මොහොතකට නවතා ලේන්සුව දෙස නෙත් විවර කොට බැල්මක් හෙලුවාය.



''මේ ලේන්සුව මැහැවේ මමයි. මෙක තිබුණේ මගේ අල්මාරියේ .. නමුත් පුදුමයි.. මේ ඇන්. අකුරක් මැහැවේ කවුද? මම මහලා තිබුනේ ඇස්. අකුර පමණයි. මේකට ඇන්. අකුරක් මැහැවේ කවුද? මේක තිබුනේ කොතැනද?'' ඇ සැකමුසුව විමසුවාය.

ප්‍රභා කපට සිනා රැල්ලකින් මුව සරසාගෙන පිලිතුරු දෙන්නට වූවාය.

''මිසිස් සමරසේකර තව දුරටත් බොරු කීමෙන් පලක් නැහැ. ඒ නිසා ඇත්තම ප්‍රකාශ කිරීමට උත්සහ ගන්න. ඔබ මේ ලේන්සුව නාරදට තෑගි කල එකක් නොවේද?''

''නැහැ. නැහැ. ඒක අමූලික බොරුවක්. නාරදට ලේන්සු දෙන්න තරම් මම මෝඩියෙක් නොවෙයි. මගේ ලේන්සුවක් සොරකම් කරලා ඇන්. අකුරක් මහලා තියෙනවා'' ඇ එකහෙලාම ප්‍රකාශකර සිටියාය.

''ඕ එහෙමද හොඳයි. අපි තව දුරට මේගැන පරීක්ෂාකර බලමු.''

සමරසේකර මැතිණිය රිමාන්ඩ් භාරයේ තැබූ ප්‍රභා ඊලඟට කලේ නාරද වීරසිංහ පොලිසියේ අත් අඩංගුවට ගැනීම සඳහා උපදෙස් දීමය.

අවාසනාවකට මෙන් නාරද වීරසිංහ අත් අඩංගුවට ගැනීම පහසු කාර්යක් නොවීය. සොයා ගැනීම පොලිසියට දුෂ්කර කාර්යක් විය. ඔහු අතුරුදහන්ව් සිටියේය.

නාරද වීරසිංහ නමැත්තා දූවුතැන ඇල්ලීමට වගරන්තුවත් නිකුත් කල ප්‍රභා අපරාධකාරයා බිහිසුණු මිනීමරුවා අල්ලා ගැනීමේ අනෙක් අත්‍යවශ්‍ය කටයුතුවල නිරත වන්නට වූවාය.

හෙට එලිවන්නට පෙර මිනීමරුවා අල්ලා ගැනීමට ඈ තරයේම බලාපොරොත්තු වූවාය. ඇගේ බලාපොරොත්තුව සාර්ථක වන බවට ඇයට සියයට සියයක්ම සහතිකය.

මිනීමරුවා කවුදැයි ඈ දන්නීය.



# 11

ඝනාන්ධකාරය බිහිසුණුය සමරසේකර බංගලාව තුල සොහොන් ගෙයක නැතිතරමේ නිහැඬියාවක් රජ කරන්නට විය. සමරසේකර මැතිණිය රිමාන්ඩ් භාරයට ගෙන තිබූ බැවින් නිවසේ සිටියේ මෙහෙකාරියන් දෙදෙනාත් - ජේම්ස් නමැති සේවකයාත් පමණි. ඔවුන් ගෙයි දොර ජනෙල් හොඳින් වසා දමා වේලපහින්ම නින්දට වැටුනාහ.

මධ්‍යම රාත්‍රිය පසුවී විනාඩි දොලහක් ගතවිණ. මෙරින් සමරසේකරගේ සයනාගාරය තුල වූ අල්මරියක් පිටුපස්සේ සැඟවී සිටියේ රහස් පරීක්ෂකවරියකි. ඇගේ අතේ එල්ලකරගත් රිවෝල්වරයකි.

ඇගේ සුවච කීකරු පොලිස් බල්ලා සයනය රෙක්ස් යටටවී යමක් පැමිණෙනතුරු නිසොල්මන්ව සිටිනු පෙනින. ඔහු හුස්ම ඉහලට පහලට ගත්තේද ඉතා ප්‍රවේගමෙනි.

දැන් වෙලාව ආසන්නය තමා අදහස් කල දේ සූදානම්ය. දැන් මිනීමරුවා මෙහි පැමිණිය යුතුමය. ප්‍රභා නොඉවසිලිමත් වන්නට වූයේ එබැවිනි.

බිත්තියේ සවිකර තිබූ ඔරලෝසුවේ දොලහමාර වදිනු

ඇසින ගෘහය තුල තිබූ තදබල නිහැඬියාවට ඉන් යම්තම් බාධා විණ.

දොළහමාර වැදී මිනිත්තුවක කාලය ඉකුත්වී යනවාත් සමගම තරප්පු පේලිය දිගේ යමෙකු ඉහලට නගින පාවහන් හඬ සෙමින් ඇසෙන්නට වූයෙන් ප්‍රභා වඩාත් උනන්දුවෙන් සවන් යොමුකර සිටියාය.

පාවහන් හඬ ක්‍රම ක්‍රමයෙන් ලඟ ලඟම ඇසෙන්නට විය. පොලිස් බල්ලා දිව දොට්ට දමාගෙන ගොදුරක් කරා පනින්නට මෙන් සූදානම් වී සිටිනු පෙනින.

අඩවන්කර තිබූ කාමරයේ දොර සෙමෙන් සෙමෙන් පස්සට තල්ලුවන අන්දම නොපෙනෙන නමුදු දොරේ අසව්වෙන් නැගෙන 'ක්‍රිස්' යන හඬ කවුදෝ දොර හරින්නට වෑයම් කරන බව ප්‍රභා වටහා ගත්තාය.

දොර තල්ලු කල තැනැත්තා කාමරය තුලට ඇතුලුවී අල්මාරිය දෙසට ගමන් කරනවා අඳුර විනිවිද යම්තම් පෙනින. ඔහු අල්මාරිය විවෘත කරන්නට සූදානම් වනවාත් සමගම මෙතෙක් වේලා ඇඳයට සැඟවී සිටි පොලිස් බල්ලා එක් වරම අඳුරු සේයාව වෙත කඩා පැන්නේය.

වෙඩි හඬක් නිකුත් විණ. එහෙත් මිනීමරුවාට ඉන් ඔබ්බට යමක් කිරීමට නොහැකි විණ. පොලිස් බල්ලා එල්ලය බලා පැන්නේ ඔහුගේ උගුරුදණ්ඩ කරාය.

මිනිත්තු ගණනාවක් තුල මිනිසාත් - තිරිසනාත් අතර පොරය පැවතිණ. මිනිසා දිවි ගලවා ගැනීමේ අපේක්ෂාවෙන්





මේ බිහිසුණු අපරාධකාරයා සටන් කල අතර තිරිසනා තම තියුණු දත් වලින් මෙලොවින් තුරන් කිරීමේ අපේක්ෂාවෙන් ඔහුගේ ගෙල තද කරගෙනම සිටියේය.

සැනෙකින්ම මිනිසා උගුර යටින් අමිහිරි ශබ්දයක් නිකුත් කරමින්ම නිහඬ විය. ඒ ශබ්දය පණ අදින කෙනෙකු නිකුත් කරන්නාක් වැනි අවක්‍යත - සවන් කටුක හඬකි.

කාමරය තුල නැවතත් නිහැඬියාව රජකරන්නට වූයෙන් මෙතෙක් වේලා අල්මරිය අස්සේ සැඟවී සිටි ප්‍රභා කාමරයේ විදුලි පහන දල්වා මැරී වැතිර සිටි මිනිසාගේ මුහුණ බැලුවාය.

පිහියෙන් අනිනු ලැබ මිය ගියායැයි සැලකූ ගිල්මන් සමරසේකර කාමරය මැද උඩුබැලි අතට වැතිර මැරී සිටියේය. ඔහු ලඟම කාණු හතේ රිවෝල්වරයක් බිම වැටී තිබුණි.

ගිල්මන් සමරසේකරගේ මුහුණ දැකීමෙන් ප්‍රභා තුළ අමුත්තක් ඇතිවූයේ නැත. මේ අපරාධ වලට වගකිව යුත්තා ගිල්මන්ම බව ඈ කලින්ම දැන සිටියාය.

මේ ප්‍රවෘත්තිය පසුවදා පුවත්පත්වල පලවත්ම මහජනයා පුදුමයටත් විශ්මයටත් පත්වූහ. එය විශ්වාස කල නොහැකි පුවතක් බව ඇතැමෙක් පලකලහ. එහෙත් මිනීමැරුම් හතරක් ගැන ලැබී තිබුණ පැමිණිලි වලට පිලිතුරු සැපයීමක් වශයෙන් ප්‍රභා මිනීමරුවා සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කරමින් පිටු විසි දෙකක විශේෂ වාර්තාවක් උසාවිය වෙත ඉදිරිපත් කරනු ලැබුවාය. ඇගේ වාර්තාවේ සංක්ෂිප්ත විස්තරය මෙසේය.

ගිල්මන් සමරසේකර නැමැත්තා පාසල් යන අවධියේ පටන් මානෙල් නමැති තරුණියකට ප්‍රේම කලා. ඔවුන් දෙදෙනා

අතර පැවති ප්‍රේමය දිනෙන් දිනම මෝරා වර්ධනය වී ඔවුන් එකිනෙකාගෙන් වෙන්ව විසීමට නොහැකිවන තැනටම දින්ගැස්සුනා. මේ අතර වාරයේදී ගිල්මන්ට එංගලන්තයට යාමට සිදුවුනා. පිටරටට යාමට පෙර පෙම්වතුන් යුවල ගිවිසුමක් ඇතිකර ගත්තා. කොයිතරම් කාලයක් ගියත් නැවත මුණ ගැසෙන තුරු දෙන්නාගෙන් කිසිවෙක් වෙනත් විවාහයක් කර නොගන්නා බවට ඔවුන් පොරොන්දු වුනා. නමුත් ඒ පොරොන්දුව ඉටුකිරීමට ගිල්මන් අපොහොසත් වුනා. ඔහු අවුරුදු කිහිපයකට පස්සේ එංගලන්තයෙන් ආපසු ලංකාවට ආවා. ඔහු ලංකාවට පැමිණ දින දෙකක් ගතවන්නට පෙර ඔහුගේ මාමණ්ඩිය වූ සයිමන් ගුණසේකර තම දුවනිය වූ ෂෙරීන් ඔහුට බලෙන්ම විවාහකර දුන්නා. මේ විවාහයට ගිල්මන් කිසිම කැමැත්තක් තිබුණේ නැහැ. නමුත් තම දෙමව්පියනගෙත් ඥාතීන්ගේත් හිත් රිදවීමට බැරි නිසා ඔහු නිසොල්මනේම කරබාගෙන සිටියා විවාහය සිද්ධවුනා. මේ ආරංචිය ලත් සැනෙකින්ම මානෙල්ගෙත් හිත නරක් වුනා. ඈ මේ තරම් කාලයක් බලාපොරොත්තුව සිටියේ ඔහුයි. ගිල්මන් නැති ජීවිතයෙන් කිසිදු පලක් නොවන බව ඈට හැඟුනා. මානෙල් ඒ ශෝකයෙන්ම මියගියා. මිය යන විට ඈ තම ඥාති සහෝදරයකු වූ නාරද කැඳවා ගිල්මන් ඈයට දීපු ප්‍රේම සිහිවටනය නැවත ඔහුටම දෙන ලෙස බාරකලා.

ඈ මැරිලා අවුරුද්දකටත් පස්සේ තමයි නාරදට මියගිය මානෙල්ටවූ පොරොන්දුව ඉටුකරන්නට ලැබුනේ. නාරද මානෙල් පිලිබඳ සියලුම දේ ගිල්මන්ට විස්තර කර දුන්නා. ඈ සිත් තැවුලෙන් මියගියායි දැන්නුවාම ගිල්මන්ගේ කෝපය ඉවසුම් නැතිව ගියා. සංවේගයත් - කෝපයත් මිශ්‍රවුනාම මිනිසා අවිචාරමත්ව ක්‍රියාකරන බවට ගිල්මන් හොඳ සාධකයක්. නමුත් තමාගේ චිත්ත සන්තුෂ්ටියට බාධාකල තමාගේ ප්‍රේමවන්තිය

අකාලයේ පරලොව යැවූ ඥාතීන්ගෙන් ඔහු පලිගන්නට අදහස් කලා.

ගිල්මන්ට අයිතිව තිබුණේ රසායනික ද්‍රව්‍ය විකුණන සාප්පුවක්. තමා වගේම හැඩහුරුකම් තිබෙන රෝගියෙක් සාප්පුවට එනවා ඔහු නිතර දැක පුරුද්ද තිබුනා. මේ රෝගියා සිටියේ වැලිසර. ගිල්මන්ට හොඳ කල්පනාවක් ඇතිවුනා... තමාගේ බිරිඳට ඔහුගේ ආදරයක් තිබුනේ නැහැ. නාරද මානෙල් පිලිබඳ දුක්මුසු පුවත කී හැටියේම ඔහු වැලිසරට ගිහින් තමා දන්නා හඳුනන ඒ රෝගියාගේ ටිකට් කප්පවාගෙන තම ගෙදරට එක්කරගෙන ආවා. නමුත් ඔහු තම බිරිඳට පේන්න එක්කරගෙන ආවේ නැහැ. ඇ නින්දට ගියාට පසු ෂෙරීන්ට ක්ලෝරෆෝම් අල්ලලා සිහිය නැතිකලා. ඊට පස්සේ කඩිමුඩියේම සිරිපාල නමැති රෝගියාව ඒ කාමරයට කැඳවා ගෙන අවුත් බලාපොරොත්තු නොවූ පරිදි ඔහුව මරා දැම්මා. එදා වැසි සහිත අන්ධකාර රාත්‍රියක්. නමුත් ගිල්මන් කලබලවුනේ නැහැ. තම මුහුණේ කැපුණු පැල්ලමක් වැනි කැලලක් ඇඳගෙන වැහිකබායක් පොරවා ගෙන කලු තොප්පියක් දාගෙන ඔහු එදා රෑම ගෙයින් පිටවුනා. නමුත් අවාසනාවකට මෙන් අර දුම්රිය ප්‍රවේශපත්‍ර නිකුත් කරන සදානාදන් නමැති නිලදාරියාත් - ඇසිලින් නමැති වෛශ්‍යාවත් යම්තම් ඔහුගේ මුහුණ දැක්කා ඔවුන් සාක්ෂි කියන්න ඉදිරිපත් වුනාම තමා හඳුනා ගනීවියයි ගිල්මන් හොඳට භය වුනා. ඔවුන්ගේ ප්‍රකාශ පත්‍රවල පලවූ හැටියේම ඔවුන්ගේ කටවල් සදහටම වසා දමන්නට ගිල්මන් සමත් වුනා. නමුත් ඒ මිනිසුන් මරාදැමීම මහ අපරාධයක්. මිනීමරුවා ගිල්මන් යයි හඳුනා ගැනීමට ඔවුන්ට කවදාවත්ම පුලුවන්කම තිබුනේ නැහැ. නමුත් හිතේ තිබුණු සැකයටත් - භයටත් ඔහු ඒ අසරණයන්ව මරා දැම්මා.

ඉන්පසු ඔහු විල්සන් නමැති රියදුරා මරා දමන්නට ගත් උත්සාහය ව්‍යර්ථ වුනා. ඔහු තම අවාසනාවන්ත විවාහ මඟුල සිදුකිරීමේ පුරෝගාමියා වූ සයිමන් ගුණසේකර ගෙන් පළිගැනීමට අදහස් කලා. ඒ මහලු මනුෂ්‍යයා මරා දැමීම එතරම් පහසු වුනේ නැහැ. නමුත් ගිල්මන් සමරසේකර එක මෝඩකමක් කලා. සයිමන්ගේ නාසයෙන් ගලාගිය ලේ බිඳු පිසදැමීමේ තමාගේ සාක්කුවේ තිබුණු ලේන්සුවෙන්. ඔහු ඒක පාලු ලිඳකට දැම්මා. මම ඒ ලේන්සුවේ ලොන්ඩරි සලකුණු ගැන සොයා බැලුවා. ඒ සලකුණු සමරසේකර බංගලාවේ ඇඳුම් අපුල්ලන ලොන්ඩරියේම බව මට සොයාගන්න පුලුවන් වුනා.

සමරසේකර නිවසේ තිබුණු ගිල්මන් සමරසේකරගේ ඇඟිලි සලකුණුත් සයිමන් ගුණසේකරගේ මලමිනියේ තිබුණු ඇඟිලි සලකුණුත් එක හා සමානයි. මට ලොකු පුදුමයක් ඇතිවුනේ එවිටයි. මැරිච්ච මිනිසුන්ගේ ඇඟිලි සලකුණු තිබෙන්න හේතුව මට ප්‍රහේලිකාවක් වුනා.

මම අහස පොලව ගැටලන්නට මෙන් කල්පනා සාගරයේ කිමිදුනා.

මට මේ ගැන පැහැදිලි අවබෝධයක් ඇතිවුනේ කඹුරුපිටියේ පොලිසියෙන් දුන් මැසේජ් එකක් අනුවයි. මේ හරමානිස් නමැති ගැමියා තමාගේ අතුරුදහන්වූ පුතා ගැන ශෝකයෙන් ඉන්නා අතර මහ පුදුමාකාර වැඩක් සිද්ධවුනා. මිනිහා කඩේට ගිහින් එනවිට පාන් රාත්තලක් ගෙනවිත් තිබෙනවා. මේ පාන් රාත්තල ඔතා තිබුනේ පුවත්පත් කැල්ලකිනුයි. ඒ පුවත්පතේ තම පුතාගේ ඡායාරූපය පලවී තිබෙනු ප්‍රවෘත්තිය කියවපු හැටියේම මිනිහා අන්දුන් කුන්දුන් වී ගිහින් තිබෙනවා. ඒ ඡයාරූපය තමාගේ පුත්‍රයාවන සිරිපාලගේ





වුනත් ඊට යටින් සඳහන් කර තිබුනේ ගිල්මන් සමරසේකර යනුවෙනි. ඒ නම ඇති තැනැත්තා අබිරහස් ලෙස මරාදමා ඇති බවත් ප්‍රවෘත්තියේ සඳහන්ව තිබුනා.

හරමානිස් කෙලින්ම පොලීසියට දුවගෙන ඇවිත් මේ ගැන පැමිණිලි කලා. කඹුරුපිටියේ පොලීසිය වහාම මේ සැක මුසු ආරංචිය ගැන මට දැනුම් දුන්නා. මගේ සැකය තහවුරු වුනා. ඉන්පසු ඉතින් නියම මිනීමරුවා කවුදැයි මම නියත වශයෙන්ම දැනගත්තා.

අන්තිම මොහොතේ වුවද ගිල්මන් මේ මිනීමැරුම් වලට අර අහිංසක නාරදව පටලවන්න උත්සහ ගත්තා. ඒ අපේක්ෂාවෙන් ඔහු තම බිරිඳගේ අල්මාරියෙන් සොරාගත් ලේන්සුවකට ඇත්. අකුරක් මස්සවාගෙන මට අහුවෙන්න හෝටලයේ දමා ගියා. නමුත් මම ඒ ලණුව කෑ බව අගවා ගිල්මන්ට මගේ ඇම ගිලගන්නට සැලැස්සුවා....

ගිල්මන් මගේ ඇම ගිල්ලා. ඔහු රාත්‍රියේ තම නිවසට ඇතුල්වී අල්මාරිය හරින්නට සූදානම් වූයේ තම පෙම්වතිය සිහිවීමට තිබෙන එකම සිහිවටනය - අර ලොකැට්ටුව ගැනීමටයි. නමුත් අවාසනාවකට මිනීමරුවාගේ ඉව වැටුණු පොලිස් බල්ලා ගිල්මන්ගේ බෙල්ලට පැන උගුරු දණ්ඩ කඩා මරා දැම්මා.

තීතියෙන් බේරුනත් මගේ රෙක්ස් ගෙන්නම් ගිල්මන්ට බේරෙන්න ඉඩක් ලැබුනේ නැහැ.

**- නිමි -**

# පොලිස් බල්ලා

978-955-0487-05-9

අරලිය ප්‍රකාශකයෝ
576/6, ඇරැව්වල, පන්නිපිටිය.
0113 185 554

රු.200/